# ළමයින් හා යෞවනයින් සමඟ කටයුතුකරන වෘත්තිකයන්ගේ දැනුම කුසලතා සහ භාවිතාවන් සංවර්ධනය සඳහා මගපෙන්වීම

## සුරකිමු
## දරුවන්
## ඩිජිටල් ලොව තුළ




**පහසුකරුවන්ගේ අත්පොත**


PEACE
පරිසරය සහ
සැමතැන වෙසෙන ළමුන්
සුරැකීමේ සංවිධානය
ecpat

# ළමයින් හා යෞවනයින් සමග කටයුතුකරන වෘත්තිකයන්ගේ දැනුම කුසලතා හා භාවිතාවන් සංවර්ධනය සඳහා මගපෙන්වීම

## පහසුකරුවන්ගේ අත්පොත

පරිගණක පිටු සැකසුම - සුනිල් ගමගේ

ග්‍රැෆික් නිර්මාණය - ලක්ෂ්මන් පෙරේරා

මුද්‍රණය - නියෝ ග්‍රැෆික්ස්

පීස් ප්‍රකාශනයකි
2019 නොවැම්බර්

ISBN978-955-8309-25-4

Funded by UK Government

# මග පෙන්වීම

මොහොමඩ් මහුරුෆ් - විධායක අධ්‍යක්ෂ

සම්පාදනය, සංස්කරණය හා සම්බන්ධීකරණය

සුනිල් ගමගේ - අධ්‍යක්ෂ

නිශානි සමරතුංග - ව්‍යාපෘති නිලධාරි

පංචාල් අබේසිංහ - ව්‍යාපෘති නිලධාරි

නීතීඥ චන්දීවරි මල්ලවආරච්චි - හිටපු නීති හා උපදේශන නිලධාරි

නීතිවේදී අප්සරා කස්තුරිආරච්චි - වැඩසටහන් නිලධාරි

නීතිවේදී සනුජ අමරසිරි - නීති හා උපදේශන නිලධාරි

පූර්ණිමා කුලවංශ -ව්‍යාපෘති නිලධාරි

තවීෂ බුලේගොඩ - ව්‍යාපෘති නිලධාරි

PEaCE සංවිධානය

## විධායක අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය

පරිසරය සහ සැමතැන වෙසෙන ළමුන් සුරැකීමේ සංවිධානය (PEaCE සංවිධානය) හෙවත් ECPAT ශ්‍රී ලංකා සංවිධානය ළමයින්ට එරෙහි ලිංගික අපයෝජනය හා සූරා කෑම අවම කිරීම සිය ප්‍රධාන වැඩසටහන් තේමාව ලෙස තෝරා ගෙන ඇත. අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික අපයෝජනය සහ ලිංගික සූරාකෑම යනු ගෝලීය වශයෙන් ඉතා ශීඝ්‍රයෙන් විකාශනය වන සමාජ ගැටලුවක්වන අතර එයට ඉතා පුළුල්වූත්, ශක්තිමත්වූත් ප්‍රතිචාර දැක්වීමක් අවශ්‍යකර තිබේ.

"අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික අපයෝජනය සහ ලිංගික සූරාකෑම වැළැක්වීම" End Sexual Exploitation of Children Online යනුවෙන් අප සංවිධානය විසින් විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය (Commonwealth) අරමුදලින් එක්සත් රාජධානි රජය (UK Government) හරහා ප්‍රතිපාදන ලැබෙයි.

අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික අපයෝජනය සහ ලිංගික සූරාකෑම අවම කිරීම සඳහා PEaCE සංවිධානය විසින් පුද්ගලික, සමාජීය, සේවා සපයන ආයතන හා ළමා ආරක්ෂණ යාන්ත්‍රණය යන සෑම මට්ටමක ප්‍රතිඵල හා වෙනස්කම් අපේක්ෂාවෙන් දීප ව්‍යාප්තව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.
අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික අපයෝජනය සහ ලිංගික සූරාකෑම වැළැක්වීම සඳහා වන අපගේ ව්‍යාපෘතියෙහි සමාජීය මට්ටමේ එක් ඉලක්ක කණ්ඩායමක් වශයෙන් ළමයින් හා යෞවනයින්ගේ නෛතික හා සමාජීය රැකවරණය, කුසලතා හා පෞරුෂය සංවර්ධනය හා සුභසාධනය සම්බන්ධයෙන් කටයුතු කරන වෘත්තිකයන් හා නිලධාරීන් හැඳින්විය හැකිය.

අන්තර්ජාලය, තොරතුරු තාක්ෂණය හා ඒ සම්බන්ධ මෙවලම් ඵලදායි ලෙස භාවිත කරන ආකාරය, සිදු විය හැකි හානි හා අවදානම් අවම කිරීම හා අන්තර්ජාලය ඇසුරින් සිදුවන ළමා ලිංගික අපයෝජනයන්ට හෝ සූරාකෑමට ගොදුරු වූ ළමයින්ට සේවා සැපයීමට කටයුතු කරන උක්ත සඳහන් කළ ඉලක්ක කණ්ඩායමෙහි දැනුම, කුසලතා හා භාවිතාවන් සංවර්ධනය සඳහා කටයුතු කරන පුහුණුකරුවන්ට මග පෙන්වීමක් හා මාර්ගෝපදේශකයක් ලබාදීම අරමුණු කෙටගෙන මෙම අත්පොත සකසා ඇත.

එසේම මෙම විෂය සම්බන්ධයෙන් PEaCE සංවිධානය සතුව තවත් බොහෝ සම්පත් ඇති අතර අවශ්‍ය ඕනෑම අයෙකුට ඒවා ලබා ගත හැකිය. වැඩිදුර තොරතුරු සඳහා www.ecpatsrilanka.org වෙත පිවිසෙන්න. එසේම මෙම කෘතිය සම්පාදනය කිරීමට දායක වූ සැමට මාගේ හද පිරි කෘතඥතාවය පළ කර සිටිමි.

මොහොමඩ් මහුරූෆ්
විධායක අධ්‍යක්ෂ
PEaCE /ECPAT ශ්‍රී ලංකා

## සම්පාදක මණ්ඩලයේ ස්තුතිය

"අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික සූරාකෑම වැළැක්වීම" (End Sexual Exploitation of Children Online) යනුවෙන් PEaCE සංවිධානය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිය පුද්ගලික, සමාජීය සේවා සපයන ආයතන හා ළමා ආරක්ෂණ යාන්ත්‍රණය යන සෑම මට්ටමක ප්‍රතිඵල හා වෙනස්කම් අපේක්ෂාවෙන් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලබයි.

අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික අපයෝජනය සහ ලිංගික සූරාකෑම වැළැක්වීම සඳහා වන අපගේ ව්‍යාපෘතියෙහි සමාජීය මට්ටමේ එක් ඉලක්ක කණ්ඩායමක් වශයෙන් ළමයින් හා යෞවනයින්ගේ නෛතික හා සමාජීය රැකවරණය, කුසලතා හා පෞරුෂය සංවර්ධනය හා සුභසාධනය සම්බන්ධයෙන් කටයුතු කරන වෘත්තිකයන් හා නිලධාරීන් හැඳින්විය හැකිය.

මෙම වෘත්තිකයන්ට හා නිලධාරීන්ට තම දැනුම, කුසලතා හා භාවිතාවන් සංවර්ධනය සහ යාවත්කාලීන කර ගැනීම සඳහා අත්පොතක් වශයෙන් හා එකී වෘත්තිකයන් හා නිලධාරීන් ඉලක්ක කරගෙන ධාරිතා සංවර්ධන හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන්නන්ට පුහුණු මාර්ගෝපදේශකයක් වශයෙන් එළි දැක්වෙන මෙම කෘතිය සම්පාදනය අදියරයන් කිහිපයක් යටතේ සිදු විය.

"අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික සූරාකෑම වැළැක්වීම" (End Sexual Exploitation of Children Online) යනුවෙන් අප සංවිධානය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියෙහි එක් නිමවුමක් වශයෙන් එළිදකින මෙම අත්පොත මුද්‍රණය සහ බෙදා හැරීම සහ අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය (Commonwealth) අරමුදලින් ප්‍රතිපාදන සපයන එක්සත් රාජධානි රජයටද (UK Government) අපගේ කෘතවේදීත්වය හිමි විය යුතු වෙයි.

එසේම කාලීන අවශ්‍යතාවයක් වශයෙන් සම්පාදිත මෙම පුහුණු මාර්ගෝපදේශනය වෙනුවෙන් ඇප කැප වූ සෑම දෙනාටම අපගේ ස්තුති පූර්වක ප්‍රණාමය ද පුද කර සිටිමු.

සම්පාදක මණ්ඩලය

## පටුන


| | |
|---|---|
| මග පෙන්වීම | ii |
| විධායක අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය | iii |
| සම්පාදක මණ්ඩලයේ ස්තුතිය | iv |
| **පියවර 01- පිවිසුම** | **01** |
| හැඳින්වීම | 02 - 06 |
| **පියවර 02 - පහසුකරුවන්ගේ අවධානයට** | 07 |
| 2.1 පහසුකරුවන්ගේ අවධානයට | 08 |
| 2.2 පුහුණු ක්‍රමවේදය | 09 |
| 2.3 පුහුණුවන්නන් තෝරා ගැනීම | 09 - 10 |
| 2.4 පුහුණුවන්නන් තෝරා ගැනීමේදී සලකා බැලිය හැකි ක්‍රමවේද | 11 |
| 2.5 පුහුණු ස්ථානය තෝරා ගැනීම | 12 |
| 2.6 පුහුණු කාමරය සකසා ගැනීම | 12 - 13 |
| පුහුණු ක්‍රමවේදය දෙදින පුහුණු වැඩසටහනක් සඳහා | 14 - 20 |
| පුහුණු ක්‍රමවේදය එක් දින පුහුණු වැඩසටහනක් සඳහා | 21 - 25 |
| **පියවර 03 - සයිබර් අවකාශය තුළ ශ්‍රී ලාංකික ළමයින්ගේ හැසිරීම හා භාවිතය** | **27** |
| 3.1 පසුබිම | 28 |
| 3.2 සයිබර් අවකාශය තුළ ශ්‍රී ලාංකිය ළමයින් | 29 - 30 |
| 3.3 සයිබර් අවකාශය තුළ ආරක්ෂාව | 31 |
| 3.4 සයිබර් අවකාශය තුළ ළමයින්ගේ ආරක්ෂාව | 32 - 34 |
| **පියවර 04 - අවදානය හඳුනා ගනිමු** | **35** |
| 4.1 අන්තර්ජාලය තුළ ඇති අවදානම්කාරී තත්ත්වයන් | 36 |
| 4.2 සයිබර් අවකාශය හා එහි ළමයින්ට ඇති අවදානම වඩා සංකීර්ණ වන්නේ ඇයි? | 37 - 39 |
| 4.3 අන්තර්ජාලය ආශ්‍රිතව ළමයෙකුගේ සබඳතාව, ක්‍රියාකාරීත්වය හා අවදානම | 40 - 42 |
| 4.4 අන්තර්ජාලය ඔස්සේ සිදුවන ළමා ලිංගික අපයෝජන සහ සූරාකෑමේ අවදානම හා එහි ස්වරූප | 43 |
| 4.4.1 ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම පිළිබඳ ප්‍රකාශනයන් (Child Sexual Abuse Material/CSAM) | 43-45 |
| 4.4.2 ලිංගික කටයුතු සඳහා අන්තර්ජාලය ඔස්සේ සිදුකරන පෙළඹවීම් (Online Grooming for Sexual Purposes) | 46-48 |
| 4.4.3 ලිංගිකමය කෙටි පණිවිඩ යැවීම (Sexting) | 49-51 |
| 4.4.4 ලිංගික ග්‍රහණය (Sexual Exploitation / Sextortion) | 52-53 |
| 4.4.5 සජීවීව විකාශනයවන ළමා ලිංගික අපයෝජනය (Live Streaming of Child Sexual Abuse) | 54-55 |
| 4.4.6 සයිබර් අවකාශය තුළ සිදුකරන හිංසනය (Cyber Bullying) | 56-57 |
| 4.4.7 නිරුවත් දර්ශන යැවීම හා කාන්දු කිරීම යනු කුමක්ද? | 58 |
| 4.4.8 පුද්ගලයින් නිරුවත් දර්ශන කාන්දු කරන්නේ ඇයි? | 58-59 |

4.5 අන්තර්ජාලය භාවිතය හේතුවෙන් දැකියහැකි ඇබ්බැහිවීම්වල අවදානම හා එහි ස්වරූප 59
4.5.1 තිරය මත ඇබ්බැහිවීම (Screen Addiction) 60-61
4.5.2 වීඩියෝ ක්‍රීඩාවලට ඇබ්බැහිවීම (Video Game Addiction) 61-63
4.5.3 අන්තර්ජාල ඇබ්බැහිවීමේ සහලක්ෂණ සහ ආබාධ (Internet Addiction Syndrome & Disorders) 64-67
4.6 අන්තර්ජාලය භාවිතය හේතුවෙන් සිදුවිය හැකි තාක්ෂණිකමය අවදානම හා එහි ස්වරූපය 67-68
**පියවර 5 - වැළැක්වීම හා ප්‍රතිචාර දැක්වීම 69**
5.1 අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික සූරාකෑම් වලට ගොදුරු වූ වින්දිතයින් හඳුනා ගැනීම. 70-71
5.2 ඔබ වින්දිතයෙකු පිළිබඳව දැන ගත් විට කුමක් කළ යුතුද? 72
5.3 ළමයෙකුට දෙමාපියන්/භාරකරුවන් වෙත ප්‍රවේශවීමට මඟ පෙන්වන්නේ කෙසේද? 73-74
5.4 සයිබර් වින්දිතභාවයේ බලපෑම් 74
5.5 සයිබර් අවකාශය හරහා සිදුවන අපයෝජන වැළැක්වීම 75
5.5.1 ගෞරවය යනු කුමක්ද? 75
5.5.2 ආත්ම අභිමානය සහ ආත්ම විශ්වාසය යනු කුමක්ද? 76
5.5.3 යහපත් සම්බන්ධතාවයක් යනු කුමක්ද? 76-77
**පියවර 6 - නෛතික රාමුව හා ආයතනික ව්‍යුහය 79**
6.1 හැඳින්වීම 80
6.2 ළමා අපයෝජන වින්දිතයන්ට රැකවරණය හා ප්‍රතිචාර දැක්වීම සඳහා වන දේශීය නීතිය 81-83
6.3 ළමයින් සයිබර් අවකාශය තුළ වින්දිතභාවයට පත් වීම 83-84
6.4 ළමයින් සයිබර් අවකාශය තුළ වින්දිතභාවයට පත්වීම වැළැක්වීම හා ප්‍රතිචාර දැක්වීම සඳහා පවතින දේශීය නීතිය 85-89
6.5 සයිබර් අවකාශය තුළ සිදුවන අපරාධ වැළැක්වීම හා වින්දිතභාවයට පත්වන පාර්ශවයන්ගේ ආරක්ෂාව සැලසීම සඳහා කටයුතු කරන ආයතන 90-91
**පියවර 7 - විෂය ආශ්‍රිත කියවීම් 93-110**

# පිවිසුම

## පියවර

## 1



# හැඳින්වීම



මානව ඉතිහාසයේ ප්‍රගමනයට ඉවහල් වූ ප්‍රධාන කරුණු දෙකක් වශයෙන් මිනිසා අත්පත් කර ගත් "දැනුම" හා "අත්දැකීම්" සඳහන් කළ හැකිය. මේ හා බැඳුණු තවත් වැදගත් හා රසවත් කරුණක් වූයේ ස්වකීය දැනුම හා අත්දැකීම් සෙසු අය සමග හුවමාරු කර ගැනීමට මානවයා දැක් වූ ඉමහත් අභිලාෂයයි. දැනුම හා අත්දැකීම් ගොඩනගා ගැනීමේ දී මෙන්ම හුවමාරු කර ගැනීමේදී "තොරතුරු" (Information) යන සංකල්පය නිර්මාණය විය.

ඉතිහාසය පුරාම තොරතුරු සමග ගනුදෙනු කළ මානවයා එක්තරා සංධිස්ථානයකදී "තොරතුරු" යන්න "තාක්ෂණය" (Technology) සමග මුසු කිරීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස "තොරතුරු තාක්ෂණය" (Information Technology) නම් අතිශය තීරණාත්මක සිද්ධාන්තය ලොවට බිහි විය. පරිගණක පද්ධතීන් හා ඒවා එකිනෙකට සම්බන්ධ කරන ලද ජාලයන් ඔස්සේ හා මාධ්‍යයන් ඔස්සේ තොරතුරු හුවමාරුවිය. මෙම "තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය" (Information and Communication Technology - ICT) නූතන සමාජයේ විවිධ ක්ෂේත්‍රයන් තුළ තීරණාත්මක හා අත්‍යවශ්‍ය සාධකයක් බවට පත් විය. මෙම ක්‍රියාවලියට විශාල ආලෝකයක් සපයන ලද්දේ "අන්තර්ජාලයේ" (Internet) ආගමනයයි. අන්තර්ජාලය ආශ්‍රිතව බිහිවූ සමාජ මාධ්‍යයන්හි (Social Media) ප්‍රවේශය මගින් සාම්ප්‍රදායික ජනමාධ්‍යයන් ද අද වනවිට අතික්‍රමණය කර ඇත.

මිනිස් සමාජයේ දෛනික ජීවිතය තුළ වැඩි අවකාශයක් තොරතුරු තාක්‍ෂණය අන්තර්ජාලය හා සමාජ මාධ්‍යජාලා අත්පත්කරගෙන ඇත. ජනතාවට ඒවා වෙත ළඟා විය හැකි උපාංග (Derices) පහසුවෙන් එහා මෙහා රැගෙන යාමට ඇති හැකියාව (mobile) හා සීමිත ඉඩකඩක පවා අසීමිත තොරතුරු අවකාශයක හැසිරීමට ඇති හැකියාව ඊට ප්‍රධාන හේතු සාධක වේ.


මේ ආකාරයට තොරතුරු තාක්ෂණය, අන්තර්ජාලය, සමාජ මාධ්‍ය ජාලා හා ජංගම උපාංග භාවිතය පුද්ගලයින්ට විවිධ ආකාරයේ අවස්ථාවන් ලබා දෙයි. මෙහි දැක්වෙන්නේ එවැනි උදාහරණ කිහිපයකි.
අධ්‍යයන කටයුතු සඳහා
ආදායම් ඉපයීමේ හා අලෙවිකරණ කටයුතු සඳහා
සමාජ සජීවීකරණ හා සමාජ බලගැන්වීමේ ව්‍යාපාර ගොඩ නැගීම සඳහා
නිර්මාණකරණයේ යෙදීම සඳහා විනෝදාස්වාදය ලැබෙන කටයුතුවල නිරත වීම සඳහා
විවිධ උපද්‍රව, ව්‍යසන හා වසංගත වැනි කරුණු පිළිබඳව මහජනතාව දැනුවත් හා යාවත්කාලීන කිරීම සඳහා

1.1 රූපසටහන 01



අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය ජාලා තුළ සැරිසැරීම හා ඒ සඳහා ජංගම උපාංග භාවිතය සමාජයේ සෑම තරාතිරමකම පුද්ගලයින් සිදු කරන බව ප්‍රකට කරුණකි. එසේම ඒ හා සම්බන්ධ තාක්ෂණය වැඩිදියුණු වීමද ඒවා භාවිත කරන අයගේ ප්‍රමාණය විවිධ පැතිකඩයන් ඔස්සේ ඉහළයාමද සාක්ෂි සහිතව පෙන්නුම් කළ හැකි සංසිද්ධීන්ය. එම පිරිස් අතර ළමයින් හා තරුණ ප්‍රජාව සුවිශේෂී ස්ථානයක් ගන්නා බව සංඛ්‍යා ලේඛන පරිශීලනය තුළින් පැහැදිලි වන කරුණකි. මෙම අත්පොතෙහි ඉදිරි පියවරකදී මේ පිළිබඳ සාකච්ඡා කෙරෙනු ඇත.

තාක්ෂණය උපයෝගී කරගෙන දිනෙන් දින මිනිසාගේ කටයුතු පහසු කරන, කාර්යක්ෂම හා සුබෝපභෝගී කරන මෙවලම් හා උපාංග සොයා ගැනීම, නිපදවීම හා භාවිතය ප්‍රචලිත කිරීම සිදු වෙයි. නමුත් අවාසනාවන්ත සංසිද්ධිය වන්නේ තාක්ෂණික භාවිතාවන් හා උපකරණ ඇතැම් විට පුද්ගලයින්ගේ, පුද්ගල කණ්ඩායම්වල හා ඔවුන් ජීවත්වන පරිසරයට හානිදායක වීමයි.

මේ ආකාරයට අන්තර්ජාලය, සමාජ මාධ්‍ය ජාලා හා ජංගම උපාංග භාවිතය තුළ ළමයින් හා යෞවනයින් අනතුරු අවදානම්වලට ලක්වීමේ සම්භාවිතාව සෙසු ප්‍රජා කණ්ඩායම්වලට සාපේක්ෂව ඉහළ යාමේ ප්‍රවණතාවයක් ගෙන ඇත. අසමතුලිත බල සම්බන්ධතා හා ආන්තීකරණයට ලක්වීම තුළ ළමයින් හා යෞවනයින් අපයෝජනයට, ප්‍රචණ්ඩත්වයට/හිංසනයට හා සූරාකෑමට ලක්වීමට සාපේක්ෂව ඇති වැඩි අවදානම ද මෙයට එක් යටිතල සාධකයක් වශයෙන් හඳුනාගත හැකිය.

අන්තර්ජාලය, ඒ සම්බන්ධ අවකාශය හා උපාංග භාවිතය නිසා ළමයින් හා යෞවනයින් සෑම විටම නොමග යාමක් හෝ ඇබ්බැහි වීමක් සිදු වන බවට සමාජයේ ඇතැම් පිරිස් තුළ අනියත බියක් හා සැක සංකාවන් පැවතීමට ඉඩ ඇත. මෙම ආකල්පය හා එය පෙරදැරි කර ගත් හැසිරීම තත්ත්වයන් දෙකක් කෙරෙහි බලපායි.

**පළමුවැන්න;** අන්තර්ජාලය හා බැඳුණු තාක්ෂණය හා මෙවලම් භාවිතය තුළින් ළඟා කර ගත හැකි සාධනීය ප්‍රතිඵල පිළිබඳ නිසි පණිවිඩය සමාජ ගත කිරීමට බාධා ඇති වීමයි.

**දෙවැන්න;** භාවිතය නිසා ඇති විය හැකි අනතුරු අවදානම් පිළිබඳ නිසි තක්සේරුවක් සහිත වළක්වා ගැනීමේ වැඩසටහන් පැවැත්වීමට බාධා ඇති වීමයි.

ළමයින් හා යෞවනයින් අතර යහපත් භාවිතය ප්‍රවර්ධනයට හා අනතුරු අවදානම් අවම කිරීමට හා වළක්වා ගැනීමට කටයුතු කළ හැකි වෘත්තීය කණ්ඩායම් හා ක්‍රියාධරයින් පහත අංශයන් යටතේ හඳුනාගත හැකිය.

අධ්‍යාපනය
(Education)

මහජන සෞඛ්‍යය
(Public health)

පෞරුෂත්ව හා නිපුණතා සංවර්ධනය
(Promotion of life skills and social skills)

උපදේශන හා මනෝ සමාජීය සහාය
(Counselling and psycho-social support)

ළමා ආරක්ෂණය
(Child Protection)

සමාජ සංරක්ෂණය හා සුභසාධනය
(Social security and Social Welfair )

නීතිය බලාත්මක කිරීම හා නීතිය ක්‍රියාවේ යෙදවීම
(Law enforcement and Prosecution)

තොරතුරු තාක්ෂණය, අන්තර්ජාලය, සමාජ මාධ්‍ය ජාලා හා උපාංග භාවිතය පිළිබඳ ළමයින් හා යෞවනයින් සමග කටයුතු කරන වෘත්තිකයන්ට හා ක්‍රියාකාරීන්ට ස්වකීය ක්‍රියාමාර්ගයන් සැලසුම් කර ගත හැකි හා සංවිධානය කර ගත හැකි ප්‍රවේශයන් හතරක් පිළිබඳව අදහසක් මේ අකාරයට යෝජනා කළ හැකිය.

1. ඉගෙනීමට, නිර්මාණකරණයේ නියැළීමට, තොරතුරු ලබා ගැනීමට හා තොරතුරු හුවමාරු කර ගැනීමට අවස්ථාවක් සලසන මාධ්‍යයක් ලෙස අන්තර්ජාලය හා ඒ ආශ්‍රිත අවකාශ භාවිත කිරීම පිළිබඳ මාර්ගෝපදේශයන් සැපයීම.

2. සිදු විය හැකි අවදානම්කාරී අවස්ථාවන් පිළිබඳ ළමයින් හා යෞවනයින් දැනුවත් කිරීම හා එවැනි තත්ත්වයන්ගෙන් වැළකීමට අවශ්‍ය ජීවන හා සමාජීය නිපුණතා ලබා දීම.

3. සෙසු අයගේ ගරුත්වයට, අනන්‍යතාවයට, පුද්ගලිකත්වයට හා බුද්ධිමය අයිතියකට බාධාවක් සහ හානියක් නොවන පරිදි කටයුතු කිරීම පිළිබඳ කුසලතාවයන්, ආචාර ධර්ම හා හරපද්ධතීන් පිළිබඳ මග පෙන්වීම.

4. තම ගරුත්වයට, අනන්‍යතාවයට පුද්ගලිකත්වයට හා බුද්ධිමය අයිතියට බාධාවක් වන අන්දමේ දෙයක් සිදු වුවහොත් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග, පිළිබඳ අවබෝධයක් ලබා දීම.

ළමා සංවර්ධනය, ළමා ආරක්ෂණය හා සුභසාධනය වෙනුවෙන් කටයුතු කරන වෘත්තිකයන් හා ක්‍රියාකාරීන් ඉලක්ක කර ගත් මෙම අත්පොතෙහි ප්‍රධාන පරමාර්ථය වන්නේ ඉහත කී එළඹුම් පිළිබඳ ස්වකීය වෘත්තීය දැනුම පුළුල් කර ගැනීමට හා සම වෘත්තීය කණ්ඩායම් තුළ හා ක්‍රියාධරයින්ගේ අවබෝධය, ආකල්ප හා භාවිතාවන් ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් විධිමත් හෝ අවිධිමත් ඕනෑම අවකාශයක් තුළ දියත් කිරීමට අවශ්‍ය අත්වැලක් හා මාර්ගෝපදේශයක් සැපයීමයි.

# පහසුකරුවන්ගේ අවධානයට...

## පියවර 2



## 2.1 පහසුකරුවන්ගේ අවධානයට



මෙම අත්පොත පරිච්ඡේද 7 කින් යුක්ත වෙයි. සෑම අදියරකදීම පහසුකරුවන්ට ස්වකීය දැනුම හා අත්දැකීම් යාවත්කාලීන කරගැනීමට ඉවහල් වන පසුබිම් විස්තරයක් ඇතුළත් කොට ඇත. මෙම විස්තරය සම්පාදක මණ්ඩලයේ අත්දැකීම්, මෙම විෂයට අදාළ වන පොත පත හා අන්තර්ජාලය තුළ ප්‍රකාශයට පත් කොට ඇති තොරතුරු හා විෂය පිළිබඳ ප්‍රවීණයන්ගේ අදහස් හා මති මතාන්තර පදනම් කරගෙන පෙළ ගස්වන ලද්දකි. එබැවින් කිසියම් කරුණක් සම්බන්ධව විවාදාපන්න වීමට, වඩාත් යාවත් කාලීන හා තාක්ෂණික පසුබිම් කරුණු පරිශීලනයට හා භාවිතය සඳහා පහසුකරුවන්ට සම්පූර්ණ අයිතිය ඇත.

අත්පොත සකස් කරන්නට යෙදුණු සංකල්පීය කරුණු හා පසුබිම මෙම පරිච්ඡේදයෙහිම "පිවිසුම" පරිච්ඡෙදයෙහි සඳහන් කර ඇත. පරිච්ඡේදයන් පෙළ ගැස්වීමේදී කිසියම් තාර්කික අනුපිළිවෙල අනුගමනය කිරීමට උත්සාහ දරා ඇත. එම පෙළ ගැස්ම පහත පරිදි සඳහන් කළ හැකිය.

අන්තර්ජාලය හා බැඳුණු අවකාශය තුළ මෙන්ම උපාංග පරිහරණයේදී ශ්‍රී ලාංකික ළමයින් හා යෞවනයන්ගේ හැසිරීමේ, භාවිතය හා ආරක්ෂණයේ වත්මන් ස්වරූපය හඳුනා ගැනීම හා තක්සේරුකරණය.

අන්තර්ජාලය හා බැඳුන අවකාශය තුළ මෙන්ම උපාංග පරිහරණයේ දී ළමයින් හා යෞවනයින් මුහුණ දිය හැකි අවදානම්කාරී අවස්ථාවන් හඳුනා ගැනීම, අවම කිරීම හා වළක්වා ගැනීම.

අන්තර්ජාලය හා බැඳුන අවකාශය හා උපාංග පරිහරණයේ දී හිංසනයට හා වින්දිතභාවයට පත් ළමයින් හා යෞවනයින් හඳුනා ගැනීම සහ ළමයින් හා යෞවනයින් විසින් අනුගමනය කළ හැකි හා කළ යුතු ආචාර ධර්ම, හර පද්ධතීන් හා ක්‍රියා පටිපාටීන්.

වින්දිතයන් සඳහා ප්‍රතිචාර දැක්වීම හා සහාය සේවාවන් සැපයීම සඳහා වූ සම්මුතීන්, නෛතික විධිවිධාන හා ආයතන හඳුනාගැනීම.

## 2.2 පුහුණු ක්‍රමවේදය



එක් එක් පරිච්ඡේදය තුළ අන්තර්ගත කළ යුතු කරුණු සහභාගිකයන් වෙත ලබා දීමට **යෝජිත පුහුණු ක්‍රමවේදයන් මෙම පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.** මෙහි පරමාර්ථය; අන්තර්ගතය පරිශීලනය කරන අතරම එය ලබා දෙන ආකාරය පිළිබඳවද හැඳැරීමක් කළ හැකි වීමයි. අත්පොතෙහි සඳහන් කර ඇති පියවරයන්ට අමතරව පුහුණුකරුවන් සතු අත්දැකීම් හා පළපුරුද්ද භාවිතයට ගැනීමට කිසිදු බාධාවක් නොමැත. කෙසේ වෙතත් පුහුණු ක්‍රමවේදයන් සැළසුම් කර ඇත්තේ විෂයට අදාළ විශේෂයෙන්ම ලිංගික අපයෝජන වැනි සංවේදී මාතෘකා පිළිබඳ සාකච්ඡා කිරීමේදී අවදානය යොමු කළ යුතු සිද්ධාන්තයන් පදනම් කර ගනිමිනි. එබැවින් යෝජිත ක්‍රමවේදයන්ගෙන් බැහැර නොවී, නිර්මාණශීලී හා නම්‍යශීලී රාමුවක් යටතේ පුහුණු වැඩසටහනක් පැවැත්වීමට යෝජනා කෙරේ.

## 2.3 පුහුණුවන්නන් තෝරා ගැනීම



ළමයින් හා යෞවනයින් ඉලක්ක කරගෙන අධ්‍යාපනය,පෞරුෂත්ව හා නිපුණතා සංවර්ධනය, උපදේශන හා මනෝ සමාජීය සහාය, ආරක්ෂණය, සමාජ සංරක්ෂණය හා සුභසාධනය, නීතිය බලාත්මක කිරීම හා නීතිය ක්‍රියාවේ යෙදවීම යන අංශයන්ට අදාළ වෘත්තිකයන් හා ක්‍රියාකාරීන් පුහුණුවන්නන් වශයෙන් තෝරා ගැනීම වඩාත් යෝග්‍ය වෙයි.

පුහුණුවක් සඳහා සහභාගිකයන් 20 ත් 25 ත් අතර ප්‍රමාණයක් සිටීම වඩාත් ඵලදායක වන අතර වැඩසටහනේ මුළු කාලසීමාව තිබෙන සම්පත් හා සහභාගිකයන්ට කැප කිරීමට හැකි කාලය, මත තීරණය කර ගත හැකිය. මෙම සංඛ්‍යාවට වඩා පිරිස ඉක්මවීම මෙන්ම අඩු වීම ද පුහුණුවෙහි ගුණාත්මකභාවය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගෙන යාමට බාධාවක් වනු ඇත. මෙහිදී ගැහැනු හා පිරිමි සමාන නියෝජනයක් තිබීමද වැදගත් වෙයි. එසේම විශේෂ අවශ්‍යතාවයන් සහිත වෘත්තිකයන් ද සහභාගි කරවා ගත හැකිය. මෙහිදී ඔවුන්ට සාමාන්‍ය තත්ත්වයෙන් කටයුතු කරන සහභාගිකයන් හා එක්ව කටයුතු කිරීමට හා වෙනස් කොට සැලකීමකට භාජනය වීම අවම කර ගැනීමට විශේෂ විධි විධාන සලසා ගැනීම අනිවාර්යයෙන්ම කළ යුතුය.

උදාහරණයක් වශයෙන් පෙනීම පිළිබඳ සීමාකමක් ඇති සහභාගිකයෙකුට සෙසු අය මෙන් සහභාගි වීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයිය යුතු වෙයි. කෙසේ වෙතත් සම්පූර්ණ දින දෙකක වැඩ කරන කාලය වෙන් කර ගැනීමට හැකියාව ඇතොත් සියලුම විෂය කරුණු ආවරණය වන පරිදි පුහුණු ක්‍රමවේදයන් සැලසුම් සහගත ලෙස අනුගමනය කොට, පුහුණුවන්නන්ට ඉදිරියේ දී ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරී සැලැස්මක් ද සහිතව සාර්ථක පුහුණුවක් නිම කිරීමේ හැකියාව ලැබෙනු ඇත.

පුහුණුව පැවැත්වීමට දින තුනකට පෙරවත් සහභාගිකයන් පිළිබඳ තොරතුරු ලබා ගෙන ඔවුන්ගෙන් සහභාගි වීම පිළිබඳ තහවුරු කර ගැනීම සුදුසු වෙයි. එවිට සහභාගිකයන් පිළිබඳ පෙර අදහසක් ඇති බැවින් පෙර සූදානම් කටයුතු නිසි පරිදි කළමනාකරණය හා සැලසුම් කර ගැනීමේ හැකියාව ඇත. විශේෂයෙන් දිගුකාලීනව වෛද්‍ය ප්‍රතිකාර හෝ උපදෙස් මත සිටින සහභාගිකයෙකු හෝ කිහිප දෙනෙකු ඇති නම් ඒ පිළිබඳ විශේෂ විධි විධාන සලසා ගැනීම වැදගත් වෙයි. එමෙන්ම කාන්තා සහභාගිකයන්ගේ අවශ්‍යතාවයන්, ආරක්ෂාව හා පෞද්ගලිකත්වය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීම වැදගත් වෙයි. මේ නිසා පුහුණු කණ්ඩායම තුළ පූර්ණ කාලීනව රැඳී සිටින පුහුණුකාරිනියක් හෝ පුහුණු සහායිකාවක් අත්‍යවශ්‍යයෙන්ම සිටිය යුතු වෙයි.

පුහුණුවට සහභාගි වන සෑම කෙනෙක්ම පැමිණෙන්නේ එය සංවිධානය කරන, ආරාධනා කරන හා පුහුණුව මෙහෙයවන සෑම පාර්ශවයක් කෙරෙහිම පූර්ණ විශ්වාසය තබමිනි. එම නිසා සහභාගිකයන්ගේ ගෞරවය, ආත්ම අභිමානය රැකෙන අයුරින් ඔවුන්ගේ කායික, මානසික අවශ්‍යතාවයන් හා යහපැවැත්ම තහවුරු වන සේ පුහුණුව පැවැත්වීම ඊට අදාළ වන සෑම පාර්ශවයකගේම පරම වගකීම වෙයි. එය කිසිදු අවස්ථාවක පැහැර හැරිය නොහැකි අතර කිසියම් අඩු ලුහුඬුවක් නිසා සහභාගියෙකු අපහසුතාවයකට ලක් වුවහොත් ඉන් පසු නිදහසට හේතු දැක්වීම වෘත්තීය පුහුණු කණ්ඩායමකගේ හෝ පාර්ශවයකගේ ලක්ෂණයක් නොවේ.



## 2.4 පුහුණුවන්නන් තෝරා ගැනීමේ දී සලකා බැලිය හැකි ක්‍රමවේද

ළමයින් හා යෞවනයින් ඉලක්ක කරගෙන අධ්‍යාපනය, පෞරුෂත්ව හා නිපුණතා සංවර්ධනය, උපදේශන හා මනෝ සමාජීය සහාය, ආරක්ෂණය, සමාජ සංරක්ෂණය හා සුභසාධනය, නීතිය බලාත්මක කිරීම හා නීතිය ක්‍රියාවේ යෙදවීම වැනි සෑම වෘත්තීය ක්ෂේත්‍රයක්ම හෝ කිහිපයක සම්මිශ්‍රණයෙන් ඉලක්ක කණ්ඩායම තෝරා ගැනීම.

උක්ත වෘත්තීය ක්ෂේත්‍ර ඇසුරින් එකක් යටතේ සමජාතීය ඉලක්ක කණ්ඩායමක් තෝරා ගැනීම.

මීට පරිබාහිරව වෙනත් ක්‍රමවේද යටතේ ද සහභාගිකයන් තෝරා ගත හැකි වන අතර මෙහි සඳහන් කළ ක්‍රම දෙක තුළ ද එකිනෙකට සුවිශේෂී වාසි මෙන්ම අවාසි ද තිබිය හැකිය. උදාහරණයක් වශයෙන් පළමු ක්‍රමය යටතේ සහභාගිකයන් තෝරා ගතහොත් විවිධ වෘත්තීය විෂය පථයන්, අත්දැකීම් හා පළපුරුදු මත ළමයින් හා යෞවනයින් තොරතුරු තාක්ෂණය, අන්තර්ජාලය, සමාජ මාධ්‍ය ජාලා හා උපාංග භාවිතය පිළිබඳ විවිධ



මති මතාන්තර හා සංකල්ප විවිධ දිශානතීන් හා මානයන් ඔස්සේ ඉදිරිපත් කිරීමට ඇති ඉඩ කඩ මත සහභාගිකයන්ට නව ඉගෙනුම් අවස්ථාවක් නිර්මාණය වනු ඇත.

දෙවන ක්‍රමය යටතේ සහභාගිකයන් තෝරා ගතහොත් ඔවුන්ගේ විෂය පථයට අදාළ කර ගනිමින් අන්තර්ගතය හා ක්‍රමවේදය සැලසුම් කර පුහුණුව පැවැත්වීම ට අවස්ථාවක් නිර්මාණය වනු ඇත. අත්පොතෙහි අන්තර්ගතයෙන් යම් යම් කොටස් ඉවත් කිරීමක් මෙයින් අදහස් නොකෙරේ. සහභාගීවන පුහුණු කණ්ඩායමේ ප්‍රමුඛතාවයන්, අභිලාසයන් හා ක්‍රියාත්මක කළ හැකි ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ අවධානය යොමු කිරීමෙහි ඇති වැදගත්කම මෙයින් අවධාරණය කෙරේ. මෙවැනි සමජාතීය පුහුණු කණ්ඩායමක් සමග කටයුතු කිරීමේ වැදගත්කමක් වන්නේ පුහුණුවෙන් පසු ක්‍රියාවට නැංවීම සඳහා සුවිශේෂී ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ගැනීමට හා අදාළ ආයතනයේ වගකිව යුතු නිලධාරියෙකු සමග අඛණ්ඩව එම සැලැස්ම පසු විපරම් කිරීමට අවස්ථාව සැලසීමයි.

## 2.5 පුහුණු ස්ථානය තෝරා ගැනීම

පුහුණු ස්ථානය පොදු ප්‍රවාහන මාධ්‍යයකින් පැමිණ පහසුවෙන් මග සොයා ගත හැකි හා ළඟා විය හැකි තැනක් විය යුතුය. හදිසි අවස්ථාවකදී සේවාවන් වෙත කෙතරම් කෙටි කාලයක් තුළ ළඟා විය හැකි ද යන්න ද විමසා බැලිය යුතු කරුණකි. (උදාහරණයක් වශයෙන් රෝහලකට හෝ වෙනත් විශ්වාසදායී හා පහසුකම් සහිත වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම වැනි) එසේම පුහුණුව පැවැත්වෙන දිනයේ එම ස්ථානයේ හෝ අවට වෙනත් ක්‍රියාකාරකම් සිදු වන්නේ ද යන්න විමසා බැලීම වැදගත් වෙයි. (උදාහරණයක් වශයෙන් පුහුණු ස්ථානයේ හෝ ඒ අවට මංගල උත්සවයක්, සංගීත ප්‍රසංගයක් වැනි ක්‍රියාකාරකමක් තිබීම පුහුණුවට බාධාවක් විය හැකිය) එමෙන්ම පුහුණු ස්ථානයේ සනීපාරක්ෂාව සහිත වැසිකිළි පහසුකම්, පානීය ජලය ලබා ගැනීමට ඇති හැකියාව, පුහුණු කාමරය පිරිසිදු වාතාශ්‍රය ලැබෙන හා මනා ආලෝක තත්ත්වයක් තිබේද යන්න තහවුරු කර ගැනීම අතිශයින්ම වැදගත් කරුණක් වෙයි. පුහුණුව පැවැත්වෙන භූමිය තුළ විවෘත ළිං සහ ආසන්නයේ ඉදිකිරීම් කටයුතු කරන වැඩබිම් ආදිය ඇතිනම් සහභාගිකයන්ගේ ආරක්ෂාවට ඇති අවදානම පිළිබඳ නිසි තක්සේරුවක් තිබීම හා ඒවා අවම කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග හඳුනාගෙන තිබීමත් ඊට අදාළව සහභාගිකයන් දැනුවත් කර තිබීමත් අත්‍යවශ්‍ය කරුණකි.



## 2.6 පුහුණු කාමරය සකසා ගැනීම

පුහුණු කාමරය තුළ තිබිය යුතු වැදගත්ම කරුණු වන්නේ ඉඩකඩ සහිත වීම, නිසි වාතාශ්‍රය ලැබීම, ප්‍රමාණවත් ආලෝකයක් ලැබීම හා පොළොව දූවිලිවලින් තොර වීමයි. පුහුණු කාමරය තුළ තිබිය යුත්තේ පහත උපකරණ හා ද්‍රව්‍ය පමණක් වන අතර හැකිතාක් නිදහස් අවකාශයකින් යුක්ත විය යුතුය.

- සහභාගිකයන් සඳහා අසුන් ගැනීමට පුටු 25 ක්
- කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා මේස 4-5 ක්
- පුහුණු කරුවන්ගේ ලිපිද්‍රව්‍ය හා මෙවලම් තබා ගැනීමට මේසයක්
- මල්ටි මීඩියා ප්‍රොජෙක්ටරය තබා ගැනීමට ප්‍රමාණවත් වන කුඩා මේසයක්
- පුහුණුකරුවන්ට අවශ්‍ය වූ විට වාඩි වීමට පුටු 2-3 ක්
- කසල බඳුනක්
- ජලය තබා ගැනීමට මේසයක් හෝ වෙනත් ගැලපෙන දෙයක්
- වයිට් බෝඩ් එකක්
- ප්‍රොජෙක්ටරය
- ශබ්ද විකාශන මෙවලම් (Speakers)
- පෑන්, කඩදාසි, අත්පත්‍රිකා වැනි අනෙකුත් ලිපි ද්‍රව්‍යය
- ෆ්ලිප් චාර්ට් බෝඩ් එකක්

සහභාගිකයන්ගේ පුටු 25 අඩකවයක ආකාරයෙන් සකස්කර ගනී. එවිට සහභාගිකයන්ට එකිනෙකා පෙනෙන අතර පුහුණුකරුවන්ට විවෘත අවකාශය භාවිත කරමින් සහභාගිකයන් අතරට ගොස් ඔවුන් සමග වඩාත් සමීප වෙමින්, අන්තර් සම්බන්ධතා පවත්වා ගනිමින් පුහුණුව මෙහෙයවීම කළ හැකි වෙයි. එසේම කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා වන මේස 4-5 කාමරයේ විවෘත අවකාශය තුළ කිසියම් විධිමත් රටාවක් ඔස්සේ ස්ථාන ගත කළ හැකිය. පුහුණුකරුවන්ගේ උපකරණ ද අදාළ මේසය මත පිළිවෙලකට තබා ගැනීම අත්‍යවශ්‍ය වෙයි. ලිපි ද්‍රව්‍ය යනාදිය අදාළ ප්‍රමාණය පමණක් මේසය මත තබා සෙසු දෑ අසුරා තැබීමෙන් ද්‍රව්‍ය නිසි පරිදි කළමනාකරණය කර ගත හැකි වෙයි.

පුහුණු කාමරය හැකි නම් පුහුණුව පැවැත්වීමට පෙර දිනයේ සකසා තබා ගැනීම සුදුසු වන අතර එසේ නොහැකි අවස්ථාවක අවම වශයෙන් පුහුණුව ආරම්භ කිරීමට පැයකට කලින්වත් සියල්ල සූදානම් කරගත යුතුය. එවිට සහභාගිකයන් පැමිණෙන විට පුහුණු කරුවන්ට මනා සූදානමකින් හා විශ්වාසයකින් කණ්ඩායම පිළිගෙන වැඩසටහන ආරම්භ කළ හැකිය.

පුහුණුකරුවන්ගේ සූදානම පුහුණුව අපේක්ෂිත මට්ටමෙන් පවත්වාගෙන යාම සඳහා වැදගත් වෙයි. එමෙන්ම සැසි මෙහෙයවීමට පුහුණුවේ අන්තර්ගතය හා පුහුණු ක්‍රමවේදය පිළිබඳ මනා පරිචයක් ඇති පහසුකරුවන් දෙදෙනෙකු හා සහායකයෙකු සිටීම වැදගත් වෙයි. සහාය දක්වන්නාද පුහුණු පැවැත්වීම පිළිබඳ උනන්දුවක් දක්වන එවැනි කටයුත්තක් සඳහා පුරුදු පුහුණුවන්නෙකු නම් වඩාත් උචිත වෙයි. ප්‍රධාන පහසුකරුවන් දෙදෙනා සැසි මෙහෙයවන අතර සහායකයාගේ කාර්යය වන්නේ පුහුණු කාමරයේ අවශ්‍යතා සොයා බැලීම, කෑම බීම, පුහුණුව නේවාසික වැඩසටහනක් නම් ඒ පිළිබඳ අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය, සහභාගිකයන්ගේ අවශ්‍යතා පිළිබඳ සොයා බැලීම යනාදියයි. එසේම සහභාගිකයෙකු සම්බන්ධයෙන් සෞඛ්‍යමය ගැටලුවක් ඇති වුවහොත් ඒ පිළිබඳ මූලිකත්වය ගැනීමද කළ යුතු වෙයි. එසේම දිනයට අදාළ සැසි පැවැත්වීමෙන් පසු පුහුණු කණ්ඩායමේ සියලු දෙනා එක් රැස් වී දිනය පිළිබඳ එකිනෙකාගේ අත්දැකීම්, වඩාත් හොඳින් සිදු කළ කාර්යයන් අගයමින් තව දුරටත් සංවර්ධනය විය යුතු දේවල් පිළිබඳ සාධනීය සාකච්ඡාවක් කණ්ඩායමේ එකිනෙකා දිරිමත් වන අන්දමින් පැවැත්වීම අත්‍යවශ්‍යයෙන්ම කළ යුතු වෙයි.



## පුහුණු ක්‍රමවේදය - දෙදිනක පුහුණු වැඩසටහනක් සඳහා
## පළමු දිනයේ වැඩසටහන

| අන්තර්ගතය/ මාතෘකාව | වේලාව /කාලය | අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය | ක්‍රමවේදය |
|---|---|---|---|
| පිළිගැනීම සහ වැඩසටහන් ආරම්භය | පෙ.ව. 08.30 -08.50 විනාඩි 20 | PPT ඉදිරිපත් කිරීම | සහභාගී වී සිටින වෘත්තිකයන් පිරිස ඉතාමත් ගෞරවනීය ලෙස පිළිගෙන ඔවුන්ගේ සහභාගීත්වය ඇගයීමට ලක් කිරීම. වැඩසටහන පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් සිදුකර PEaCE ආයතනය සහ එහි වැඩසටහන් පිළිබඳවද හඳුන්වා දීම. |
| හඳුනා ගැනීම | පෙ.ව. 08.50- 09.15 විනාඩි 25 | Name Tag ප්ලැටිග්නම් පෑන් හැට්ට කටු | සෑම සහභාගීවන්නෙකුටම Name Tag එකක් ලබා දී තම නම ප්ලැටිග්නම් පෑනකින් ලියා පැළඳගන්නා ලෙස පවසන්න. ඉන්පසු සහභාගීවන්නන් එකිනෙකාට තමාව හඳුන්වා දෙන ලෙස පවසන්න.එලෙස හඳුන්වා දෙන අතර මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට තමාගෙන් දියහැකි දායකත්වයක් ලෙස තමාගේ එක් හොඳ ගතිගුණයක් / වටිනාකමක් ද සඳහන් කරන ලෙස ද පවසන්න. |
| අරමුණු සහ /හෝ අපේක්ෂාවන් සඳහන් කිරීම | පෙ.ව. 09.15- 09.45 විනාඩි 30 | වර්ණවත් A4 කඩදාසි ප්ලැටිග්නම් පෑන් මාස්කින් ටේප් PPT ඉදිරිපත් කිරීම | සහභාගීවන්නන් කණ්ඩායම් 4කට බෙදා කණ්ඩායම් ක්‍රියාකාරකමක් ආශ්‍රයෙන් තමන් මෙම වැඩමුළුවට සහභාගී වූ අරමුණු 3ක් පාට කඩදාසිවල සඳහන් කරන ලෙස පවසන්න.<br><br>එක් එක් කණ්ඩායම ලියා ඇති කරුණු සෙසු අයට ද ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී එම කඩදාසි පත් සියලු දෙනාගේ ම ඇස ගැටෙන පරිදි ප්‍රදර්ශනය වීමට සලස්වන්න.<br><br>ඉන් අනතුරුව පුහුණුකරුවන්ගේ අරමුණු ද PPT ඉදිරිපත් කිරීම් මගින් දක්වා ඒවා ද සහභාගිකයන් ගේ අරමුණු හා සමපාත වන බව තහවුරු කරන්න. |
| ඉගෙනුම් එකඟතා සහ ප්‍රායෝගික අවශ්‍යතා පිළිබඳව දැනුවත් වීම | පෙ.ව. 09.45- 10.00 විනාඩි 15 | පිළිප් චාට් මාකර් පෑන් | සහභාගීවන්නන් සමඟ විවෘත සාකච්ඡාවක් සිදු කරමින් ඉගෙනුම් එකඟතාවයන් ඇතිකර ගැනීම.<br><br>වැඩසටහන පැවැත්වෙන ස්ථානයේ ඇති ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ඇති පහසුකම් පිළිබඳව දැනුවත් කිරීම. |
| තේ විවේකය | පෙ.ව. 10.00- 10.30 විනාඩි 30 | | |

## පළමු සැසියේ ආරම්භය

| අන්තර්ගතය/ මාතෘකාව | වේලාව /කාලය | අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය | ක්‍රමවේදය |
|---|---|---|---|
| ළමයා යනු කවුද ? ළමා විය සහ ළමා අයිතිවාසිකම් හඳුනා ගැනීම. | පෙ.ව. 10.30-12.15<br>පැය 01<br>විනාඩි 45 | වර්ණ 5ක බැලුන්<br>ඇල්පෙනෙති<br>වර්ණ 5ක A4 කඩදාසි<br><br>පිලිප් චාට්<br>මාකර් පෑන්<br>PPT ඉදිරිපත් කිරීම | සහභාගී වී සිටින වෘත්තිකයන් කණ්ඩායම් 5කට බෙදන්න.<br>Energizer ක්‍රියාකාරකමක් හරහා කණ්ඩායම්වලට අදාළ මාතෘකා සොයා ගැනීම. (Balloon Game)<br>කලින් සකස්කර ගන්නා ලද වර්ණ 5ක බැලුන් එක් කණ්ඩායමකට සිටිය හැකි සාමාජිකයන් ගණනට අනුව සකස්කර ගත යුතුවේ. එක් කණ්ඩායමකට අදාළ බැලුන් තුළට අනෙක් කණ්ඩායම්වලට අදාළ මාතෘකාවල වෙන් කරන ලද මාතෘකා කොටස් අදාළ කණ්ඩායම්වල වර්ණවත් කඩදාසිවල මුද්‍රණය කර කුඩාවට නමා බැලුනය තුළට ඇතුලුකර තිබිය යුතුය.<br>උදා :1වන කණ්ඩායමේ මාතෘකාව පහත පරිදි කොටස් 8කට බෙදා එම තුණ්ඩු විවිධ වර්ණයෙන් යුතු බැලුන තුළට බහාලන්න.<br>1 ශ්‍රී ලංකාවේ · 2 නෛතික · 3 රාමුව · 4 තුළ · 5 ළමයා · 6 යන්න · 7 හඳුනා · 8 ගන්න<br>සැළකිය යුතුය : කණ්ඩායමක සාමාජිකයන් 8කට වඩා අඩුනම්, මෙම වචන 2ක බැගින් සම්බන්ධකර ගන්න. සාමාජිකයන් 8කට වඩා වැඩිනම්, මදි ප්‍රමාණයට එම වර්ණයෙන්ම හිස් කඩදාසි අවශ්‍ය ප්‍රමාණට බැලුන තුළට බහාලන්න.<br>කණ්ඩායම් 5ට අදාළ වර්ණයෙන් යුතු බැලුන සහ ඇල්පෙනෙති ලබා දෙන්න.<br>පහසුකරුවන් ලබාදෙන සංඥාවකට අනුව කණ්ඩායම් 5හිම සාමාජිකයන් තම බැලුනය තුළට හුළං පුම්බා ගැට ගසාගෙන තම බැලුනය රැක ගනිමින් අන් කණ්ඩායම් හි සාමාජිකයන්ගේ බැලුන තම අත ඇති ඇල්පෙනෙත්තෙන් පුපුරවා තම කණ්ඩායමේ වර්ණයට අදාළ මුද්‍රිත කඩදාසි සියල්ල සොයා ගත යුතුය.<br>මෙය ශාලාව තුළ ඔබ මොබ දුවමින් සිදු කළ යුතු අතර තම කණ්ඩායමේ මාතෘකාව බිත්තියේ සකසා ඇති පිලිප් චාට් කොළය මත හැකි ඉක්මණින් අළවා තම මාතෘකාව සකසා ගෙන ජයග්‍රහණය තහවුරු කළ යුතුය.<br>(විනාඩි 15) |

| අන්තර්ගතය/ මාතෘකාව | වේලාව /කාලය | අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය | ක්‍රමවේදය |
| --- | --- | --- | --- |
| | | | කණ්ඩායම් සියල්ලම තම කණ්ඩායමට අදාළ මාතෘකා සකසා ගත් පසු එම මාතෘකාවට අදාළව කණ්ඩායම් සාකච්ඡාවකින් පිලිප් චාට් කොළය මත කරුණු ගොනු කළ යුතුය.<br>කණ්ඩායම් 5ට අදාළ මාතෘකා වනුයේ :-<br>1. ශ්‍රී ලංකාවේ නෛතික රාමුව තුළ ළමයා යන්න හඳුනා ගන්න.<br>2. ළමා සංවර්ධන අවධීන් සහ අංශ පැහැදිලි කරන්න.<br>3. ළමා අයිතිවාසිකම් පැහැදිලි කරන්න.<br>4. ළමා අපයෝජන වර්ග හඳුන්වන්න.<br>5. ධනාත්මක සංවර්ධනයක් සඳහාවන අන්තර්ජාලය භාවිතය<br>(විනාඩි 30)<br>කණ්ඩායම් ක්‍රියාකාරකමෙන් අනතුරුව එක් එක් කණ්ඩායම තමන්ට ලැබුනු මාතෘකාවට අදාළව විනාඩි 10 ක ඉදිරිපත් කිරීමක් කළ යුතුය. (විනාඩි 50)<br>සයිබර් අවකාශය තුළ ශ්‍රී ලාංකීය ළමයින්ගේ හැසිරීම හා භාවිතය පිළිබඳ දත්ත වාර්තා පිළිබඳව පහසුකම් සලසන්නන්ගේ ඉදිරිපත් කිරීම<br>(විනාඩි 10) |
| දිවා ආහාර විවේකය | පෙ.ව. 12.15- ප.ව.01.15<br>විනාඩි 60 | | |

## සැසි 01 හි අරමුණ

සැසිය අවසාන වන විට සහභාගීවන්නන් හට

- ළමයෙක් යනු කවුරුන්ද යන්න පිළිබඳව නීතිමය වශයෙන් නිර්වචනය කිරීමට හැකිවේ.
- ළමා සංවර්ධනය පිළිබඳව දළ අවබෝධයක් ලැබීම.
- ළමා අයිතිවාසිකම් පිළිබඳව මූලික අවබෝධයක් ලැබීම.
- ළමා අපයෝජනයක් යන්න කෙටියෙන් පැහැදිලි කිරීමට හැකියාව ලැබේ.
- ලිංගික අපයෝජනය සහ ලිංගික සුරාකෑම අතර වෙනස හඳුනා ගැනීමට හැකිවේ.
- ධනාත්මක සංවර්ධනයක් සඳහාවන අන්තර්ජාලය භාවිතය සහ සයිබර් අවකාශය තුළ ශ්‍රී ලාංකීය ළමයින්ගේ හැසිරීම හා භාවිතය පිළිබඳ දත්ත වාර්තා පිළිබඳව පහසුකම් සලසන්නන්ගේ ඉදිරිපත් කිරීම

## දෙවන සැසියේ ආරම්භය

| අන්තර්ගතය/ මාතෘකාව | වේලාව /කාලය | අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය | ක්‍රමවේදය |
|---|---|---|---|
| සයිබර් අවකාශය තුළ ඇති අවදානම හඳුනා ගැනීමේ සහ අන්තර්ජාලය හරහා සිදුවන ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම පිළිබඳව කණ්ඩායම් ක්‍රියාකාරකම | ප.ව. 01.15- ප.ව.02.00 විනාඩි 45 | පිලිප් චාට් මාකර් පෑන් | Energizer ක්‍රියාකාරකමක් හරහා සහභාගීවන්නන් කණ්ඩායම් 5කට බෙදා ගන්න. එක් එක් කණ්ඩායමට පහත මාතෘකා ලබා දී කණ්ඩායම් සාකච්ඡාවක් හරහා තමන් මෙතෙක් දන්නා දැනුම තුළින් අදාළ මාතෘකාව හරහා පිලිප් චාට් කොළවල කරුණු ගොනුකර විනාඩි 10ක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම්වන ලෙස පවසන්න.<br>කණ්ඩායම්වලට අදාළ මාතෘකා වනුයේ ;<br>1.සයිබර් අවකාශය හරහා සිදුවන ලිංගික අපයෝජනය හඳුනා ගැනීම.<br>2.අන්තර්ජාලය හරහා සිදුවන වෙනත් අහිතකර ඇබ්බැහිවීම් හඳුන්වන්න.<br>3.පුද්ගලයින් නිරුවත් දර්ශන හුවමාරුකර ගන්නේ ඇයි?<br>4. පුද්ගලයින් නිරුවත් දර්ශන කාන්දුකරන්නේ ඇයි?<br>5.අන්තර්ජාලය හරහා සිදුවන ලිංගික අපයෝජන සංකීර්ණ වන්නේ ඇයි? |
| කණ්ඩායම් ඉදිරිපත් කිරීම | ප.ව. 02.00- ප.ව.03.15 විනාඩි 75 | | කණ්ඩායම් අනුපිළිවෙලින් තම ඉදිරිපත් කිරීම සිදු කිරීම සහ ඉදිරිපත් කිරීම් සඳහා සෙසු අයගේ අදහස් දැක්වීම |
| අන්තර්ජාලය හරහා සිදුවන ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම පිළිබඳව PPT ඉදිරිපත් කිරීම සහ හඳුනා ගැනීම | ප.ව. 03.15- ප.ව.04.00 විනාඩි 45 | PPT ඉදිරිපත් කිරීම | පහසුකම් සලසන්නන් විසින් PPT ඉදිරිපත් කිරීම සහ විෂය පිළිබඳ විවෘත සාකච්ඡාව |
| තේ විවේකය | ප.ව.04.00 - ප.ව.04.30 විනාඩි 30 | | |
| දෙවන දිනට සූදානම් වීම | ප.ව.04.30 - ප.ව.04.45 විනාඩි 15 | | සහභාගීවන්නන් එක් අයෙකු හෝ දෙදෙනෙකුට පසුදින උදෑසන Re Cap ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වීමට නම්කර ගැනීම |

### සැසි 02 හි අරමුණ

සැසිය අවසාන වන විට සහභාගීවන්නන් හට

- සයිබර් අවකාශය තුළ ඇති අවදානම හඳුනා ගැනීමේ හැකියාව සහ එහි අහිතකර බලපෑම හඳුනාගත හැකි වේ. (තිරයමත අධික ඇබ්බැහි වීම සහ අන්තර්ජාල ක්‍රීඩා ආදිය පිළිබඳව සහ සයිබර් අවකාශය තුළ සිදුකරන හිංසනය ආදිය පිළිබඳව)
- අන්තර්ජාලය හරහා සිදුවන ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑමෙහි වර්ගයන් සහ එහි ඇති අවදානම හඳුනාගත හැකි වේ.
- විශේෂයෙන් ම ළමයින් සහ යෞවනයන් අතර විශාල ගැටලුවක් බවට පත්ව ඇති නිරුවත් දර්ශන යැවීම සහ කාන්දු කිරීම සිදුවන්නේ ඇයි යන්න අවබෝධකර ගැනීම.

# දෙවන දිනයේ වැඩසටහන
# තෙවන සැසියේ ආරම්භය

| අන්තර්ගතය/ මාතෘකාව | වේලාව /කාලය | අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය | ක්‍රමවේදය |
|---|---|---|---|
| දෙවන දිනය ආරම්භය සහභාගීවන්නන් පිළිගැනීම සහ පෙරදිනයේ වැඩසටහන පිළිබඳ මතකය ආවර්ජනය කිරීම | පෙ.ව. 08.30- පෙ.ව. 08.45 විනාඩි 15 | පිලිප් චාට් මාකර් පෑන් | කලින් දින නම්කරගත් සහභාගීවන්නෙකු විසින් පෙර දිනයේ වැඩසටහන් පෙළ ගැස්ම පිළිබඳව මතකය ආවර්ජනය කිරීම |
| වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම | පෙ.ව. 08.45- පෙ.ව. 09.20 විනාඩි 35 | පිලිප් චාට් මාකර් පෑන් | වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීමට අදාළව විවෘත සාකච්ඡාවක් සිදුකර මෙම සැසියේ දී සාකච්ඡා කරනු ලබන කරුණු පිළිබඳව දැනුවත් කරන්න. ඉන්පසු සහභාගීවන්නන් කණ්ඩායම් 5කට බෙදා ගන්න. එක් එක් කණ්ඩායමට පහත මාතෘකා ලබා දී කණ්ඩායම් සාකච්ඡාවක් හරහා තමන් මෙතෙක් දන්නා දැනුම තුළින් අදාළ මාතෘකාව හරහා පිලිප් චාට් කොළවල කරුණු ගොනුකර විනාඩි 10ක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම්වන ලෙස පවසන්න. කණ්ඩායම්වලට අදාළ මාතෘකා වනුයේ ;<br><br>1.අන්තර්ජාලය හරහා සිදුවන ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම වැළැක්වීම සහ ඊට ප්‍රතිචාර දැක්වීමට තනි පුද්ගල මට්ටමෙන් සිදුවිය යුතු වෙනස්කම් සාකච්ඡා කරන්න.<br><br>2.අන්තර්ජාලය හරහා සිදුවන ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම වැළැක්වීම සහ ඊට ප්‍රතිචාර දැක්වීමට සමාජීය මට්ටමෙන් සිදුවිය යුතු වෙනස්කම් සාකච්ඡා කරන්න.<br><br>3.ඔබ, අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික සූරාකෑම්වලට ගොදුරු වූ වින්දිතයෙකු හඳුනා ගන්නේ කෙසේද?<br><br>4. ඔබ,වින්දිතයෙකු හඳුනාගත් පසු කළයුතු හා නොකළ යුතු දේ පිළිබඳව සාකච්ඡා කරන්න.<br><br>5.අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික අපයෝජන සහ සූරාකෑම් වරදක් සම්බන්ධයෙන් පැමිණිළි කළහැකි ආයතන සහ එහි කාර්යයන් හඳුනා ගන්න. |

| අන්තර්ගතය/ මාතෘකාව | වේලාව /කාලය | අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය | ක්‍රමවේදය |
|---|---|---|---|
| කණ්ඩායම් ඉදිරිපත් කිරීම | පෙ.ව. 09.20- පෙ.ව. 10.20 විනාඩි 60 | | කණ්ඩායම් අනුපිළිවෙලින් තම ඉදිරිපත් කිරීම සිදු කිරීම සහ ඉදිරිපත් කිරීම් සඳහා සෙසු අයගේ අදහස් දැක්වීම. අන්තර්ජාලය හරහා සිදුවන ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම වැළැක්වීම සහ ඊට ප්‍රත්චාර දැක්වීමට තනි පුද්ගල මට්ටමෙන් සිදුවිය යුතු වෙනස්කම් සාකච්ඡා කරන විට දී ධනාත්මක පෞරුෂත්වය සහ යහපත් සම්බන්ධතා ශක්තිමත් කරගැනීම යන සාකච්ඡාව සහභාගීවන්නන්ගෙන් මතු වූයේ නැතිනම් පහසුකම් සලසන්නන් විසින් ඒ පිළිබඳව සාකච්ඡා කරන්න. |
| තේ විවේකය | පෙ.ව. 10.20- 10.45 විනාඩි 25 | | |

**සැසි 03 හි අරමුණ**

සැසිය අවසාන වන විට සහභාගීවන්නන් හට

- වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීමට අදාළව තනි පුද්ගල සහ සමාජීය මට්ටමෙන් සිදුවිය යුතු ධනාත්මක සංවර්ධනයන් සහ යහපත් සම්බන්ධතා පවත්වා ගැනීමේ ඇති වැදගත්කම පිළිබඳව අවබෝධයක් ලැබේ.
- අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික සූරාකෑම්වලට ගොදුරු වූ වින්දිතයෙකු පිළිබඳව දැනගත්විට වෘත්තීය මට්ටමෙන් කටයුතු කිරීමේ දී අවධානය යොමුකළ යුතු කාරණා පිළිබඳව සාකච්ඡා කිරීමට හැකියාව ලැබේ.
- සයිබර් අපරාධ සම්බන්ධව කටයුතු කරන ආයතනවල යාන්ත්‍රණයන් පිළිබඳව දළ අවබෝධයක් ලබා ගැනීමට හැකියාව ලැබේ.

## සිව්වන සැසියේ ආරම්භය

| | | | |
|---|---|---|---|
| නෛතික රාමුව සහ ආයතනික ව්‍යුහය<br>කණ්ඩායම් ක්‍රියාකාරකම | පෙ.ව. 10.45- 11.30 විනාඩි 45 | කලින් සකස්කරන ලද පිලිප් චාට් කොළ කණ්ඩායම් 5ට ලබාදෙන්න. | සහභාගීවන්නන් කණ්ඩායම් 5කට බෙදා ගන්න.<br>කණ්ඩායම් ක්‍රියාකාරකම සඳහා කලින් සකස්කර ගන්නා ලද පිලිප් චාට් කොළය බැගින් සහ ක්‍රියාකාරකමට අදාළ තීරුසටහන් අඩංගු ලියුම්කවරය බැගින් එක් එක් කණ්ඩායමට ලබා දී එහි අඩංගු සයිබර් අපරාධ හා අදාළ වන විවිධ පනත් හා ඒ යටතේ අදාළ වන වගන්ති තෝරා, දී ඇති පිලිප් චාට් කොළයේ අලවන ලෙස පවසන්න.<br>(වැඩිදුර අවබෝධය සඳහා මෙම අත්පොත අවසානයේ ඇති ඇමුණුම බලන්න)<br>විනාඩි 20 ක කාලයක් තුළ දී මෙම ක්‍රියාකාරකම අවසන් කිරීමට උපදෙස් දෙන්න.<br>ඉන්පසු පිලිප් චාට් කොළ ශාලාවේ ස්ථාන 5ක අලවා PPT ඉදිරිපත් කිරීමක් හරහා පිළිතුරු සාකච්ඡා කරමින් හරි වැරදි ලකුණු කිරීමට ඔවුන්ට ඉඩලබා දෙන්න. නිවැරදි ලකුණු මට්ටම අනුව 1,2,සහ 3වන ස්ථාන දිනාගත් කණ්ඩායම් තෝරන්න.<br>(විනාඩි 20) |

| අන්තර්ගතය/ මාතෘකාව | වේලාව /කාලය | අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය | ක්‍රමවේදය |
|---|---|---|---|
| නෛතික රාමුව සහ ආයතනික ව්‍යුහය පිළිබඳව පැහැදිලි කිරීම සහ විවෘත සාකච්ඡාව | පෙ.ව. 11.30- ප.ව.12.45 විනාඩි 75 | PPT ඉදිරිපත් කිරීම | ශ්‍රී ලංකාව තුළ අන්තර්ජාලය හරහා සිදුවන ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑමට හා සෙසු පරිගණක අපරාධ සම්බන්ධ නෛතික රාමුව පිළිබඳව සහ මෙම නීතිය හා අදාළව කටයුතු කරන ආයතනික ව්‍යුහයන් පිළිබඳව පැහැදිලි කිරීමක් පහසුකම් සලසන්නන් විසින් සිදු කරන්න.<br>නීතිය සම්බන්ධව සහභාගීවන්නන්ට ඇති ගැටලු ඉදිරිපත් කිරීමට සහ ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙන්න. |
| ඇගයීමේ පත්‍රය ලබා දීම<br>සහභාගීවන්නන්ට වැඩසටහන පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම<br>ස්තුති කථාව<br>**වැඩසටහනෙහි නිමාව** | ප.ව. 12.45- ප.ව.01.30 විනාඩි 45 | ඇගයීම් පත්‍රය | |
| දිවා ආහාරය | ප.ව. 01.30- ප.ව.02.30 විනාඩි 60 | | |

**සැසි 04 හි අරමුණ**

සැසිය අවසාන වන විට සහභාගීවන්නන් හට

- ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන හා මාධ්‍ය මගින් ළමයින් අපයෝජනය වීම වැළැක්වීම හා ප්‍රතිචාර දැක්වීම සඳහා පවතින අන්තර්ජාතික එකඟතාවයන් හා නෛතික රාමුව පිළිබඳව අවබෝධයක් ලැබීම.
- ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන හා මාධ්‍ය මගින් ළමයින් අපයෝජනය වීම වැළැක්වීම හා ප්‍රතිචාර දැක්වීම සඳහා පවතින දේශීය නෛතික රාමුව පිළිබඳව අවබෝධයක් ලැබීම.
- සයිබර් අවකාශය තුළ සිදුවන අපරාධ වැළැක්වීම හා වින්දිතභාවයට පත්වන පාර්ශවයන්ගේ ආරක්ෂාව සඳහා ඇති රාජ්‍ය ආයතන හඳුනා ගැනීම සහ එහි මූලික කාර්යභාරයන් පිළිබඳව අවබෝධයක් ලැබේ.

ඔබ ඔබගේ අවශ්‍යතාවය පරිදි එක්දින පුහුණු වැඩසටහනක් සැලසුම් කරන්නේ නම් පහත දැක්වෙන එක්දින පුහුණු ක්‍රමවේදයට අනුගත විය හැකිය. සහභාගීවන්නන් 40ක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් සහභාගීවන්නේ නම් අවශ්‍යතාවය අනුව දෙදින පුහුණු වැඩසටහනේ ඇති ක්‍රියාකාරකම් ද කාල කළමණාකරණය කරමින් ගැළපෙන ලෙස ඇතුළත් කරගත හැකිය.

**පුහුණු ක්‍රමවේදය - එක් දින පුහුණු වැඩසටහනක් සඳහා යෝජිත සැසි සැලැස්ම**

| අන්තර්ගතය/ මාතෘකාව | වේලාව /කාලය | අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය | ක්‍රමවේදය |
|---|---|---|---|
| පිළිගැනීම සහ වැඩසටහන් ආරම්භය | පෙ.ව. 08.30-08.45 විනාඩි 20 | PPT ඉදිරිපත් කිරීම | සහභාගී වී සිටින වෘත්තිකයන් පිරිස ඉතාමත් ගෞරවනීය ලෙස පිළිගෙන ඔවුන්ගේ සහභාගීත්වය ඇගයීමට ලක් කිරීම. වැඩසටහන පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් සිදුකර PEaCE ආයතනය සහ එහි වැඩසටහන් පිළිබඳවද හඳුන්වා දීම. |
| හඳුනා ගැනීම | පෙ.ව. 08.45-09.00 විනාඩි 15 | Name Tag ප්ලැටිග්නම් පෑන් හැට්ට කටු | සෑම සහභාගීවන්නෙකුටම Name Tag එකක් ලබා දී තම නම ප්ලැටිග්නම් පෑනකින් ලියා පැළඳගන්නා ලෙස පවසන්න. ඉන්පසු සහභාගීවන්නන් එකිනෙකාට තමාව හඳුන්වා දෙන ලෙස පවසන්න. එලෙස හඳුන්වා දෙන අතර මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට තමාගෙන් දියහැකි දායකත්වයක් ලෙස තමාගේ එක් හොඳ ගතිගුණයක්/ වටිනාකමක් ද සඳහන් කරන ලෙස ද පවසන්න. |
| **පළමු සැසියේ ආරම්භය**<br><br>**සැසි 01 හි අරමුණ**<br><br>සැසිය අවසාන වන විට සහභාගීවන්නන් හට<br><br>▪ ළමයෙක් යනු කවුරුන්ද යන්න පිළිබඳව නීතිමය වශයෙන් නිර්වචනය කිරීමට හැකිවේ.<br>▪ ළමා සංවර්ධනය පිළිබඳව දළ අවබෝධයක් ලැබීම<br>▪ ළමා අයිතිවාසිකම් පිළිබඳව මූලික අවබෝධයක් ලැබීම | | | |
| ළමයා යනු කවුද? ළමා විය සහ ළමා අයිතිවාසිකම් හඳුනා ගැනීම. | පෙ.ව. 09.00-09.30 විනාඩි 30 | PPT ඉදිරිපත් කිරීම<br><br>අවශ්‍ය නම් පිලිප් චාට් මාකර් පෑන් | පහත මාතෘකා පිළිබඳ දළ අවබෝධයක් ලබා ගැනීම සඳහා සහභාගීවන්නන් සමග විවෘතව සාකච්ඡාකරමින් පහත මාතෘකා පිළිබඳ දැනුවත් කරන්න.<br>1. ශ්‍රී ලංකාවේ නෛතික රාමුව තුළ ළමයා යන්න හඳුනා ගන්න.<br>2. ළමා සංවර්ධන අවධීන් සහ අංශ කෙටියෙන් පැහැදිලි කරන්න.<br>3. ළමා අයිතිවාසිකම් පැහැදිලි කරන්න. |

<table>
<tr><th>අන්තර්ගතය/ මාතෘකාව</th><th>වේලාව /කාලය</th><th>අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය</th><th>ක්‍රමවේදය</th></tr>
<tr><td colspan="4">දෙවන සැසියේ ආරම්භය<br>සැසි 02 හි අරමුණ<br><br>සැසිය අවසාන වන විට සහභාගීවන්නන් හට<br><br>■ ළමා අපයෝජනයක් යන්න කෙටියෙන් පැහැදිලි කිරීමට හැකියාව ලැබේ.<br>■ ලිංගික අපයෝජනය සහ ලිංගික සූරාකෑම අතර වෙනස හඳුනා ගැනීමට හැකිවේ.</td></tr>
<tr><td>ළමයින් ට එරෙහි අපයෝජනය සහ සූරාකෑම පිළිබඳ ගැටලුව හඳුනා ගැනීම.<br>ලිංගික අපයෝජනය සහ ලිංගික සූරාකෑම අතර වෙනස හඳුනා ගැනීමට හැකිවේ.</td><td>පෙ.ව.<br>09.30-10.30<br>පැය 01</td><td>PPT ඉදිරිපත් කිරීම<br>වීඩියෝ පට<br><br>අවශ්‍ය නම් පිලිප් චාට්<br>මාකර් පෑන්</td><td>පහසුකම් සලසන්නන් විසින් PPT ඉදිරිපත් කිරීම සහ විෂය පිළිබඳ විවෘත සාකච්ඡාව<br>ළමයින්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්ව හා අපයෝජන ආකාරයන්වන<br>1.නොසලකා හැරීම<br>2.කායික අපයෝජනය<br>3.ලිංගික අපයෝජනය සහ<br>4.චිත්තවේගීය අපයෝජනය ගැන එකින් එක අදාළ වීඩියෝ පට ද පෙන්වමින් පුළුල් සාකච්ඡාවක් සිදුකරන්න.</td></tr>
<tr><td>තේ විවේකය</td><td>පෙ.ව.<br>10.30-10.45<br>විනාඩි 15</td><td>-</td><td>-</td></tr>
<tr><td colspan="4">තෙවන සැසියේ ආරම්භය<br>සැසි 03හි අරමුණ<br><br>සැසිය අවසාන වන විට සහභාගීවන්නන් හට<br><br>■ ධනාත්මක සංවර්ධනයක් සඳහාවන අන්තර්ජාලය භාවිතය සහ සයිබර් අවකාශය තුළ ශ්‍රී ලාංකීය ළමයින්ගේ හැසිරීම හා භාවිතය පිළිබඳ දත්ත වාර්තා පිළිබඳව දැනුවත්භාවයක් ලැබීම.<br>■ සයිබර් අවකාශය තුළ ඇති අවදානම හඳුනා ගැනීමේ හැකියාව සහ එහි අහිතකර බලපෑම හඳුනාගත හැකි වේ. (තිරයමත අධික ඇබ්බැහි වීම සහ අන්තර්ජාල ක්‍රීඩා ආදිය පිළිබඳව සහ සයිබර් අවකාශය තුළ සිදුකරන හිංසනය ආදිය පිළිබඳව)<br>■ අන්තර්ජාලය හරහා සිදුවන ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑමෙහි වර්ගයන් සහ එහි ඇති අවදානම හඳුනාගත හැකි වේ.<br>■ විශේෂයෙන් ම ළමයින් සහ යෞවනයන් අතර විශාල ගැටලුවක් බවට පත්ව ඇති නිරුවත් දර්ශන යැවීම සහ කාන්දු කිරීම සිදුවන්නේ ඇයි යන්න අවබෝධකර ගැනීම.</td></tr>
</table>

| අන්තර්ගතය/ මාතෘකාව | වේලාව /කාලය | අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය | ක්‍රමවේදය |
|---|---|---|---|
| ධනාත්මක සංවර්ධනයක් සඳහාවන අන්තර්ජාල භාවිතය<br><br>සයිබර් අවකාශය තුළ ශ්‍රී ලාංකීය ළමයින්ගේ හැසිරීම හා භාවිතය පිළිබඳ දත්ත වාර්තා<br><br>අන්තර්ජාලය හරහා සිදුවන ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම පිළිබඳව PPT ඉදිරිපත් කිරීම සහ විෂය හඳුනා ගැනීම<br><br>පුද්ගලයින් නිරුවත් දර්ශන හුවමාරුකර ගන්නේ ඇයි?<br><br>පුද්ගලයින් නිරුවත් දර්ශන කාන්දුකරන්නේ ඇයි?<br><br>අන්තර්ජාලය හරහා සිදුවන ලිංගික අපයෝජන සංකීර්ණ වන්නේ ඇයි? | පෙ.ව. 10.45-12.30 පැය 01 විනාඩි 45 | PPT ඉදිරිපත් කිරීම<br>වීඩියෝ පට<br>අවශ්‍ය නම් පිලිප් චාට් මාකර් පෑන් | පහසුකම් සලසන්නන් විසින් PPT ඉදිරිපත් කිරීම සහ දත්ත සහ වාර්තා වූ තොරතුරු ගැන කෙටි සාකච්ඡාව<br><br>පහසුකම් සලසන්නන් විසින් PPT ඉදිරිපත් කිරීම සහ දත්ත සහ වාර්තා වූ තොරතුරු ගැන කෙටි සාකච්ඡාව<br><br>පහසුකම් සලසන්නන් විසින් PPT ඉදිරිපත් කිරීම සහ විෂය පිළිබඳ විවෘත සාකච්ඡාව<br><br>1. ළමා ලිංගික අපයෝජනය පිළිබඳ ප්‍රකාශනයන් (Child Sexual Abuse Material/CSAM)<br><br>2. ලිංගික කටයුතු සඳහා අන්තර්ජාලය ඔස්සේ සිදුකරන පෙළඹවීම් (Online Grooming)<br><br>3. ලිංගිකමය කෙටි පණිවිඩ යැවීම (Sexting)<br><br>4. ලිංගික ග්‍රහණය (Sexual Exploitation/ Sextortion)<br><br>5. සජීවීව අන්තර්ජාලය හරහා සිදුවන ළමා ලිංගික අපයෝජනය (Live Streaming)<br><br>6. අන්තර්ජාලය හරහා සිදුවන හිරිහැර කිරීම (Cyber Bullying)<br><br>Cyber Bullying යටතේ කතාබහට ලක්වන තවත් එක් මාතෘකාවක්වන පුද්ගලයින් නිරුවත් දර්ශන කාන්දු කරන්නේ ඇයි? යන්නට අදාළ විෂය කරුණු විවෘතව සාකච්ඡා කරන්න. ඊට අමතරව අන්තර්ජාලය හරහා සිදුවන ලිංගික අපයෝජන සංකීර්ණ වන්නේ ඇයි? යන්න ද සහභාගීවන්නන්ගේ බුද්ධි කළම්බනයක් සිදුකරමින් විවෘතව සාකච්ඡා කරන්න. |
| දිවා ආහාර විවේකය | ප.ව. 12.30- ප.ව.01.30 පැය 01 | | |

**සිව්වන සැසියේ ආරම්භය**

සැසි 04හි අරමුණ

සැසිය අවසාන වන විට සහභාගීවන්නන් හට

- වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීමට අදාළව තනි පුද්ගල සහ සමාජීය මට්ටමෙන් සිදුවිය යුතු ධනාත්මක සංවර්ධනයන් සහ යහපත් සම්බන්ධතා පවත්වා ගැනීමේ ඇති වැදගත්කම පිළිබඳව අවබෝධයක් ලැබේ.
- අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික සූරාකෑම්වලට ගොදුරු වූ වින්දිතයෙකු පිළිබඳව දැනගත්විට වෘත්තීය මට්ටමෙන් කටයුතු කිරීමේ දී අවධානය යොමුකළ යුතු කාරණා පිළිබඳව සාකච්ඡා කිරීමට හැකියාව ලැබේ.

| අන්තර්ගතය/ මාතෘකාව | වේලාව /කාලය | අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය | ක්‍රමවේදය |
|---|---|---|---|
| වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම | ප.ව. 01.30- පෙ.ව. 02.30 පැය 01 | PPT ඉදිරිපත් කිරීම<br>පිලිප් චාට්<br>මාකර් පෑන් | වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීමට අදාළව විවෘත සාකච්ඡාවක් සිදුකර මෙම සැසියේ දී සාකච්ඡා කරනු ලබන කරුණු පිළිබඳව දැනුවත් කරන්න.<br><br>1. අන්තර්ජාලය හරහා සිදුවන ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම වැළැක්වීම සහ ඊට ප්‍රත්චාර දැක්වීමට තනි **පුද්ගල මට්ටමෙන්** සිදුවිය යුතු වෙනස්කම් සාකච්ඡා කරන්න.<br><br>2. අන්තර්ජාලය හරහා සිදුවන ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම වැළැක්වීම සහ ඊට ප්‍රතිචාර දැක්වීමට **සමාජීය මට්ටමෙන්** සිදුවිය යුතු වෙනස්කම් සාකච්ඡා කරන්න.<br><br>3. ඔබ, අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික සූරාකෑම්වලට ගොදුරු වූ වින්දිතයෙකු හඳුනා ගන්නේ කෙසේද?<br><br>4. ඔබ,වින්දිතයෙකු හඳුනාගත් පසු කළයුතු හා නොකළ යුතු දේ පිළිබඳව සාකච්ඡා කරන්න. |

**පස්වන සැසියේ ආරම්භය**

**සැසි 05 හි අරමුණ**

සැසිය අවසාන වන විට සහභාගීවන්නන් හට

- ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන හා මාධ්‍ය මගින් ළමයින් අපයෝජනය වීම වැළැක්වීම හා ප්‍රතිචාර දැක්වීම සඳහා පවතින දේශීය නෛතික රාමුව පිළිබඳව අවබෝධයක් ලැබීම.
- සයිබර් අපරාධ සම්බන්ධව කටයුතු කරන රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන වෙනත් ආයතනවල යාන්ත්‍රණයන් පිළිබඳව දළ අවබෝධයක් ලබා ගැනීමට හැකියාව ලැබේ.

| අන්තර්ගතය/ මාතෘකාව | වේලාව /කාලය | අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය | ක්‍රමවේදය |
|---|---|---|---|
| නෛතික රාමුව සහ ආයතනික ව්‍යුහය පිළිබඳව පැහැදිලි කිරීම සහ විවෘත සාකච්ඡාව | ප.ව. 02.30-ප.ව.03.30 පැය 01 | PPT ඉදිරිපත් කිරීම | ශ්‍රී ලංකාව තුළ අන්තර්ජාලය හරහා සිදුවන ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑමට හා සෙසු පරිගණක අපරාධ සම්බන්ධ නෛතික රාමුව පිළිබඳව සහ මෙම නීතිය හා අදාළව කටයුතු කරන ආයතනික ව්‍යුහයන් පිළිබඳව පැහැදිලි කිරීමක් පහසුකම් සලසන්නන් විසින් සිදු කරන්න.<br>නීතිය සම්බන්ධව සහභාගීවන්නන්ට ඇති ගැටලු ඉදිරිපත් කිරීමට සහ ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙන්න. |
| ඇගයීමේ පත්‍රය ලබා දීම සහභාගීවන්නන්ට වැඩසටහන පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම | ප.ව. 03.30-ප.ව.04.00 විනාඩි 30 | ඇගයීමේ පත්‍රය | |
| **ස්තුති කතාව**<br><br>**වැඩසටහනෙහි නිමාව** | | | |
| **තේ විවේකය සහ විසිර යෑම** | ප.ව. ප.ව.04.00 | | |

# සටහන්

# සයිබර් අවකාශය තුළ ශ්‍රී ලාංකීය ළමයින්ගේ හැසිරීම හා භාවිතය

# පියවර 3



## 3.1 පසුබිම

තාක්ෂණික උපාංග (Technological devices) හා එකිනෙකට සම්බන්ධ පද්ධති ජාලයන් (networks) ඔස්සේ, අන්තර්ජාලය (Internet) තුළ පවතින මෘදුකාංග හා සේවාවන් (Software and Services) සමග පරිශීලකයන්ගේ අන්තර්සම්බන්ධතා නිසා ඇතිවන පරිසරය සයිබර් අවකාශය (Cyberspace) වශයෙන් හඳුනාගත හැකිය. මෙම සංකීර්ණ සිද්ධි දාමය සිදුවන්නේ භෞතික ඉඩකඩක නොවේ[1].

2019 ජනවාරි වනවිට, ලොව පුරා අන්තර්ජාලය භාවිත කරන අයගේ ප්‍රමාණය බිලියන 4.3 ඉක්මවූ අතර එහි ප්‍රතිශතය ලෝක ජනගහනයෙන් 57% කි. සෑම දිනකම සාමාන්‍යයෙන් මිලියනයකටත් වඩා ප්‍රමාණයක් අලුතින් අන්තර්ජාලය භාවිත කරන්නන් අතරට එක් වෙයි. 2019 ජනවාරි මස තොරතුරුවලට අනුව, අන්තර්ජාලය භාවිත කරන්නෙක් සාමාන්‍යයෙන් දිනකට පැය 6.5 ක පමණ කාලයක් අන්තර්ජාලය තුළ ගත කරයි. මෙහි අවසන් ප්‍රතිඵලය වශයෙන් සමස්ත ලෝක වාසී ඩිජිටල් ප්‍රජාව 2019 වසර තුළ අන්තර්ජාලය භාවිත කරන මුලු කාලය වසර බිලියන 1.2 ක් ඉක්මවනු ඇත[2].



3.1 රූප සටහන - 1

එම කාලයෙන් වැඩි ඉඩක් සමාජ මාධ්‍ය ජාලා විසින් අත්පත් කර ගෙන ඇත. අන්තර්ජාලය භාවිත කරන්නන්ගෙන් 80%ක්ම එහි ඇති විවිධ සේවා අතුරින් සමාජ මාධ්‍ය තුළ සක්‍රියව සැරිසරයි. 2018 ජනවාරි සිට 2019 ජනවාරි තෙක් ලෝක ජනගහනය 1.1%කින් වර්ධනය වී ඇති අතර අන්තර්ජාලය හා සක්‍රීය සමාජ මාධ්‍ය භාවිත කරන්නන්ගේ වර්ධනයෙහි ප්‍රතිශතය 9%ට වඩා වැඩිය[3]. (3.1 රූප සටහන - 1)

2019 ජනවාරි වන විට, ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනය මිලියන 20.98 කි. ඉන් අන්තර්ජාලය භාවිත කරන්නන්ගේ ප්‍රමාණය මිලියන 7.1 ක් ඉක්මවයි. එය මුලු ජනගහනයෙහි ප්‍රතිශතයක් වශයෙන් 34% කි. අන්තර්ජාලය භාවිත කරන්නවුන් අතරින් සක්‍රීය සමාජ මාධ්‍ය පරිශීලකයන්ගේ ප්‍රමාණය මිලියන 6.2 කි. එහි ප්‍රතිශතය 87% කි[3].(3.1 රූප සටහන-2 )



3.1 රූප සටහන -2

ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 16ත් 30ත් අතර පසුවන අයගේ සමාජ මාධ්‍ය පරිශීලනය සම්බන්ධයෙන් වැදගත් කරුණක් අනාවරණය කරගෙන ඇත. මෙම වයස් කාණ්ඩයේ පසු වන්නන්ගෙන් 50% ක් දිනකට පැය 1 සිට 5 දක්වා කාල පරාසයක් සමාජ මාධ්‍ය ඇසුරේ කල් ගෙවන අතර, 10% ක් පැය 5 කට අධික කාලයක් සමාජ මාධ්‍ය පරිශීලනය කරයි. සෙසු 40% පරිශීලනය කරන්නේ පැයකට අඩු කාලයකි[4].

ශ්‍රී ලාංකිකයින්ගේ පරිගණක සාක්ෂරතාවය හා ඩිජිටල් සාක්ෂරතාවය අඛණ්ඩව වර්ධනය වෙමින් පවතී. එමෙන්ම ලාංකික ප්‍රජාව තවදුරටත් අන්තර්ජාලයට ප්‍රවිෂ්ට වීමට භාවිත කරන ප්‍රමුඛතම උපාංගය පරිගණක නොවන බව පහත සංඛ්‍යා දත්ත තුළින් පැහැදිලි වෙයි[5]. (3.1 රූප සටහන - 3)

| පරිගණක සාක්ෂරතාවය 28.3% | අන්තර්ජාලය හා සම්බන්ධවීම සඳහා භාවිත කරන උපාංග |
|---|---|
| (නාගරික 41.1%, ග්‍රාමීය 26.5%, වතු 9.5%) | ඩෙස්ක්ටොප් පරිගණක හෝ ලැප්ටොප් පරිගණක 38.1% |
| ඩිජිටල් සාක්ෂරතාවය 38.7% | ස්මාර්ට් දුරකථන 56.9% |
| (නාගරික 54.5%, ග්‍රාමීය 36.4%, වතු 16.4%) | ටැබ්ස් 2.1% |
| | ජංගම දුරකථන 2.9% |

(3.1 රූප සටහන - 3)

## 3.2 සයිබර් අවකාශය තුළ ශ්‍රී ලාංකීය ළමයින්

2017 වසරේ UNICEF සංවිධානය හා IPID ආයතනය විසින් ශ්‍රී ලාංකික වයස 11-18 අතර ළමයින් ඇසුරින් සිදුකළ සමීක්ෂණයකදී සයිබර් අවකාශය තුළ ලාංකික ළමයින්ගේ හැසිරීම සම්බන්ධයෙන් වැදගත් කරුණු ගණනාවක් අනාවරණය වී ඇත. වයස අවුරුදු 11 - 18 ත් අතර ශ්‍රී ලාංකික ළමයින්ගෙන් 52.8% කට ඩිජිටල් උපාංගයන්ට හා අන්තර්ජාලයට පිවිසීමේ හැකියාව ඇත (Online users). එම වයස් කාණ්ඩයේම ළමයින් 39.8%ක් අන්තර්ජාලය පරිශීලනය නොකරන මුත් ඩිජිටල් උපාංග පරිහරණය කරයි (Non Online IT users). මෙම අවස්ථා දෙක වෙතම ළඟා විය නොහැකි ළමයින්ගේ ප්‍රමාණය 7.4% කි (Non IT users). මේ ආකාරයට අන්තර්ජාලය හා ඩිජිටල් උපාංග භාවිතය උක්ත වයස් පරාසයෙහි ළමයින් අතර සිදු වන ආකාරය ස්ත්‍රී පුරුෂ භාවය හා ඔවුන් අධ්‍යාපනය ලබන ශ්‍රේණි පදනම් කරගෙන පහත සඳහන් ආකාරයට විශ්ලේෂණය කළ හැකිය[6]. (3.2 රූප සටහන - 1)




3.2 රූප සටහන - 1

අන්තර්ජාලය භාවිත නොකරන නමුත් ඩිජිටල් උපාංග පරිහරණය කරන අයගෙන් (Non Online IT users), තුනෙන් දෙකක් පමණ අන්තර්ජාලය පරිශීලනයට කැමැත්තක් ඇත. එසේ වුවත් ඔවුනට අන්තර්ජාල පහසුකම් සහිත පරිගණකයක් හෝ ජංගම දුරකථනයක් හෝ වෙනත් එවැනි උපාංගයක් නොමැතිකම, අන්තර්ජාලය වෙත පිවිසීම පිළිබඳ දෙමව්පියන් තුළ ඇති නොකමැත්ත වැනි හේතු ප්‍රධාන සීමාකම් වශයෙන් හඳුනාගෙන ඇත[6].

අන්තර්ජාල පරිශීලනය කරන ළමයින් (Online users), අන්තර්ජාල පරිශීලනය ආරම්භකරන සාමාන්‍ය වයස අවුරුදු 13 පමණ වන අතර මේ සඳහා ජාතිය හෝ ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙනසක් නොමැත. පෙර වයස්වලදී (අවුරුදු 5 - 7 පමණ) අන්තර්ජාලය පරිශීලනය ආරම්භ කරන අයගෙන් 77% ක් පමණ පිරිමි ළමයින් වන අතර පසු වයස්වල (අවුරුදු 18 පමණ) අන්තර්ජාලය පරිශීලනය ආරම්භ කරන අයගෙන් 75%ක් පමණ ගැහැනු ළමයින් වෙයි[6].

අන්තර්ජාල පරිශීලනය කරන ළමයින්ගෙන් (Online users), අන්තර්ජාලය වෙත පිවිසීම සඳහා 74.8% ක් ජංගම දුරකථන ද, 66.5% ක් පරිගණක ද මාධ්‍ය ලෙස භාවිත කරයි. අන්තර්ජාල පරිශීලනය කරන ළමයින් (Online users) අතරින්, පිරිමි ළමයින්ගෙන් බහුතරය එනම් 60.3% ක් පමණ අන්තර්ජාල භාවිතය පිළිබඳ තමන් විසින්ම ඉගෙනගෙන ඇති අතර ගැහැනු ළමයින්ගෙන් බහුතරය වන 47.3% ක ප්‍රමාණය ඉගෙන ගෙන ඇත්තේ ස්වකීය සහෝදර සහෝදරියන්ගේ උදව්වෙනි[6].

අන්තර්ජාල පරිශීලනය කරන ළමයින් (Online users), එසේ කිරීමට හේතුවන ප්‍රධාන කරුණු කිහිපයක් පහත සඳහන් පරිදි හඳුනාගත හැකි වෙයි[6].

| කරුණ | සමස්ත සංඛ්‍යාව | පිරිමි ළමුන් | ගැහැනු ළමුන් |
|---|---|---|---|
| අධ්‍යාපනයට අදාළ තොරතුරු ලබා ගැනීම | 86.2% | 84.1% | 92.1% |
| තොරතුරු/මෘදුකාංග/වීඩියෝ වැනි දෑ බාගත (download) කර ගැනීම | 71.8% | 74.3% | 65.1% |
| චිත්‍රපට/යූ ටියුබ්/ වීඩියෝ වැනි දෑ නැරඹීම | 60.8% | 62.4% | 56.5% |

ශ්‍රී ලංකාව තුළ ඉහළම පරිශීලනයක් සහිත වෙබ් අඩවි 20 පිළිබඳ කරන ලද ශ්‍රේණිගත කිරීමට අනුව ප්‍රමුඛස්ථානයට පත්ව ඇත්තේ ෆේස් බුක් (Face book) සමාජ මාධ්‍ය යෙදවුමයි[7]. අන්තර්ජාලය භාවිත කරන ළමයින් (Online users) බහුතරයක් එනම් 84% ක් සමාජ මාධ්‍ය පරිශීලනය කරයි. අන්තර්ජාලය භාවිත කරන ගැහැනු ළමයින්ගෙන් 71% ද පිරිමි ළමයින්ගෙන් 89%ද සමාජ මාධ්‍ය පරිශීලනය කරයි[6]. (3.2 රූප සටහන - 2)




3.2 රූප සටහන - 2

අන්තර්ජාලය පරිශීලනය කරන ළමයින් (Online users), වඩාත්ම පරිශීලනය කරනු ලබන සමාජ මාධ්‍ය ලෙස ෆේස්බුක් (Facebook) පෙන්නුම් කරන අතර එහි අගය 61.7% කි. (පිරිමි ළමයින් 72%, ගැහැනු ළමයින් 33.1%) වඩාත්ම පරිශීලනය කරනු ලබන සමාජ මාධ්‍යයන් ලෙස අනුපිළිවෙලින් ස්කයිප් (Skype) (47.5%), වයිබර් (viber) (45%), වට්ස්ඇප් (WhatsApp) (37.2%), ට්විටර් (Twitter) (20.3%) සහ ඉන්සටර්ග්‍රෑම් (Instagram) (12.7%) හැඳින්විය හැකිය[6]. (3.2 රූප සටහන - 3)




3.2 රූප සටහන - 3

## 3.3 සයිබර් අවකාශය තුළ ආරක්ෂාව

සයිබර් අවකාශය තුළ ඇති අසීමිත අවස්ථාවන් හා ප්‍රයෝජනයන් මෙන්ම අවදානම්කාරී හා අභියෝගාත්මක තත්ත්වයන් ද ඒ හා සමානව හෝ ඇතැම් විට ඉක්මවා යන පරිද්දෙන් ද පවතී. වසර 2016 දී, ජාත්‍යන්තර විදුලි සංදේශන සංගමය (International Telecommunications Union) විසින් ස්වකීය සාමාජික රටවල් 193 සඳහා පිළියෙල කළ ගෝලීය සයිබර් ආරක්ෂණ දර්ශකයෙහි (Global Cyber Security Index - GCI) ශ්‍රේණිගත කිරීමට අනුව ශ්‍රී ලංකාවට හිමිව ඇත්තේ 72 වන ස්ථානයයි. වර්ෂ 2015 තුළ ලොව පුරා සයිබර් අවකාශය තුළ ආරක්ෂාවට තර්ජනයක් වූ සිද්ධීන් මිලියන 59.06 ක් වාර්තා වී ඇත. ශ්‍රී ලංකාව තුළ 2017 වර්ෂය තුළ වාර්තා වුණු එවැනි සිදු වීම් ගණන 3907 කි. ඉන් 3685 (94.3%) ක්ම සමාජ මාධ්‍ය ආශ්‍රිතව සිදු වී ඇත.

වර්ෂ 2010 සිට 2017 දක්වා කාල පරාසය තුළ අප රටෙහි සයිබර් ආරක්‍ෂාවට තර්ජනයක්වූ සිදුවීම්වල 4500% ක ඉහළ යාමක් වාර්තා වී ඇත [5]. වසර 2010 සිට 2017 දක්වා ශ්‍රී ලංකාව තුළ සයිබර් ආරක්‍ෂාවට තර්ජනයක්වූ සිදුවීම් සම්බන්ධයෙන් වාර්තා වුණු සිද්ධීන් ගණන පහත ප්‍රස්ථාර දෙක ඇසුරින් දක්වා ඇත. (3.3 රූපසටහන 1 සහ 2)




3.3 රූප සටහන - 1

සයිබර් ආරක්‍ෂාවට තර්ජනයක්වූ සිද්ධීන් සමාජ මාධ්‍ය සම්බන්ධ නොවූ




3.3 රූප සටහන - 2

සයිබර් ආරක්‍ෂාවට තර්ජනයක්වූ සමාජ මාධ්‍ය සම්බන්ධ වූ සිද්ධීන්

2017 වසරේ සයිබර් ආරක්ෂාවට තර්ජනයක් වූ සමාජ මාධ්‍ය සම්බන්ධිත සිද්ධීන් (සිද්ධීන් 3685) හි වර්ගීකරණය පහත දක්වා ඇත.




3.3 රූප සටහන - 3

- අන්තර්ජාලය භාවිත කරන ශ්‍රී ලාංකිකයන්ගෙන් 35% ක් සිය සියලුම ගිණුම් සඳහා එකම මුරපදය (Password) භාවිත කරයි[5].
- ශ්‍රී ලාංකික අන්තර්ජාල පරිශීලකයන්ගෙන් 31% ක් ස්වකීය මුරපද (Password) සෙවුම් මෙවලම් (Browsers) තුළ තැන්පත් (Save) කර තබයි[5].
- අන්තර්ජාලය භාවිත කරන ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාවෙන් 43% ක් නොදන්නා මිතුරු අයදුම් (friend requests from unknown) අනුමත කරයි. ඔවුන්ගෙන් 33% ක් එවැනි අනුමත කිරීම් නිසා අනර්ථකාරී තත්ත්වයන්ට මුහුණදී ඇත[5].

## 3.4 සයිබර් අවකාශය තුළ ළමයින්ගේ ආරක්ෂාව

ශ්‍රී ලංකාව තුළ අන්තර්ජාලය භාවිත කරන ළමයින්ගෙන් (Online users) සැලකිය යුතු ප්‍රමාණයක් අවදානම් සහගත හැසිරීම් වල යෙදෙන බව පහත දත්ත අනුව අවබෝධ කරගත හැකිය[6].

| හැසිරීමේ ස්වභාවය | සමස්තය |  |  |
|---|---|---|---|
| අන්තර්ගතය (Content)<br>අසභ්‍ය යැයි සම්මත පණිවිඩ, වීඩියෝ, ඡායාරූප යැවීම/අන්තර්ජාලයට මුදා හැරීම | 10.7% | 11.9% | 7.3% |
| **හැසිරීම පහත සඳහන් (Conduct)ක්‍රියාවන් හතරෙන් එකක්** | 24.7% | - | - |
| තම වයස පිළිබඳ සත්‍ය වසන් කිරීම | 13.1% | 14.4% | 9.3% |
| අසත්‍ය තොරතුරු භාවිත කරමින් සමාජ මාධ්‍ය පරිශීලනය | 16.7% | 18.6% | 11.6% |
| පිටස්තර අයගේ මුරපද භාවිත කර ඔවුන්ගේ ගිණුම්වලට ඇතුළු වීම | 5.1% | 5.7% | 3.5% |
| තවත් අයෙකුගේ මනෝ භාවයන්ට/හැඟීම්වලට වේදනා ඇතිවන හෝ අප්‍රිය ජනක පණිවිඩ යැවීම | 24.8% | 27.4% | 17.6% |
| **සබඳතා පැවැත්වීම (පහත සඳහන් ක්‍රියාවන්(Contact) තුනෙන් එකක්)** | 41.3% | - | - |
| ආගන්තුක පුද්ගලයන් විසින් කතා බහ (chat) කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් පිළිගැනීම | 21.9% | 24.6% | 14.4% |
| ආගන්තුක පුද්ගලයින් සමග ඡායාරූප හුවමාරු කර ගැනීම | 14.3% | 17.2% | 6.3% |
| ආගන්තුක පුද්ගලයින් සමග ස්වකීය පුද්ගලික තොරතුරු හුවමාරු කර ගැනීම | 8.0% | 9.3% | 4.5% |
| වාණිජ කටයුතු සඳහා (Commerce) - අන්තර්ජාලය මගින් අයථා මිලදී ගැනීම් (Inappropriate Online Shopping) සිදුකිරීම | 30.9% | 35.4% | 18.5% |
| අධික භාවිතය (Excessive Use) - දිනකට කිහිප වතාවක් අන්තර්ජාලය පරිශීලනය කිරීම | 28.7% | 34.0% | 13.7% |

3.4 වගුව - 1

අන්තර්ජාලය ඔස්සේ මුලින් හමුව පසුව ඒ අය සමග මුහුණට මුහුණ හමු වුණු ළමා අන්තර්ජාල පරිශීලකයන්ගේ (Online users) ප්‍රතිශතය 27.9% කි. තවත් 25.2% ක් ළමුන් එවැනි හමුවීම් සඳහා අපේක්ෂාවෙන් සිටියහ. අන්තර්ජාලය ඔස්සේ මුලින් හමුව පසුව මුහුණට මුහුණ ආගන්තුකයින් හමුවන ළමයින්ගෙන් 18.3% ක් එසේ සිදු කර ඇත්තේ කිසිවෙකුටත් නොදන්වමිනි. තවත් 36.3% ක් මිතුරෙකුට පමණක් තම හමුව පිළිබඳව දැනුවත් කර තිබුණි[6]. (3.4 රූප සටහන - 1)

| අනුගමනය කළ පියවර | සමස්තය | | |
|---|---|---|---|
| කිසිවකුටත් දන්වා නැත | 18.3% | 18.2% | 19.2% |
| මිතුරෙකුට පවසා ඇත | 36.3% | 38.1% | 24.0% |
| පවුලේ අයෙකුට පවසා ඇත | 32.4% | 33.0% | 28.0% |
| වෙනත් | 13.0% | 10.7% | 28.8% |
| එකතුව | 100% | 100% | 100% |

3.4 රූප සටහන - 1

| තොරතුරු ලබාගත් මූලාශ්‍රය | සමස්තය | | |
|---|---|---|---|
| කිසිදු මූලාශ්‍රයක් පිළිබඳ නොදන්නා | 10.5% | 11.3% | 8.5% |
| පාසැල් ගුරුවරුන්ගෙන් සහ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන වලින් | 11.5% | 6.7% | 25.0% |
| දෙමව්පියන්ගෙන් | 23.6% | 18.4% | 38.0% |
| සහෝදර සහෝදරියන්ගෙන් | 34.7% | 31.5% | 43.6% |
| යහළුවන්ගෙන් | 41.0% | 46.4% | 26.1% |
| ජන මාධ්‍යවලින් (රූපවාහිනි, රේඩියෝ,පුවත්පත්) | 24.0% | 24.9% | 21.4% |
| වෙබ් අඩවිවලින් | 18.0% | 21.2% | 9.1% |

3.4 රූප සටහන - 2

බොහොමයක් සමාජ මාධ්‍ය ජාලා ස්වකීය පරිශීලකයන්ගේ පුද්ගලිකත්වය (Privacy) තහවුරු කර ගැනීම පිණිස විකල්ප යෙදවුම් (Options) අවස්ථා ලබා දී ඇත. එයට හේතුව එම සමාජ මාධ්‍ය ජාලා පවතින තත්ත්වයෙන්ම (Default) භාවිත කළහොත් එම යෙදවුම් තුළ පවතින ආරක්ෂණ විධි විධානයන් හා ක්‍රමෝපායන් (Privacy settings) අවම මට්ටමක පැවතීමයි. අන්තර්ජාලය පරිශීලනය කරන ළමයින්ගෙන් (Online users), ආසන්න වශයෙන් පිරිමි ළමයින් හතර දෙනෙකුගෙන් එක් අයෙකු හා ගැහැනු ළමයින් තුන් දෙනෙකුගෙන් එක් අයෙක් මේ විධිවිධානයන් පිළිබඳව කිසිවක් දැන නොසිටියහ. 8% දෙනෙකු පමණ මේ පිළිබඳ දැන සිටියත් අවශ්‍ය වෙනස් කිරීම් සිදු කරන ආකාරය පිළිබඳ ඔවුන් අවබෝධයකින් නොසිටියහ[6].

අන්තර්ජාල සුරක්ෂිතතාවය (Online Security) පිළිබඳව තොරතුරු ලබා ගත හැකි විශ්වසනීය මූලාශ්‍රයන් පිළිබඳව අන්තර්ජාල පරිශීලනය කරන ළමයින්ට (Online users) නිසි අදහසක් නොතිබුණි. මෙම පසුබිම තුළ මෙම ළමයින්ගෙන් බහුතරයක් විශ්වාසය තබා තිබුණේ ස්වකීය සහෝදර සහෝදරියන්ගේ හා මිතුරන්ගේ උපදෙස් මතය. එම අගයන් පිළිවෙලින් 34.7% ක් හා 41% ක් විය[6]. (**3.4 රූප සටහන - 2**)

අන්තර්ජාලය පරිශීලනයේ දී වින්දිතභාවයකට පත් වුවහොත් අවශ්‍ය සහාය සඳහා යොමු විය යුතු ආයතන හා බලධාරීන් පිළිබඳ අන්තර්ජාල පරිශීලනය කරන ළමයින් (Online users) සතු අවබෝධය ඉතාමත් දුර්වල මට්ටමක පැවතුණි. ළමයින්ගෙන් 83.7% ක්ම අන්තර්ජාල ආශ්‍රිත ගැටලුවක් ඇති වුවහොත් ඒ පිළිබඳ වාර්තා කළ යුත්තේ කා හටද යන්න පිළිබඳව දැනුවත් භාවයකින් නොසිටියහ. වාර්තා කළ හැකි වගකිව යුතු ආයතන නම් කිරීමට නිශ්චිතව දැන සිටියේ 2.6% ක් පමණි[6].

## මූලාශ්‍ර


1. International Organization for Standardization. ISO/IEC 27032:2012(en) Information technology — Security techniques — Guidelines for cybersecurity [Internet]. [cited 18th June 2019]. Available from: https://www.iso.org/obp/ui/#iso:std:iso-iec:27032:ed-1:v1:en

2. We Are Social(2019). DIGITAL 2019 - ESSENTIAL INSIGHTS INTO HOW PEOPLE AROUND THE WORLD USE THE INTERNET, MOBILE DEVICES, SOCIAL MEDIA AND E-COMMERCE [Internet]. Available from : https://wearesocial.com/global-digital-report-2019

3. We Are Social (2019). DIGITAL 2019 - GLOBAL DIGITAL YEARBOOK : ESSENTIAL DIGITAL DATA FOR EVERY COUNTRY IN THE WORLD [Internet]. Available from : https://datareportal.com/reports/digital-2019-global-digital-yearbook

4. Sri Lanka CERT|CC (2017). Youth Survey on Social Media Security and Privacy [Internet]. Available from : https://www.cert.gov.lk/Downloads/YourthSurvey2018.pdf

5. Sri Lanka CERT|CC (2018). Information and Cyber Security Strategy of Sri Lanka 2019 - 2023 [Internet]. Available from : https://www.cert.gov.lk/Downloads/NCSStrategy.pdf

6. United Nations Children's Fund (UNICEF) (2017). KEEPING CHILDREN IN SRI LANKA SAFE AND EMPOWERED ONLINE [Internet]. Available from : https://www.unicef.org/srilanka/media/281/file/Digital%20landscape%20study.pdf

7. Database of Top Sites Accessed in Sri Lanka – eNovation4D Ltd

# අවදානම හඳුනාගනිමු

## පියවර 4



## 4.1 අන්තර්ජාලය තුළ ඇති අවදානම්කාරී තත්ත්වයන්



අන්තර්ජාලය අධ්‍යාපනික, සමාජීය වශයෙන් තරුණ ප්‍රජාව වෙත බොහෝ ප්‍රයෝජනවත් වන නමුත් අවාසනාවන්ත ලෙස අවදානම්කාරී වන අවස්ථාද ඇත. ස්වකීය ජීවිතය හා සම්බන්ධ බොහෝ කාරණාවලට අදාළව ළමයින් හා තරුණයින් අවදානමට ලක්වීමේ සම්භාවිතාවය සාපේක්ෂව වැඩිය. දැනුවත්ව හෝ නොදැනුවත්ව මොවුන් අන්තර්ජාලය, සමාජ මාධ්‍ය හා ජංගම දුරකථන වැනි ඩිජිටල් තාක්ෂණය හා සම්බන්ධ උපාංග භාවිත කරද්දී නොයෙකුත් අවදානම්කාරී තත්ත්වයන්ට මුහුණ දෙයි.

ඉහත සඳහන් කළ පරිදි අන්තර්ජාලය යෞවනයන්ට ප්‍රයෝජනවත් වුවත් ක්ෂණික පණිවිඩ හුවමාරුව, කථාබහ කිරීමේ අවකාශ (**Chat Rooms**), විද්‍යුත් තැපැල, සමාජ මාධ්‍ය ජාලා බොහෝ විපත් වලට මග පාදයි. එය සයිබර් අවකාශය තුළ සිදු කරන හිංසනයේ සිට ලිංගික අපයෝජනය දක්වා ප්‍රබල විය හැකිය.

**අවදානම හා හානිය යනු කුමක්ද?**

ළමයෙකු යතුරුපැදියක් පැදීමට හෝ පිහිනීමට පුරුදු පුහුණු වන අවස්ථාවක් උදාහරණයට ගනිමු. මේ අවස්ථා දෙකෙහිදී ම ළමයෙකුට හානියක්-අනතුරක් වීමට අවදානමක් ඇති බව පැහැදිලි කරුණකි. තත්ත්වය එසේ වුවත් වැඩිහිටියන් විසින් සිදු කරන්නේ ළමයෙකු පා පැදිය පැදීමෙන් හෝ පිහිනීමෙන් වළක්වනවාට වඩා හානියක්- අනතුරක් සිදුවීම අවම වන පරිද්දෙන් අදාළ පුහුණුව ලබා ගැනීමට අවශ්‍ය වටපිටාව හා සහයෝගය ලබා දීමයි.

මෙම සරල උදාහරණය තුළ පැහැදිලි වන සිද්ධාන්තය වන්නේ අවදානම අනිවාර්යයෙන්ම හානියකට මග නොපාදන බවයි. නමුත් එය නිසි ලෙස පාලනය නොකළහොත් අනතුරක් සිදුවීමේ සම්භාවිතාවය- ඉඩකඩ ඉහළ යා හැකි බවයි.
මේ අනුව පැහැදිලි වන්නේ ළමයෙකු අන්තර්ජාලය භාවිත කරන විට කිසියම් අවදානමක් තිබුණද අනිවාර්යයෙන්ම හානියකට මගපාදනු ඇතැයි යන නිගමනයට එළඹීමට නොහැකි බවයි.

ප්‍රතිපත්තිමය - ක්‍රමෝපායික මට්ටමේදී හා ක්‍රියාත්මක තලයේදී සලකා බැලිය හැකි කරුණක් වශයෙන් ළමයින් අන්තර්ජාලය තුළ මුහුණ දෙන හානිවලට හේතුවිය හැකි සියලුම අවදානම්කාරී තත්ත්වයන් වළක්වාලිය නොහැකි නමුත් ළමයින් හා යෞවනයින් එවැනි තත්ත්වයන්ට මුහුණ දීමට සූදානම් කිරීම වඩා හොඳ විසඳුමක් වනු ඇති බවයි. ඒ සමගම ප්‍රතිපත්ති හා ක්‍රමෝපායික මට්ටමේදී ඉහළ ගණයේ අවදානම් හරහා ඇතිවිය හැකි හානි අවම කිරීමට අවශ්‍ය සම්පත් හා ක්‍රමවේද යෙදවීම සිදුකළ යුත්තකි.

## 4.2 සයිබර් අවකාශය හා එහි ළමයින්ට ඇති අවදානම වඩා සංකීර්ණ වන්නේ ඇයි?



අද වන විට ළමයා නිවස, පාසල, මගතොට, ආගමික ස්ථාන වැනි භෞතික ස්ථානවල සැරිසරන්නාක් මෙන්ම, භෞතික අවකාශයක් නොවන සයිබර් අවකාශයේද නිරන්තරව සැරිසරයි. භෞතික අවකාශයන් හා සාපේක්ෂව ගත් කළ පහත ලක්ෂණ හේතුකොට ගෙන සයිබර් අවකාශය හා එහි ළමයින්ට ඇති අවදානම වඩාත් සංකීර්ණ යැයි පැවසීම අතිශයෝක්තියක් නොවේ.

**1. ළමුන් වෙත සමීපවීමේ පහසුව**

සයිබර් අවකාශය කලින් එකිනෙකා නොදන්නා අය අතර සමීප චිත්තවේගීය හා මානසික සම්බන්ධතා සඳහා පහසුකම් සපයයි. ඔවුන් භෞතික ලෝකයේ දුරස්ථ විය හැකි වුවත්, සයිබර් අවකාශයට "සමීපතාවය" පිළිබඳ හැඟීමක් ලබාදිය හැක. භෞතික පරිසරය තුළ, අපයෝජනයකදී විශාලතම අවදානම ඇත්තේ දරුවෙකුගේ ආසන්නතම සමාජ කවයෙන් වුවද, සයිබර් අවකාශයේ දී දරුවාට කිසි විටෙකත් මුහුණට මුහුණ හමු නොවූ අයෙකුගෙන් අපයෝජනයක් සිදුවිය හැකිය. සයිබර් අවකාශය භූගෝලීය හෝ දේශසීමා වලින් බැඳී නොමැත. සයිබර් අපයෝජනයකදී අපයෝජකයා සහ වින්දිතයා යන දෙපාර්ශවය වෙනස් අධිකරණ බල ප්‍රදේශවල සිටින තත්ත්වයක දී, අපරාධ විමර්ශකයන්ට විවිධ අභියෝගයන්ට මුහුණ දීමට සිදුවේ.

**2. ළමුන් සමඟ සබඳතා ගොඩනගා ගැනීමේ පහසුව**

සයිබර් අවකාශය වැඩිහිටි අධීක්ෂණයෙන් බැහැරව දරුවන් සමඟ සම්බන්ධ වීමට හා අන්තර්ක්‍රියා කිරීමට අපයෝජකයන්ට අවස්ථාව ලබා දෙයි. වගකිවයුතු වැඩිහිටියන් රැඳී සිටින නිවස හෝ පාසල වැනි භෞතික අවකාශ වලදී මෙය එතරම් පහසුවෙන් කළ නොහැක. නුසුදුසු වෙබ් අඩවි, ළමයින් ලිංගික අපයෝජනයන්ට ලක්වන පින්තූර, වැඩිහිටි කාමුක දර්ශන සහ වැඩිහිටි-ළමා ලිංගික සම්බන්ධතා සාමාන්‍යයැයි සාධාරණීකරණය කිරීමට උත්සාහ කරන ප්‍රකාශ වෙත ද පහසුවෙන් ළමුන්ට ප්‍රවේශ විය හැකිය.

**3. සබඳතාවල අධික වේගය**

සයිබර් අවකාශය තුළ අධික වේගයකින් දත්ත (වචන, ඡායාරූප, වීඩියෝ, හඬපට) සම්ප්‍රේෂණය වන අතර අන්තර්ක්‍රියා සිදු වීමද සබඳතා වර්ධනය වීම ද ශීඝ්‍රයෙන් සිදුවෙයි. නිර්නාමිකත්වය හා මෙය සැබෑ ලෝකය නොවේය (Online ක්‍රියාවලියක් පමණි) යන හැඟීම් හරහා මෙම සයිබර් සබඳතා වඩාත් වේගයකින් වඩාත් ලිංගකත්වය වෙත නැඹුරුව ගොඩනැගීම දැකිය හැක. මෙම අධික වේගය හා සයිබර් අවකාශයේ සිදුවන නිරන්තර වෙනස්වීම් අපරාධ විමර්ෂණ හා ආවේක්ෂණ ක්‍රියාවලීන්ට මහත් අභියෝගයක් බවට පත්ව ඇත.

**4. අනන්‍යතාව වසන් කිරීමේ හැකියාව**

සයිබර් අවකාශයේ සමහරවිට මිනිසුන්ට අඩුවෙන් වගකීමක් හා වගවීමක් දැනේ. ආවේක්ෂණ ක්‍රමවේද නොමැති යැයිද එබැවින් අනන්‍යතාව වසන්කොට ක්‍රියා කිරීම සිදු කළ හැක්කක්යැයි ද අදහසක් ඇතමුන් තුළ පවතී. මෙම තත්ත්වය ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී හා ළමුන්ව පොළඹවා ගැනීමට කටයුතු කිරීමේදී අපයෝජකයන් තුළ දැකිය හැක. අනෙක් අතට ළමයින්ද විවිධ ව්‍යාජ අනන්‍යතා ගොඩනගා ගෙන අවදානම් සහගත හැසිරීම්වල යෙදීම සිදුවේ. සයිබර් අවකාශයේ ක්‍රියා සැබෑ ලොව තුළ සිදු නොවන්නක් යැයි ද එම නිසා භෞතික ලෝකයේ ප්‍රතිවිපාක නොලැබේ යැයිද යන අදහස සමඟ නිර්නාමිකත්වය පිළිබඳ අදහස ළමයින්ට සහ තරුණයින්ට දැනිය හැක. මෙම අදහස් නිසා පුද්ගලයින් භෞතික ලොව තුළ සිදු නොකරන අනර්ථ ක්‍රියාදාමයන් සයිබර් අවකාශය තුළ සිදුකළ හැක.

**5. විශාල ප්‍රජාවකට නිරාවරණය වීම**

සයිබර් අවකාශයේ පුළුල් ස්වභාවය සහ ඒ තුළ ඇති වෙබ් අඩවි නැරඹීමට පැමිණෙන විශාල පිරිස හේතුවෙන්, මෙම සන්දර්භය තුළ දරුවෙකුට හෝ තරුණයෙකුට සිදුවන හානිය සුවිශාලය. වින්දිතයා මුහුණ දෙන අපයෝජන ක්‍රියා දාමයන් අති විශාල ප්‍රජාවකට නිරාවරණය විය හැකිය. දරුවෙකුගේ මුද්‍රිත අපයෝජන ඡායාරූපයක් හෝ ද්වේෂ සහගත වාචික/මුද්‍රිත ප්‍රකාශයක් සඳහා ඇතැම් විට භෞතික ලෝකය තුළ සීමිත සංසරණයක් තිබිය හැකිය. නමුත් අන්තර්ජාලය තුළට එබඳු අපයෝජන ඡායාරූපයක් හෝ ද්වේශ සහගත ප්‍රකාශනයක් එක් වුවහොත්, එය සුවිශාල ප්‍රජාවක් වෙත දීර්ඝ කාලයක් තිස්සේ සංසරණය වීමේ අවදානම අතිශය ඉහළය.

**6. අපයෝජකයන් සඳහා පුළුල් අවකාශ සැළසීම**

සයිබර් අවකාශය; අපයෝජන-අභිප්‍රාය ඇති වැඩිහිටියන්ට, විශාල ළමයින් සංඛ්‍යාවක් වෙත ප්‍රවේශ වීමට මෙන්ම අතිවිශාල ළමා අපයෝජන ප්‍රකාශන සංචිතයකට ද අසීමිත අවකාශ සපයයි. මෙවැනි ළමා අපයෝජන ප්‍රකාශන වැඩිවශයෙන් අන්තර්ජාලය හරහා සංසරණය වීමෙන්, කලින් මේවා වෙත ආකර්ෂණය නොවූ වැඩිහිටියන් ද එබඳු දෑ සඳහා ආකර්ෂණය වීමේ වැඩි සම්භාවිතාවක් පවතී. භෞතික ලෝකයේ නිර්මාණය කිරීමට අපහසු කල්ලි නිර්මාණය කිරීමට සයිබර් අවකාශය පහසුකම් සපයයි. මෙම සන්දර්භය තුළ ළමා අපයෝජනාත්මක අදහස් ඇත්තවුන්ට තම අදහස් හා ප්‍රකාශන සඳහා මේ කල්ලි හරහා වලංගුතාවක් හා පිළිගැනීමක් ඇතිවේ.



**7. අපයෝජන ප්‍රකාශන සයිබර් අවකාශයෙන් ඉවත් කිරීමේ අපහසුව**

සයිබර් අවකාශයේ පළ කර ඇති දේ ඉවත් කිරීම ඉතා දුෂ්කර කාර්යයකි. වින්දිතයන්ට මෙය දැඩි බලපෑමක් ඇති කරන තත්ත්වයකි . කවුරුන් විසින් කුමන මොහොතක තමාගේ වින්දිතභාවයට අදාළ ප්‍රකාශන දකිනු ඇද්දැයි ඔවුන් දැඩි කාංසාවකින් පසුවීම දැකිය හැක. සයිබර් අවකාශයෙන් දැඩි පරිශ්‍රමයකින් ඉවත් කළ ප්‍රකාශනයක් වුවද වසර ගණනාවකට පසු එම ප්‍රකාශන බාගත කළ අයෙකු විසින් නැවත එක් කිරීමද සිදුවිය හැක්කකි.

ක්‍රියාවන් හා ප්‍රකාශනවල විපාක හඳුනා ගැනීමේදී, ඇතැම් විට භෞතික අවකාශය තුළ අවධානය යොමුකරනවාට වඩා ලිහිල් තත්ත්වයක් සයිබර් අවකාශය වෙත ලබා දෙනු දැකිය හැකිය. නමුත් අප තේරුම්ගත යුත්තක් වන්නේ භෞතික අවකාශය තුළ අපට වින්දිතයකුගේ තත්ත්වය මැන ගැනීමට අපගේ සියලු සංවේදන යොදා ගත හැකිවුවද, සයිබර් අවකාශය තුළ එම හැකියාව අවම විය හැකි බවයි . සයිබර් අවකාශය තුළ ඇතැමෙක් මේ නිසා තම හැඟීම් දැනීම් වලින් ඉවත්වූ අමානුෂික හා අතාත්වික හැසිරීම්වල යෙදීම දැකිය හැක.

භෞතික අවකාශයන්වලදී මෙන්ම සයිබර් අවකාශයේ ද ළමයින් අවදානමට ලක්වන බව වටහාගත යුතුය. ළමයෙකු අපයෝජනයට ලක්වන පාසල, නිවස, මග තොට, ආගමික ස්ථාන, සුරකුම් මධ්‍යස්ථාන වැනි භෞතික ස්ථානවලට අමතරව අද වන විට සයිබර් අවකාශය නැමැති භෞතික නොවන අවකාශය ද එක්ව ඇත. අනෙක් භෞතික අවකාශ හා සන්සන්දනය කළ විට ඉහත ලක්ෂණ හේතුවෙන් සයිබර් අවකාශය තුළ ඇති අවදානම වඩාත් සංකීර්ණ බව වටහා ගැනීම වැදගත්ය.



## 4.3 අන්තර්ජාලය ආශ්‍රිතව ළමයෙකුගේ සබඳතාව, ක්‍රියාකාරීත්වය හා අවදානම

පහත වර්ගීකරණයට අනුකූලව අන්තර්ජාලය ආශ්‍රිතව ළමයකුගේ සබඳතාව, ක්‍රියාකාරීත්වය මෙන්ම ඉන් ඇතිවන අවදානම වටහා ගැනීමේ පහසුව සඳහා මෙසේ ගොනුකර ඇත.*

1. අන්තර්ගතයේ අවදානම (Content Risk) - මහා පරිමාණ නිෂ්පාදනවල ග්‍රාහකයෙකු ලෙස (Recipient of mass- produced content)
2. සම්බන්ධතාවල අවදානම (Contact Risk) - සමවයස් කණ්ඩායම් හෝ වැඩිහිටියන් ආරම්භ කළ ක්‍රියාදාමයක සහභාගීවන්නකු ලෙස (Participant in peer or adult initiated interaction )
3. හැසිරීමේ අවදානම (Conduct Risk) - අවදානම් සහගත අන්තර්ගත නිෂ්පාදනය කරන හා අවදානම් සහගත සබඳතා පවත්වන්නා ක්‍රියාකාරකයකු ලෙස (Actor contributes in producing risky content and contact )

| අවදානම / අවදානම් ස්වරූප | අන්තර්ගතය (Content) | සම්බන්ධය (Contact) | හැසිරීම (Conduct) |
|---|---|---|---|
| ආක්‍රමණශිලී Aggressive | ■ ප්‍රචණ්ඩකාරී කෲර (දරුණු) අන්තර්ගතයන් (violent/gory content | ■ හිරිහැර කිරීම් (harassment)<br>■ සයිබර් අවකාශය හරහා හඹා යෑම් (stalking) | ■ හිරිහැර කිරීම් (bullying)<br>■ සම වයස් කණ්ඩායම්වල විරුද්ධ ක්‍රියාකාරකම් (hostile peer activity) |
| ලිංගික Sexual | ■ කාමුක අන්තර්ගතයන් (pornographic content) | ■ ආගන්තුකයන් හමුවීම හරහා ලිංගික අපයෝජනය ( sexual abuse on meeting strangers)<br>■ ලිංගිකමය පෙළඹවීම (grooming) | ■ ලිංගික අඩන්තේට්ටම් (sexual harassment)<br>■ ලිංගිකමය කෙටි පණිවිඩ (sexting) |
| අගයන් values | ■ ජාතිවාදී/ වෛරී අන්තර්ගතයන් (racist/hateful content) | ■ දෘෂ්ටිවාදාත්මක ඒත්තු ගැන්වීම (ideological persuasion) | ■ හානිකර විය හැකි තමා විසින්ම ජනනය කළ අන්තර්ගතයන් (potentially harmful user – generated content) |
| වාණිජ commercial | ■ වෙළඳ දැන්වීම් (advertising)<br>■ කාවැද්දූ අලෙවිකරණය (embedded marketing) | ■ පුද්ගලික දත්ත සූරාකෑම සහ අනිසි භාවිතය (personal data exploitation and misuse)<br>■ වාණිජ හා මූල්‍ය වංචාවලට ලක්වීම (commercial & financial scams) | ■ ප්‍රකාශන අයිතිය උල්ලංඝනය (copyright infringement)<br>■ අන්තර්ජාලය හරහා සූදුව (online gambling)<br>■ අයථා වෙළඳාම්වල යෙදීම (illegal trade) |

### 1. අන්තර්ගතයේ ඇති අවදානම - ළමයින් මහා පරිමාණ නිෂ්පාදනවල ග්‍රාහකයන් ලෙස

- වයසට නුසුදුසු හෝ ව්‍යාජ අන්තර්ගතයන් දරුවන්ට ලබා ගත හැකි වීම.
- සාවද්‍ය හෝ නොමග යවනා සුළු තොරතුරු වලට නිරාවරණය වීම.
- ප්‍රචණ්ඩත්වයට, වෛර කිරීමට හෝ නොඉවසීමට හේතු විය හැකි කරුණු අඩංගු දේ සඳහා නිරාවරණය වීම.
- නීති විරෝධී කරුණු අඩංගු දේ සඳහා නිරාවරණය වීම.
- බාල වයස්කරුවන් සඳහා නුසුදුසු වාණිජ වෙළඳ දැන්වීම් වලට නිරාවරණය වීම.

*මූලාශ්‍රය :-EU Kids Online (Livingstone, Haddon, Görzig, & Ólafsson, 2010)
මෙවැනි වර්ගීකරණයන් කිහිපයක් මෙම විෂය ආශ්‍රිතව ඉදිරිපත් වී ඇති අතර, අන්තර්ජාලය තුළින් වැඩිදුර තොරතුරු ඔබට ලබාගත හැකිය.

සමහර අන්තර්ජාල අන්තර්ගතයන් ළමයින්ට සුදුසු නොවන අතර එය හානිකර විය හැක. සමාජ ජාලා, අන්තර්ජාලය හරහා සිදුකරන ක්‍රීඩා, බ්ලොග් සහ වෙබ් අඩවි හරහා ප්‍රවේශ වන හා නරඹන ඇතැම් අන්තර්ගතයන් සඳහා මෙය අදාළය. ළමුන් අන්තර්ජාලයේ සඳහන් කර ඇති අන්තර්ගතයන් සලකා බැලීමේදී එහි ඇති කරුණු වල සත්‍යතාවය හෝ පක්ෂග්‍රාහීත්වය විමසිය යුතු බව දැන සිටිය යුතුය. මේ ආකාරයෙන් දරුවන් අන්තර්ජාලයේ සඳහන් කර ඇති අන්තර්ගතයන් තක්සේරු කිරීමට ආරම්භ කරන විට ඔවුනට ඔබගේ උපකාරය අවශ්‍ය විය හැකිය. එසේම කතෘගේ අවසරය ලබා නොගෙන, ප්‍රකාශන හිමිකම සහිත අන්තර්ගතයන් භාවිතා කිරීම හෝ බාගත කිරීම සඳහා නීතිමය ප්‍රතිවිපාක ඇතිවිය හැකිය.

2. සම්බන්ධතා අවදානම - වැඩිහිටියන්/සමවයස් කණ්ඩායම් ආරම්භකළ ක්‍රියාදාමයක ළමයින් සහභාගිවන්නන් ලෙස

- හිරිහැර කරන්නන් හා ළමයින් අපයෝජනය කිරීමට උත්සාහ දරන පුද්ගලයින් ළමුන්ව සයිබර් අවකාශය හරහා සම්බන්ධ කරගත හැකිය.
- සන්නිවේදන තාක්ෂණයන් භාවිත කිරීම තුළින් ළමුන්ව පොළඹවා ගැනීම හරහා ලිංගිකමය හා අනෙක් අඩන්තේට්ටම්වලට ලක්වීම සිදුවිය හැක.
- ළමයින් වාණිජ හා මූල්‍ය වංචාවලට ලක්වීම.
- ළමයින්ගේ පුද්ගලික තොරතුරු හෙළිදරව්වීම.

ඇතැම්විට අන්තර්ජාලය හරහා හමුවන නව මිතුරන් ඔවුන් විසින් පවසන පුද්ගලයා විය නොහැකි බවත්, ඔවුන් ඔබගේ අන්තර්ජාල ගිණුමට සම්බන්ධ කරගත් පසු ඔබගේ පුද්ගලික තොරතුරු හුවමාරු විය හැකි බවත් දරුවන් තේරුම් ගැනීම වැදගත්වේ. මිතුරන්ගේ ලැයිස්තු නිතිපතා පරීක්ෂා කිරීම සහ අනවශ්‍ය මිතුරු සම්බන්ධතා ඉවත් කිරීම ප්‍රයෝජනවත් පියවරකි. රහස්‍යතා සැකසුම් (Privacy settings) මගින් ද ඔබගේ තොරතුරු අනාවරණය සීමා කිරීමේ හැකියාව ඇත.

3. හැසිරීමේ අවදානම - ළමයින් අවදානම් සහගත අන්තර්ගත නිෂ්පාදන කරන හා අවදානම් සහගත සබඳතා පවත්වන ක්‍රියාකාරකයන් ලෙස

- ළමයින් ඔවුන්ගේ හැසිරීම නිසා අවදානමට ලක්විය හැකිය, නිදසුනක් වශයෙන්, ඔවුන්ගේ සම්පූර්ණ නම, වයස, ලිපිනය, විද්‍යුත් ලිපිනය, දුරකථන අංකය, විනෝදාංශ, ඔවුන්ගේ පාසලේ නම යනාදී තොරතුරු අන්තර්ජාලයෙන් හමුවන පුද්ගලයන් සමග අසීමිතව බෙදා ගැනීමෙන්.
- ළමයින් අන්තර්ජාලය හරහා සූදුවට යොමුවීම
- වෙනත් අයවළුන් අන්තර්ජාලය හරහා හිරිහැර කිරීම්වලට ලක්කිරීම
- කතෘ හිමිකම සහිත තොරතුරු ළමයින් විසින් බාගත කිරීම්
- සොරකම් කළ භාණ්ඩ, අවි ආයුධ හා මත්ද්‍රව්‍ය අන්තර්ජාලය හරහා ළමයින් විසින් අලෙවිය
- වෛරී/අන්තවාදී වෙබ් අවකාශවල ක්‍රියාකාරීන් බවට ළමයින් පත්වීම
- ළමයින් විසින් ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන හා අශ්ලීල/අසභ්‍ය ප්‍රකාශන නැරඹීම, අත්පත් කර ගැනීම, නිෂ්පාදනය, හුවමාරුව හා බෙදාහැරීම

තම අන්තර්ජාල ක්‍රියාකරකම් හේතුවෙන් තමාට හා අනෙකුත් පුද්ගලයින් කෙරෙහි ඇති කළ හැකි බලපෑම් පිළිබඳවත් අන්තර්ජාලය තුළ තම අනන්‍යතාව පිළිබඳවත් ළමයින් විසින් සැලකිලිමත් විය යුතුය. සමහර යෞවනයන් ඩිජිටල් තාක්ෂණය භාවිත කරන අතරතුර නුසුදුසු සමාජ විරෝධී හෝ නීති විරෝධී හැසිරීම් වලට සම්බන්ධ විය හැකිය. භෞතික ලෝකයේ මෙන්ම අන්තර්ජාලය මගින් ද කණ්ඩායම් හෝ කල්ලි සෑදිය හැකිය. අන්තර්ජාලය තුළ ව්‍යාජ නමකින් පෙනී සිටීමට ද හැකිය. දරුවන් ඔවුන් පිළිබඳව තොරතුරු සොයාබැලීමට හා එම දත්ත හුවමාරු කරගැනීමට හැකියාව ඇත්තේ කවුරුන්ටදැයි දැනුවත් වී සිටීම වැදගත් වේ. අන්තර්ජාලය භාවිත කිරීමේදී තමන්ගේ පෞද්ගලික තොරතුරු ආරක්ෂිතව තබාගැනීම සහ එය ආගන්තුකයන් සමග හුවමාරු නොකිරීමට වගබලා ගත යුතුවේ.

තේරුම් ගැනීමේ පහසුව තකා අන්තර්ජාලය තුළ පවත්නා සබඳතා හා ක්‍රියාකාරීත්වය අනුව එහි ඇති අවදානම පහත පරිදි කාණ්ඩ ගත කළද, සැබෑ ලෝකයේ මෙය මෙසේ බෙදා වෙන්කිරීම ප්‍රායෝගික නොවනු ඇත. ළමයෙකු අන්තර්ජාලයේ සැරිසරන එක් නිමේෂයක් තුළ මේ සියලු අවදානම් අඩු වැඩි වශයෙන් පැවතීම සිදුවිය හැක්කකි.

ඉහත සඳහන් කළ විවිධ අවදානම් අතරින් ළමයින් ලිංගික අපයෝජනයේ හා සූරාකෑමේ වින්දිතයන් බවට පත්වීම, විවිධ ඇබ්බැහිවීම් හරහා කායිකව හා මානසිකව පීඩාවන්ට හා රෝගීභාවයන්ට පත්වීම මෙන් ම විවිධ තාක්ෂණිකමය අවදානම්වල ගොදුරු බවට පත්වීම සුලබව දැකිය හැකිය. මෙම අවදානම්කාරී තත්ත්වයන් පහත 4.4, 4.5 සහ 4.6 යන අනුපරිච්ඡේදයන් තුළ පිළිවෙළින් සවිස්තරාත්මකව සාකච්ඡාකොට ඇත.

## 4.4 අන්තර්ජාලය ඔස්සේ සිදුවන ළමා ලිංගික අපයෝජන සහ සූරාකෑමේ අවදානම හා එහි ස්වරූප




ඉහත පරිච්ඡේදයේදී සාකච්ඡා කළ අවදානම් අතරින් ළමා ලිංගික අපයෝජන හා සූරාකෑමේ අවදානම් මෙහිදී දීර්ඝව සාකච්ඡා කෙරේ. අධ්‍යයනයේ පහසුව සඳහා වෙන් වෙන්ව අවදානම් ස්වරූප හඳුනාගත්තද, එක් සිද්ධි අධ්‍යයනයකදී බොහෝවිට මෙම ස්වරූප ගණනාවක් දැකිය හැකිය.

### 4.4 .1 ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම පිළිබඳ ප්‍රකාශනයන් (Child Sexual Abuse Material/CSAM)

ළමා ලිංගික අපයෝජනය පිළිබඳ ප්‍රකාශනයන් (Child Sexual Abuse Material/CSAM) යනු වඩාත් බහුල වශයෙන් භාවිත වන "ළමා කාමුක දර්ශන" (Child Pornogphy) යන යෙදුම වෙනුවට භාවිත කළ හැකි වඩා යෝග්‍ය යෙදුමකි. මෙම ප්‍රකාශනයන්වල ළමයෙක්ට එරෙහිව සිදුවන ලිංගික අපයෝජනයක් සහ/හෝ ළමයෙකුගේ ලිංගික අවයව නිරූපණය කෙරේ.

ළමා ලිංගික සූරාකෑමේ ප්‍රකාශනයන් (Child Sexual Exploitation Material/CSEM) යන්න වඩාත් පුළුල් අර්ථයකින් එනම්, ළමයින්ව නිරූපණය වන සියලුම ලිංගිකමය ප්‍රකාශන හැඳින්වීමට යෙදේ. ඒ අනුව ළමා ලිංගික අපයෝජන ප්‍රකාශනයන්, ළමා ලිංගික සූරාකෑමේ ප්‍රකාශන යන පුළුල් කුලකයේ උපකුලකයකි.

සියලුම වයස් වල සිටින ළමයින්, ගැහැනු හෝ පිරිමි භේදයකින් තොරව ලිංගිකමය ආකාරයෙන් පින්තූරවල හෝ වීඩියෝ පටවල පෙනී සිටීම හේතුවෙන් වින්දිතභාවයට පත්ව ඇත. ළමුන් ලිංගිකව පෙනී සිටීමේ සිට ඉතා බරපතල ආකාරයේ ලිංගිකමය අඩන්තේට්ටම් කිරීම්වලට ලක්වීම දක්වා පරාසයක් තුළ සිදුවන දරුණු බවෙහි විවිධ වූ මට්ටම් මෙම ප්‍රකාශයන්වලට ඇතුළත් වේ.

පරිගණක හෝ ඩිජිටල් මාධ්‍යයෙන් නිෂ්පාදිත ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම පිළිබඳ ප්‍රකාශනයන් ( Computer/Digitally Generated CSAM / CSEM) යනු; පරිගණක ආශ්‍රිතව හෝ ඩිජිටල් මාධ්‍යයෙන් ජනනය කරන ලද ළමයින් සම්බන්ධ වී සිටින ලිංගික ක්‍රියාකාරකම් සහ/හෝ ලිංගිකමය ආකාරයේ නිරූපණයන් දැක්වෙන සියලුම ආකාරයේ ප්‍රකාශනයන්ය. (රූපරාමු, පින්තූර,වීඩියෝ සහ දර්ශන ආදී වූ). මෙහි විශේෂත්වය වන්නේ මෙලෙස නිෂ්පාදිත අසභ්‍ය දර්ශන හෝ වීඩියෝවල සැබෑ ළමයින්ට තාත්විකව සිදුවන සත්‍ය වූ අපයෝජනයන් ඇතුළත් නොවන අතර, ඒවායේ නිරූපණය වනුයේ සැබෑ ළමුන් ලෙස පෙනෙන ආකාරයෙන් ඩිජිටල් උපකරණ හා මෙවලම් භාවිත කර කෘත්‍රිම ලෙස නිර්මාණය කරන ලද ප්‍රකාශනයන්ය. මේවා "තාත්ත්වික නොවන ළමා කාමුක දර්ශන" (Virtual Child Phonography) ලෙස වඩාත් සුලබව හැඳින්වේ.

පරිගණක ආශ්‍රිතව නිෂ්පාදනය කරන ලද ළමා ලිංගික අපයෝජන සහ සූරාකෑම පිළිබඳ ප්‍රකාශනයන් (Computer Generated CSAM / CSEM) සැබෑ දරුවෙකුට සිදු කරනු ලබන හානියකට සම්බන්ධ නොවූවත් එය භයානක වන්නේ :

i) එය ළමුන් ලිංගිකව සූරාකෑම සඳහා පොළඹවා ගැනීමට භාවිත කළ හැකිවීම නිසයි.

ii) එය ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම පිළිබඳ ප්‍රකාශනයන් සඳහා වන වෙළඳපොල පෝෂණය කරනු ලබන නිසයි.

iii) එය ළමුන් ලිංගිකකරණය කිරීම ඉවසා සිටීමටත් සාධාරණීකරණය කිරීමටත් කටයුතු කරමින් ඒ සඳහා ඇති ඉල්ලුම වැඩි දියුණු කිරීම නිසයි.

ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ (Convention on the Rights of the Child – CRC ) එක් වෛකල්පිත ප්‍රොටෝකෝලයක් වන "ළමයින් වෙළඳාම් කිරීම, ළමයින් ගණිකා වෘත්තියේ යෙදවීම සහ ළමයින් සම්බන්ධ අසභ්‍ය අශ්ලීල ප්‍රකාශනය" සම්බන්ධ ප්‍රොටොකෝලයෙහි මෙය සාපරාධීකරණය (අර්ධ වශයෙන්) කොට ඇත. ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම පිළිබඳ ප්‍රකාශනයන් ළමයෙකු ලිංගිකව සූරාකෑමේ අභිමතාර්ථය මතම නිෂ්පාදනය, බෙදා හැරීම ප්‍රචාරණය කිරීම, ආනයනය කිරීම, අපනයනය කිරීම, විකිණීම හෝ සන්තකයේ තබා ගැනීම මෙයට ඇතුළත් වේ. ළමයින් සම්බන්ධ අසභ්‍ය අශ්ලීල ද්‍රව්‍යයන් හෝ මාධ්‍ය වෙත ප්‍රවේශ වීම සහ හුදු සන්තකයේ තබා ගැනීමක් මෙයට ඇතුළත් නොවේ. ලිංගික සූරාකෑම හා ලිංගික අපයෝජනය සම්බන්ධයෙන් ළමයින් සුරැකීමේ ECPAT පාරිභාෂික මාර්ගෝපදේශකයේ නිර්වචනය කර ඇති පරිදි "ළමා ලිංගික අපයෝජන සහ සූරාකෑම පිළිබඳ ප්‍රකාශනයන්" යන නිර්වචනයට පරිගණක හෝ ඩිජිටල් මාධ්‍යයෙන් නිෂ්පාදනය කරන ලද ප්‍රකාශනයන් ඇතුළත් කර නැත.

**වරදකරුවන් සහ අදාළවන ක්‍රියා පටිපාටීන්**

- වරද කරුවන් ඔවුන් තුළ ඇති ළමයින් සඳහාවන ලිංගිකමය කැමැත්ත හෝ ආර්ථිකමය වාසි මත මූලිකවම මෙවැනි කටයුතුවලට පෙළඹේ.
- මොවුන් තනිවම හෝ සංවිධාන ගතවී ක්‍රියාත්මක වේ.
- ඔවුන් මෙවැනි ප්‍රකාශනයන් නිෂ්පාදනයට, ඒවා වෙත ප්‍රවේශ වීමට හෝ හුවමාරු කරගැනීමට විවිධ වූ යෙදවුම් හා මෙවලම්, මෘදුකාංග සහ/හෝ අන්තර්ජාලය භාවිත කරයි.
- ඔවුන් ඔවුන්ගේ ක්‍රියාවන් සහ හැසිරීම් වසන්කිරීමට සහ ඔවුන්ව අනාවරණය වීම මඟහරවා ගැනීමට සමහරවිට රහස් කේතනය (Encryption Method) නම් වූ ක්‍රමවේදය යොදා ගන්නා අතර ඇතැම්විට වඩාත් වැඩිවශයෙන් "සැඟවුණු මාර්ගගත වේදිකාවන් " (Hidden Online Platform) භාවිත කරයි.
- වරදකරුවන් විසින් ළමයින්ව ලිංගික ක්‍රියාකාරකම්වල යොදවා ගැනීමට, ඔවුන්ව පොළඹවා ගැනීමට සහ ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය පරිදි මෙහෙයවීමට සමහර විට පරිගණක ආශ්‍රිතව නිෂ්පාදනය කරන ලද ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම පිළිබඳ ප්‍රකාශනයන් භාවිත කරයි.

අපරාධමය වරදවල්-

- ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම පිළිබඳ ප්‍රකාශනයන් නිෂ්පාදනය කිරීම.
- ප්‍රවේශය ලබාගැනීම හෝ ඒවා ගෙන්වා ගැනීම/සපයාගැනීම.
- හුදෙක් එවැනි දේ සන්තකයේ තබා ගැනීම.
- පිරිනැමීම සහ තව කෙනෙකුට ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම.
- ආනයනය හෝ අපනයනය කිරීම.
- බෙදා හැරීම, ව්‍යාප්ත කිරීම හෝ සම්ප්‍රේෂණය කිරීම.
- ලියාපදිංචි කිරීම.
- විකිණීම.

ඔබට කළහැකි දේ:-

- ළමා ලිංගික අපයෝජන සහ ලිංගික සූරාකෑම පිළිබඳ ප්‍රකාශනයන්ට අදාළ වන සියලුම ක්‍රියාකාරකම් අපරාධමය වරදක් බව හඳුනා ගැනෙන නෛතික රාමූන් වෙනුවෙන් පෙනී සිටින්න.
- ළමා ලිංගික අපයෝජන සහ ලිංගික සූරාකෑම පිළිබඳ ප්‍රකාශනයන්වලට එරෙහිව සහ වින්දිතයන් හඳුනා ගැනීම සම්බන්ධයෙන් නීතිය බලාත්මක කිරීමට අවශ්‍යවන වඩාත් සුදුසු සම්පත්වන කැපවූ ධාරිතාවන් සහිත වෘත්තිකයන්, යටිතල පහසුකම් සහ අදාළ මෙවලම් වෙනුවෙන් පෙනී සිටින්න.
- මෙබඳු දර්ශන හා වීඩියෝ වැනි මාධ්‍යයන් සංසරණය කරවීම අවහිර කිරීම සඳහා අවශ්‍යය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම උදෙසා අන්තර්ජාල පහසුකම් සපයන්නන් (Internet Service Providers) වැනි පුද්ගලික අංශ සමග සහයෝගීව කටයුතු කිරීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටීම.
- මාර්ගගත අවදානම (online risk) සහ මාර්ගගත සුරක්ෂිතතාව (online safety) ද ඇතුළුව ළමා ලිංගික අපයෝජනය සහ ලිංගික සූරාකෑම පිළිබඳ ප්‍රකාශනයන් සම්බන්ධයෙන් අධ්‍යාපනය හා දැනුවත්භාවය ලබා දෙන්න.
- මෙබඳු දේ සම්බන්ධයෙන් හා එහි විෂය පරාසය මෙන්ම එහි ලක්ෂණයන් පිළිබඳව අවබෝධය වැඩිදියුණු කරගැනීම සඳහා පර්යේෂණ කටයුතු සිදු කිරීම හා අදාළ තොරතුරු එක්රැස් කිරීම.
- අන්තර්ජාලය හරහා ඔබට මෙවැනි ළමා ලිංගික අපයෝජන හා සූරාකෑමට අදාළ ප්‍රකාශනයන් පිළිබඳ තොරතුරු හමුවූ විට වාර්තා කරන්න.

## 4.4.2 ලිංගික කටයුතු සඳහා අන්තර්ජාලය ඔස්සේ සිදුකරන පෙළඹවීම් (Online Grooming for Sexual Purposes)




ලිංගික කටයුතු සඳහා අන්තර්ජාලය ඔස්සේ සිදු කෙරෙන පෙළඹවීම් යනු යම් තැනැත්තෙකු විසින් ළමයෙකු අන්තර්ජාලයෙන් හෝ අන්තර්ජාලයෙන් පිටතදී ලිංගිකව සම්බන්ධවීමේ අරමුණ ඇතිව, අන්තර්ජාලය හෝ අනෙකුත් ඩිජිටල් මාධ්‍යයන් ඔස්සේ සම්බන්ධතාවක් ඇතිකර ගැනීමේ හා ගොඩනගා ගැනීමේ ක්‍රියාදාමයයි. ළමයා සමග ලිංගික ක්‍රියාකාරකම් සඳහා සූදානම් වීමේදී දරුවාගේ නිෂේධනයන් (එල්ලවන විරුද්ධතාවය) අඩුකිරීම සඳහා, දරුවා සමග මිත්‍රත්වයක් හා චිත්තවේගීය සම්බන්ධතාවයක් දැඩිව ඇති කර ගැනීමේ අරමුණින් හිතාමතාම අපයෝජකයා විසින් විවිධ ක්‍රියාමාර්ග සිදු කරනු ලබයි. මෙබඳු පෙළඹවීම්වල අරමුණ භෞතික ලෝකයේ එකිනෙකා හා මුණගැසීමට සීමා නොවන අතර, අන්තර්ජාලය ඔස්සේ හමුවීම් සිදුකිරීමද විය හැක.

- **පෙළඹවීම් වර්ග:-**

ළමයින්ව සහ යෞවනයින්ව අන්තර්ජාලය හරහා පොළඹවා ගැනීම ඕනෑම අයෙකුට සිදුකළ හැකිය. මෙයින් දෙදෙනාම හෝ එක් අයෙකු එකිනෙකා හොඳින් දන්නා හෝ නැතිනම් කිසිසේත්ම නොදන්නා ආගන්තුකයන්ද විය හැකිය.

මෙම තැනැත්තා පවුලේ සාමාජිකයෙකු, මිතුරෙකු, හෝ ඔවුන් ඉලක්ක කරගත් කිසියම් වූ පුද්ගලයෙකු විය හැකිය (උදාහරණ:- එනම් ගුරුවරයෙකු, ඇදහිලි කණ්ඩායමක නායකයෙකු හෝ ක්‍රීඩා පුහුණුකරුවෙකු වැනි). ළමයෙකු අන්තර්ජාලය හරහා පොළඹවා ගැනීමට ලක්වන විට, පෙළඹවීම සිදුකරනු ලබන වරදකරුවා ඇතැම්විට වෙනත් පුද්ගලයන්ගේ ඡායාරූප හෝ වීඩියෝ යැවීමෙන් ඔවුන් සැබැවින්ම කවුද යන්න සැඟවිය හැකිය. සමහර විට මෙය ඔවුන්ට වඩා වයසින් අඩු අයෙකු විසින් "සම වයසේ මිතුරෙකුසේ පෙනී සිටිමින්" සිදු කරනු ලබන්නක්ද විය හැකිය.

ඔවුන් අන්තර්ජාලය හරහා එක් ළමයෙකු ඉලක්ක කර ගැනීම හෝ ළමයින් ගණනාවක් සමග ඉතා ඉක්මණින් සම්බන්ධවී ඔවුන් ප්‍රතිචාර දක්වන තෙක් බලා සිටීම දැකිය හැක. පොළඹවා ගන්නෙකු විසින් ගොඩනගා ගනු ලබන සම්බන්ධතාවය විවිධ ස්වරූපයන් ගනු ලැබිය හැකිය. එනම් ඒවා පහත පරිදි වේ.

- ආදර සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම.
- උපදේශකයෙකු ලෙස පෙනී සිටීම.
- අධිකාරීත්වය දරනු ලබන චරිතයක් ලෙස පෙනී සිටීම.
- අධිපතීත්වය ඇති දැඩි චරිතයක් ලෙස පෙනී සිටීම.

පොළඹවා ගන්නෙකු යෞවනයන්ගේ හැසිරීම් රටා මෙන්ම ඔවුන් සුලබව භාවිත කරන වෙබ් අඩවි, ක්‍රීඩා සහ යෙදවුම් (Apps) භාවිත කරමින් යෞවන පුද්ගලයෙකුගේ

උනන්දුන්, ආසාවන් හා අභිරුචීන් ඉගෙන ගැනීමට කාලය ගත කරනු ලබන අතර එම දැනුවත්වීම් ඔවුන් සමඟ සම්බන්ධතාවයන් ගොඩනගා ගැනීමට භාවිතා කරනු ලබයි. ළමයින් ව අන්තර්ජාලය හරහා පොළඹවා ගැනීම පහත සඳහන් දේවල් හරහා සිදුවේ.

- සමාජ මාධ්‍යජාලා.
- WhatsApp වැනි පණිවිඩ හුවමාරු කරනු ලබන යෙදුම් (App) සහ කෙටි පණිවිඩයන්.
- විද්‍යුත් තැපැල.
- පණිවිඩ හුවමාරු අවකාශයන් (Chats forum) අන්තර්ජාල ක්‍රීඩා හා විවිධ යෙදවුම් හරහා කෙටි පණිවිඩයන් (text), කටහඬ (voice chat) හා වීඩියෝ (video chat) ඇසුරින්.

අන්තර්ජාලය වැනි මාර්ගගත ක්‍රමවලින් හෝ මුහුණට මුහුණ හමුවීම් තුළින් පොළඹවා ගන්නන්ට පහත උපක්‍රම භාවිත කළ හැකිය.

- යෞවනයෙකු ලෙස පෙනී සිටීම.
- අවවාද හා උපදෙස් ලබාදීම හෝ තමාට ළමයා/යෞවනයා අවබෝධ කරගත හැකි බව පෙන්වීම.
- තෑගි-බෝග මිළදී ගැනීම.
- ළමයා/යෞවනයා වෙත අවධානය ලබාදීම.
- විනෝද චාරිකා, සවාරි හෝ නිවාඩු දිනයන් ගත කිරීම සඳහා ඔවුන්ව රැගෙන යාම.

පොළඹවාගනු ලබන්නන්, ළමයින් සිය මිතුරන්ගෙන් සහ පවුලේ අයගෙන් හුදකලා කිරීමට ද උත්සාහ කළ හැකි අතර, ඔවුන්ව පොළඹවා ගන්නා මත යැපෙන බවත් හැඟවීමට ඉඩ හරින අතර, ඔවුන් කෙරෙහි පොළඹවා ගන්නාගේ බලය සහ පාලනය පතුරුවා හරිනු ලබයි.

දරුවාට වරදකාරීත්වය සහ ලැජ්ජාව පිළිබඳ හැඟීම දැනවීම සඳහා ඔවුන් අවමාන තර්ජනයන් (Blackmail) භාවිත කළ හැකිය. නැතහොත් ඔවුන්ව පාලනය කිරීමට, බිය ගැන්වීමට සහ තැතිගැන්වීමට "රහස්‍ය භාවය" පිළිබඳ අදහස හඳුන්වා දිය හැකිය. ළමයින් සහ යෞවනයින්ට තමන් පොළඹවා ගැනීමකට ලක්වී ඇතිබවට නොතේරෙනවාද විය හැකි බව මතක තබා ගැනීම වැදගත්ය. පක්ෂපාතීත්වය, ප්‍රශංසාව/අගයකොට සැලකීම, ආදරය මෙන්ම බිය, කරදර සහ පීඩාකාරී ස්වභාවය හා ව්‍යාකුලත්වය වැනි සංකීර්ණ හැඟීම්ද ළමයින්ට මේ ක්‍රියාදාමයේදී ඇතිවිය හැකිය.

වරදකරුවන් සහ අදාළවන ක්‍රියා පටිපාටීන්:-

- වරදකරුවන් ඔවුන් තුළ ඇති ළමයින් සඳහාවන ලිංගිකමය කැමැත්ත හෝ ආර්ථිකමය වාසි මත මූලිකවම මෙවැනි කටයුතුවලට පෙළඹේ.
- මොවුන් තනිවම හෝ සංවිධාන ගතවී ක්‍රියාත්මක වේ.
- අපයෝජකයන් විසින් වින්දිතයන් ඉලක්කකර ගනු ලබන්නේ ඔවුන්ගේ අනතුරු අවදානම් සහගත පසුබිම (උදා:- ආත්ම විශ්වාසය අඩු, දෙමාපිය රැකවරණයෙහි අඩුපාඩු ඇති ළමුන් වැනි) නිරීක්ෂණය කර හෝ අහඹු ලෙස විය හැකිය.

- ළමයා හා කෙරෙන සම්බන්ධතාවය සාමාන්‍යයෙන් ආරම්භවන්නේ අන්තර්ජාලයෙනි. උදා:- චැට්රූම්, අන්තර්ජාල විනෝද ක්‍රීඩා අඩවි හෝ සමාජමාධ්‍ය ජාලයන්. එමෙන්ම අන්තර්ජාලයෙන් පිටතදී ද පොළඹවා ගැනීම් සිදුවිය හැකිය.
- මෙහිදී සාමාන්‍යයෙන් සිදුවන්නේ ළමයාගේ විශ්වාසය ගොඩනගා ගැනීම සඳහා ළමයා සමග සංවේදී සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමයි. ඇතැම්විට මෙබඳු පෙළඹවීම් දිගුකාලීන ක්‍රියාවලියකි.
- වරදකරුවන් ඇතැම් විටක දී; විශ්වාසය මත ගොඩනගා ගන්නා දිගුකාලීන සම්බන්ධතාවයන් වෙනුවට ඉතා ඉක්මනින් හා පහසුවෙන් ළමයා කෙරෙහි තම අධිකාරීත්වය පතුරුවා ළමයා පාලනය කරමින් පොළඹවා ගැනීම සිදුකරයි.
- පොළඹවන්නන් සමහරවිට දරුවාගේ සම වයස් කණ්ඩායම්, පවුලේ අය සහ සෙසු ප්‍රජාවම ද  පොළඹවා ගැනීමට සමත්වේ.
- පෙළඹවීමේ හැසිරීම් රටාවන් අතර, ළමයා කෙරෙහි අවධානය යොමු කිරීම සහ ත්‍යාග ලබාදීම, මානසිකව සිදුකරන බලපෑම්, ළමයා මෙහෙයවීම, ලිංගික වශයෙන් දැනුවත් කිරීම් සිදු කිරීම හෝ ළමයාගේ සංවේදී බව අඩු කිරීම ආදිය තුළින් ළමයාගේ අවශ්‍යතාවයන් සපුරාලීම දැකිය හැකිය.
- ඔවුන් ක්‍රම ක්‍රමයෙන් ළමයා සමඟ තිබෙන සබඳතාවය ලිංගික සම්බන්ධතාවයක් දක්වා වර්ධනය කර ගනී.(වේගවත්ව හෝ සෙමෙන්)
- ඔවුන් ළමයාගේ සහභාගීත්වය සහ නිහඬබව පවත්වා ගැනීම සඳහා ළමයා හුදකලා කරවීම, රහසිගතභාවය සුරැකීමට බලපෑම් කිරීම මෙන්ම අපවාද කිරීම ද බහුලව භාවිත කරයි.

## ඔබට කළ හැකි දේ....

- මෙබඳු ලිංගිකමය පෙළඹවීම් අපරාධමය වරදක් ලෙස නීතිය ඉදිරියේ පිළිගැනෙන පරිදි විධි විධාන සැකසීමට අවශ්‍යය අවස්ථාවන්හි දී ඊට සහාය වන්න.
- මෙබඳු අපරාධවලදී මැදිහත් වීම සඳහා නීතිය බලාත්මක කිරීමට අවශ්‍යවන වඩාත් සුදුසු සම්පත්වන කැපවූ ධාරිතාවයන් සහිත වෘත්තිකයන්, යටිතල පහසුකම් සහ අදාළ මෙවලම් වෙනුවෙන් පෙනී සිටින්න.
- ළමයින්ට සුරක්ෂිත අන්තර්ජාල පරිසරයන් සැපයීම සඳහා අන්තර්ජාල පහසුකම් සපයන්නන් වැනි පුද්ගලික අංශය සමඟ සහයෝගීව කටයුතු කිරීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටීම.
- ලිංගිකමය පෙළඹවීම් සම්බන්ධයෙන් අධ්‍යාපනය ලබා දීම සහ දැනුවත් කිරීම.
- අන්තර්ජාල පෙළඹවීම් සම්බන්ධයෙන් විධිමත් අවබෝධයක් ලබා ගැනීම සඳහා පර්යේෂණ කටයුතු කිරීම හා අදාළ තොරතුරු එක්රැස් කිරීම.
- අන්තර්ජාල පොළඹවන්නන් විසින් යම් ළමයෙකු ඉලක්ක කරගනු ලබන බවට ඔබ දැනුවත් වන්නේ නම් එය වාර්තා කරන්න.
- වින්දිතයන්ට උපකාරය සහ රැකවරණය ලබා දෙන්න.

### 4.4.3 ලිංගිකමය කෙටි පණිවිඩ යැවීම (Sexting)



ලිංගිකමය කෙටි පණිවිඩ යැවීම යනුවෙන් නිර්වචනය කරනු ලබන්නේ; දුරකථනයක්, යෙදවුමක් (App), ඊමේල් හෝ වෙබ් කැමරාවක් වැනි තාක්ෂණික ක්‍රමවේද හරහා ලිංගිකමය පණිවිඩ නිපදවීම, හුවමාරු කිරීම, යැවීම හෝ ලැබීමයි. ස්වයං නිෂ්පාදිත ලිංගිකමය කෙටි පණිවිඩ ද මෙයට ඇතුළත් වේ. සමහර පුද්ගලයන් සඳහා ලිංගිකමය කෙටි පණිවිඩ යැවීම යනු; ලිංගිකත්වය, විශ්වාසය, සීමාවන් සහ සමීපභාවයන් උරගා බැලීම හෝ හඹා යෑම සඳහා වූ එක් ක්‍රමයකි. කෙසේ වෙතත් සමහර සිද්ධීන්වල දී ලිංගිකමය කෙටි පණිවිඩ යැවීම; හිරිහැර කිරීම, අවමාන තර්ජනයන් කිරීම (Blackmail) හා සූරාකෑම සඳහා ද භාවිතකර ඇත.

ලිංගිකමය කෙටි පණිවිඩ යැවීමට පහත පරිදි වදන්/වැකි , ඡායාරූප හෝ වීඩියෝපට වැනි දෑ ඇතුළත් විය හැකිය.

- ලිංගිකමය භාෂාවෙන් ලියා ඇති පණිවිඩයක් හෝ සටහන්
- නිරුවත්, අඩ නිරුවත් හෝ නිරුවත්බවට ආසන්න ඡායාරූප හෝ වීඩියෝපට
- ලිංගිකමය ක්‍රියාවන් දැක්වෙන ඡායාරූප/වීඩියෝපට
- ලිංගිකමය ක්‍රියාකාරකම් ද ඇතුළත්වන වෙබ් කැමරාවන් හරහා යමෙකු සමඟ සිදුකරන සජීවී කතාබස්
- තිරයෙන් ග්‍රහණයකරගත් ඡායාරූප (Screen Captured Photos)/වෙබ් කැමරාවකින් පටිගතකරන ලද වීඩියෝපට

ළමයින් ලිංගිකමය කෙටි පණිවිඩ යැවීමෙහි නිරතවන්නේ ඇයි? සහ එය සිදුවන්නේ කෙසේ ද?

- ළමයින් සාමාන්‍යයෙන්, තමන්ගේ අවශ්‍යතාවය මත තමන්ම මුලපුරා හෝ වෙනත් පුද්ගලයෙකුගේ ඉල්ලීම මත පින්තූර ගැනීම හෝ වීඩියෝ පටිගත කිරීම් හෝ හුවමාරු කර ගැනීම් සිදු කරයි.
- විවිධ උපාංග භාවිත කරමින් පින්තූර හෝ රූප පටිගත කළ හැකිය.
- බොහෝවිට ජංගම දුරකථන භාවිත කරමින් මේවා නිෂ්පාදනයකර කෙටි පණිවිඩ ඔස්සේ (Text), සංවාද මණ්ඩප (Chat rooms) හෝ සමාජ මාධ්‍යජාල ඔස්සේ හුවමාරු කරගනී.
- පෙම්වතා හෝ පෙම්වතිය, වෙනත් සම වයසේ මිතුරන් හෝ ඔවුන් සන්නිවේදනය කරනු ලබන අනෙකුත් පුද්ගලයන් සමඟ මෙවැනි අන්තර්ගත කරුණු හුවමාරු කර ගනී.
- ලිංගික සම්බන්ධතාවයක ඇති තෘප්තිමත් බව, අත්හදා බැලීම ඇතුළුව ළමයින් ලිංගිකමය කෙටි පණිවිඩ සඳහා පෙළඹවීමෙහි හේතු විවිධ පරාසයක වෙනස් විය හැකිය. මෙය ඇවිටිලි කිරීමකට දක්වන ප්‍රතිචාරයක් ලෙස හෝ යමෙකු

වෙනුවෙන් දක්වන අවධානය සහ කැපවීම තහවුරු කිරීමේ සහතිකයක් ලෙස ද සිදුකළ හැකිය. ඔවුන් මේ සඳහා උපක්‍රම ලෙස භාවිතා කරනුයේ; පෙළඹවීම එසේත් නැතිනම් අභිප්‍රේරණය කිරීම, සම වයස් කණ්ඩායම්වලින් එල්ලවන පීඩනය සහ උනන්දු කිරීම ආදියයි.

- ළමයින් බොහෝ විට ඔවුන්ගේ හැසිරීම් වලින් සිදුවිය හැකි ප්‍රතිවිපාක පිළිබඳව තේරුම් නොගන්නා බැවින් සහ ඔවුන්ගේ අනන්‍යතාවය හෙළිවීමෙන් ඇතිවන අවදානම හඳුනා නොගන්නා බැවින් ලිංගිකමය කෙටි පණිවිඩ යැවීම ගැටලු සහගත වී ඇත.
- ලිංගික ග්‍රහණයට ලක්වීම (Sexual Extortion/Sextortion), සයිබර් අවකාශය තුළ සිදුවන හිරිහැර කිරීම්වලට ලක්වීම (Cyber Bullying) සහ ළමා ලිංගික අපයෝජන/සූරාකෑමේ ප්‍රකාශනයන් අඩංගු සංචිතයන්වල (උදාː- ළමා ලිංගික අපයෝජන ප්‍රකාශනයන් ඇතුළත් වෙබ් අඩවි වැනි) ඔවුන්ගේ පින්තූර පිටපත් කිරීම හෝ භාවිත කරනු ලැබීම වැනි වින්දිතභාවයන්ට මේ හරහා ළමයින් ගොදුරු වීමට ලක්විය හැකිය.
- අන්තර්ජාලය තුළ පින්තූර තැන්පත් කිරීම/ ගබඩා කිරීම හෝ හුවමාරු කිරීම සිදු වූ විට ඒවා ප්‍රසිද්ධ වේ. සමහර අය සිතන්නේ පින්තූර සහ වීඩියෝ සමාජ මාධ්‍යජාලවල තත්පර කිහිපයක් පමණක් පවතින අතර පසුව ඒවා මකා දමන බවයි. නමුත් ඒවා තවදුරටත් සුරැකීමට හෝ වෙනත් අයට පිටපත්කර තබාගත හැකිය. මෙයින් අදහස් කරන්නේ යෞවනයෙකු පෞද්ගලිකවම හුවමාරු කරගෙන ඇති ඡායාරූප හෝ වීඩියෝ ඔවුන් නොදන්නා වැඩිහිටියන් අතර ද අවසානයේ දී හුවමාරු වීමට ඉඩ ඇති බවයි.

**ලිංගිකමය කෙටි පණිවිඩ යැවීම හරහා අවමාන තර්ජනය කිරීම (Blackmail), හිරිහැර කිරීම සහ පීඩාවට පත් කිරීම.**

යෞවනයන් ලිංගිකමය කෙටි පණිවිඩ යැවීම හානිකර නොවන දෙයක් ලෙස සිතිය හැකිය. නමුත් එමඟින් ඔවුන් අවදානමට ලක්විය හැකිය.

- අවමාන තර්ජනය කිරීම (Blackmail)
  වින්දිතයෙක් බවට පත් වූ ළමයා මුදල් හෝ වැඩි වැඩියෙන් පින්තූර යවන්නේ නැතිනම් අපයෝජකයා එම පින්තූර දරුවාගේ පවුලේ අය හා යහලුවන් අතර හුවමාරු කරගන්නා බවට තර්ජනය කළහැකිය.
- හිරිහැර කිරීම
  පින්තූර ඔවුන්ගේ සමවයසේ මිතුරන් සමඟ හෝ පාසලේ දී හුවමාරු වන්නේ නම්, දරුවා හිරුහැර කිරීමකට ලක්වේ.
- අනවශ්‍ය අවධානය
  අන්තර්ජාලය හරහා පළකරන පින්තූර මඟින්; පින්තූර පිළිබඳව විපරම් කරණා, පිංතූර එකතුකරන හා වෙනස්කරන ආකාරය දන්නා ලිංගික අපරාධකරුවන්ගේ අවධානයට හසුවීමට හෝ ආකර්ෂණය වීමට ඉඩ ඇත.
- චිත්තවේගීය පීඩාව
  දරුවන්ට ලැජ්ජාවක් හෝ නින්දාවක් දැනිය හැකිය. ඔවුන් දැඩිලෙස පීඩාවට පත් වූ විට මෙය සියදිවි නසා ගැනීමක් හෝ ස්වයං හානි සිදුකර ගැනීමක් දක්වා යොමුවිය හැකිය.

අපරාධමය වරදවල්:-

ලිංගිකමය කෙටි පණිවිඩ යැවීම,සාමාන්‍යයෙන් හානිකර නොවන දෙයක්බව කෙනෙකුට සිතිය හැකිය. නමුත් සමහර රටවල ළමුන් සම්බන්ධකර සිදුවන ලිංගිකමය කෙටි පණිවිඩ යැවීම; නීතිය ඉදිරියේ සලකනු ලබන්නේ "ළමා කාමුක දර්ශන"වලට අදාළ නීතිය උල්ලංඝනය කිරීමක් ලෙසය. එයට හේතුව වන්නේ එය බාලවයස්කරුවෙකුගේ ලිංගිකමය පින්තූරයක් නිෂ්පාදනය කිරීම, ඉදිරිපත් කිරීම සහ බෙදාහැරීම හා සම්බන්ධ වන බැවිනි.
නිශ්චිත වශයෙන් ම දරුවෙකුගේ ලිංගිකමය පින්තූරයක් නිර්මාණය කිරීම හෝ බෙදා හදා ගැනීම නීති විරෝධී වේ. එය කරන පුද්ගලයා දරුවෙකු වුවද එය නීති විරෝධීය. යෞවනයෙකු නීතිය කඩ කරන්නේ නම්, ඔවුන් පහත සඳහන් දේ සිදුකර තිබිය යුතුය.

- තමන්ගේ හෝ මිතුරෙකුගේ සුපැහැදිලි පින්තූරයක් හෝ වීඩියෝ පටයක් ගෙන තිබීම.
- දරුවෙකුගේ සුපැහැදිලි පින්තූරයක් හෝ වීඩියෝ පටයක් හුවමාරු කරතිබීම, එය සමවයසේ දරුවන් අතර හුවමාරු කරගෙන තිබීම වුවද අදාළ වේ.
- දරුවෙකුගේ සුපැහැදිලි පින්තූරයක් හෝ වීඩියෝ පටයක් සන්තකයේ තබා ගැනීම, බාගත කිරීම හෝ ගබඩාකර තබා ගැනීම. එම දරුවා එවැන්නක් නිර්මාණය කිරීමට ඔහුගේ/ ඇයගේ අවසරය ලබා දී තිබුණ ද එය අදාළ වේ.

දරුවෙකුගේ ලිංගිකමය වශයෙන් නිරූපණයක් සහිත පණිවිඩයක් පටිගත කිරීමක් සහ/හෝ යැවීමක් සිදු කරනු ලබන පුද්ගලයෙකු ළමා ලිංගික අපයෝජන හා සූරාකෑමේ ප්‍රකාශනයන් නිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම සම්බන්ධයෙන් චෝදනා ලැබිය හැකිය. ඊට අමතරව එම ද්‍රව්‍ය හෝ මාධ්‍යය ලද හෝ බාරගනු ලබන පුද්ගලයාට ළමා ලිංගික අපයෝජන හා සූරාකෑමේ ප්‍රකාශන සන්තකයේ තබා ගැනීම හෝ ඒවාට ප්‍රවේශවීම සම්බන්ධයෙන් චෝදනා ලැබිය හැකිය.

ලිංගිකමය කෙටි පණිවිඩ යැවීමේ සිද්ධීන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී, තමන් අපයෝජනාත්මක හෝ සූරාකෑමේ තත්ත්වයකට පත්කළ හැකි ආකාරයේ අන්තර්ගතයන් ළමයා විසින්ම නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් සහ එයට ළමයා සාපරාධී ලෙස වගකිව යුතු යැයි සලකා වින්දිතභාවයට පත්වූ ළමයින්ට දොස් නොපැවරීමට වගබලා ගැනීම ද ඉතා තීරණාත්මකවේ.

ඔබට කළ හැකි දේ

- ළමයින් දෙමාපියන් සහ රැකබලා ගන්නන් අතර, ලිංගිකමය කෙටි පණිවිඩ යැවීමෙහි ඇති අවදානම් සහගත බව සහ සිදුවිය හැකි ප්‍රතිවිපාක පිළිබඳව ඉගැන්වීම් සිදු කිරීම සහ දැනුම ඉහළ නැංවීම.

- ලිංගිකමය කෙටි පණිවිඩවලට අදාළ අන්තර්ගතයන් අන්තර්ජාලය හරහා සංසරණය වීම වැළැක්වීම සඳහා අන්තර්ජාල පහසුකම් සපයන්නන් සමඟ සහයෝගීව කටයුතු කිරීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටීම. අවශ්‍ය විටකදී අධිකාරී බලය සහිත රාජ්‍ය ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ජංගම දුරකථන සේවා සපයන්නන්ගේ (Mobile Operators) සහාය ද ලබා ගැනීමට අවශ්‍ය පියවර ගෙන තිබීම.(උදා:- ඉල්ලීමක් මත පරිශීලක දත්ත හුවමාරුකර ගැනීම සහ ඉදිරිපත් කිරීම)

### 4.4.4 ලිංගික ග්‍රහණය (Sexual Exploitation / Sextortion):-

ලිංගික ග්‍රහණය යනු;

යම් අයෙකුගේ තමන් විසින්ම නිපදවාගෙන ඇති (ස්වයං ජනනය කරන ලද) පින්තූර හෝ වීඩියෝපට වැනි ප්‍රකාශන නිරූපිත පුද්ගලයාගේ කැමැත්තෙන් තොරව වෙනත් අයෙකු විසින් හුවමාරු කරන බව (උදා :- සමාජ මාධ්‍යවල පළ කිරීම වැනි) පවසමින් තර්ජනය කරමින් යටත්කර ගැනීමට උත්සාහ කරමින් ඔවුන්ව අවමාන තර්ජනයට (Blackmail) ලක් කිරීමයි. මෙහි අභිලාෂය වන්නේ ලිංගිකමය වාසි, මුදල් හෝ වෙනත් ප්‍රතිලාභ ලබා ගැනීම විය හැකිය.




මෙය ළමයින්ට එරෙහිව සිදුකරන විට දී; අන් අයට මෙම පින්තූර හෝ වීඩියෝපට වැනි ද්‍රව්‍යයන් නිරාවරණය කරනු ලබන බවට තර්ජනයන්ට යටත් කොට, ළමයින් හෝ යෞවනයින්ව බලහත්කාරයෙන් දිගින් දිගටම ලිංගිකමය ප්‍රකාශන නිපදවීමට සහ/ හෝ ලිංගික ක්‍රියාකාරකම්වල යෙදීම ලිංගික ග්‍රහණය හා සම්බන්ධ ක්‍රියාවලියේදී සිදුවේ.

සමහර අවස්ථාවලදී, මෙම අපයෝජනය නොනවතින ක්‍රියාවයක් ලෙස දිගින් දිගට සිදු වූ විට, වින්දිතයන් ස්වයංහානි කර ගැනීමට තැත් කිරීම හෝ එයින් ගැලවී යා හැකි එකම මාර්ගය ලෙස සියදිවි නසා ගැනීමට තැත් කිරීම පාලනය කරගත නොහැකි තත්ත්වයක් බවට පත්ව තිබේ.

වරදකරුවන් සහ ලිංගික ග්‍රහණයෙහි ලක්ෂණයන්

- අපරාධකරුවන් දරුවෙකුගෙන් ලිංගික වාසි හෝ මුදල් ලබා ගැනීම සඳහා ශාරීරික හිංසනය හෝ බලහත්කාරකම් සිදුකිරීමට වඩා තම තත්ත්වයේ හෝ තරාතිරමේ අධිකාරී බලය හෝ සැබෑ හෝ මවා පෙන්වන ලද බල අසමතුලිතතාවයන් යොදා ගනී.
- මානසිකව පොළඹවා ගැනීම බොහෝ විට සිදුවන්නේ; ඉල්ලීම් ඉටු නොකළහොත් වින්දිතයාට හිමි හෝ ඔහු / ඇය සතු ප්‍රතිලාභ අවහිරකරන බව පවසමින් හෝ අනිසි ප්‍රතිවිපාක ළඟා කරවන බවට තර්ජනය කරමිනි.
- මෙහි දී අපයෝජකයන් බලාපොරොත්තුවන ලිංගිකමය ප්‍රතිලාභ වන්නේ අපයෝජකයාගේ ඉල්ලීම මත වින්දිත දරුවා විසින් ශරීරයේ ලිංගික කොටස් නිරාවරණය කිරීම, ලිංගිකමය ඡායාරූප සඳහා පෙනී සිටීම හෝ අන්තර්ජාලයෙන් පිටත දී සිදුවන හමුවීම්වල දී ලිංගිකමය හෝ ශාරීරික අපයෝජනයන්ට යටත් කරවීමයි.
- ලිංගිකමය ප්‍රතිලාභවලට අමතරව භාණ්ඩ, සේවා හෝ මුදල් අපේක්ෂාවෙන් ද අපයෝජකයන් විසින් ළමයින්ව ලිංගික ග්‍රහණයට ලක් කරයි. උදාහරණයක් ලෙස වින්දිතයන් විසින් ම ජනනය කරන ලද ඡායාරූප තමන් සතු කරගනිමින් ඒවා භාවිතයෙන් ළමයා නතුකර ගනිමින් ළමයා අවමාන තර්ජනයන් ට (Blackmail) භාජනයකර මුදල් උපයා ගැනීම සිදු කරයි.

- ලිංගික ග්‍රහණයේ දී අදාළ පින්තූර සහ වීඩියෝපට වැනි ප්‍රකාශන අන්තර්ජාලයට හා සමවයස් කණ්ඩායම්වලට මුදා හැරීම හෝ එසේකරන බවට තර්ජනය කිරීම සුලබය. අනෙක් අතට, මෙය සයිබර් අවකාශය තුළ හිරිහැර කිරීම (Cyber Bullying) වැනි සෘණාත්මක ප්‍රතිවිපාකවලට හේතුවිය හැකි අතර එය දරුවා තවදුරටත් ගොදුරු වීමට හෝ හානියට පත්වීමට හේතුවේ.

ඔබට කළ හැකි දේ :-

- ලිංගික ග්‍රහණයන් අපරාධමය වරදක් බවට පත් කෙරෙන ආකාරයේ නෛතික විධිවිධාන සකස්කර ගැනීම වෙනුවෙන් පෙනී සිටීම.
- ලිංගික ග්‍රහණය පිළිබඳ ගැටලු විසඳීම සඳහා නීතිය බලාත්මක කිරීමට අවශ්‍යවන වඩාත් සුදුසු සම්පත් වෙනුවෙන් පෙනී සිටින්න.
- අපරාධකරුවන්ට ලිංගික ග්‍රහණය සිදු කිරීමේ අවස්ථාවන් සීමා කිරීම සඳහා; අන්තර්ජාලය හරහා සිදුවන ළමා ලිංගික අපයෝජන සහ සූරාකෑම පිළිබඳව ප්‍රකාශනයන් සංසරණයවීම වැළැක්වීම අත්‍යාවශ්‍යය. ඒ සඳහා අන්තර්ජාල පහසුකම් සපයන්නන් (Internet Service Providers) සමඟ සහයෝගීව කටයුතු කිරීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටීම සිදු කළයුතුව ඇත.
- ළමයින්, දෙමාපියන් සහ රැකබලාගන්නන් අතර ලිංගික කෙටි පණිවිඩ යැවීමෙහි (Sexting) ඇති අවදානම් සහ සිදුවිය හැකි ප්‍රතිවිපාකයන් සම්බන්ධව දැනුවත් කරන්න.
- ලිංගිකමය කෙටි පණිවිඩ යැවීම හෝ ළමා ලිංගික අපයෝජනය/ සූරාකෑම සම්බන්ධ ප්‍රකාශනයන් පිළිබඳ තොරතුරු හමු වූ විට වාර්තා කරන්න.

### 4.4.5 සජීවීව විකාශනයවන ළමා ලිංගික අපයෝජනය
(Live Streaming of Child Sexual Abuse):-

සජීවීව විකාශනයවන ළමා ලිංගික අපයෝජනය යනුවෙන් හඳුන් වන්නේ; දරුවෙකු තනිවම හෝ තවත් පුද්ගලයෙකු සමඟ බලහත්කාරය හෝ පොළඹවා ගැනීම මත ලිංගික ක්‍රියාවන් සිදු කිරීම එම මොහොතේම සජීවීව අන්තර්ජාලය හරහා සිදුකරන විකාශනයන් හරහා අන් අය විසින් දුරස්ථ ලෙස නරඹනු ලැබීමයි.

බොහෝ දුරට අදාළ ළමයා කෙබඳු ලිංගික ක්‍රියාකාරකමක නිරත විය යුතු ද යන්න මෙය නරඹන, ඇනවුම් කරන අය විසින් තීරණය කරනු ලබයි. බොහෝවිට මෙම දුරස්ථ පුද්ගලයන් විසින් ම අපයෝජනය සිදුකිරීම සඳහා මූල්‍යමය ගෙවීමක් ද සිදුකරයි.

**වරද කරුවන් සහ අදාළවන ක්‍රියාපටිපාටීන් :-**

- වරදකරුවන් වෙබ් කැමරා තාක්ෂණය ඔස්සේ මැදිහත්කරුවන් හා පහසුකම් සපයන්නන් හරහා ප්‍රවේශ ලබාගෙන සජීවීව කෙරෙන ළමා ලිංගික අපයෝජනයන් නරඹනු ලබයි.
- ළමයින් ට වෙබ් කැමරා ඉදිරියේ බලහත්කාරයෙන් නිරූපණයන් දැක්වීමට පොළඹවන සමහර පහසුකම් සපයන්නන්; දරුවාගේ පවුලේ අයම හෝ ප්‍රජාවේ සාමාජිකයන් විය හැකිය. මොවුන් විසින් ම සජීවීව නැරඹීම සඳහා අපයෝජකයන් හා සම්බන්ධ වෙමින් සන්නිවේදන සම්බන්ධතා ද පවත්වාගෙන යනු ලබයි.
- අපයෝජනය සිදුවිය යුතු දිනය සහ වේලාව පිළිබඳව වරදකරු සහ පහසුකම් සපයන්නා හෝ දරුවා අතර එකඟතාවයක් ඇතිකර ගනී. මෙම සන්නිවේදනය සිදු කිරීම සඳහා චැට්, ඊ මේල් හෝ දුරකථන වැනි මාධ්‍යයක් යොදා ගනී.
- තව දුරටත් මෙම පාර්ශවකරුවන් විසින් වරදකරු ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් ද එකඟ වේ. සාමාන්‍යයෙන් අදාළ මුදල නීත්‍යානුකූල ගෙවීම් ක්‍රමයන්ගෙන් ගෙවන අතර එම මුදල සාමාන්‍යයෙන් කුඩා මුදල් ප්‍රමාණ වශයෙන් ගෙවනු ලැබේ. එසේ කරන්නේ එම ගනුදෙනු සම්බන්ධයෙන් සැක ඇතිවීම වළක්වා ගැනීමටයි.
- ස්කයිප් සහ වෙබ්කැම් පහසුකම් සපයන චැට් වෙබ් අඩවි වැනි විවිධ මාධ්‍යයන් මෙබඳු අපයෝජනයන් අන්තර්ජාලය හරහා සජීවීව විකාශනයට යොදා ගනී. අදාළ අපයෝජනය සිදුවන මොහොතේදී ම දැක ගැනීමට හෝ චැට් හෝ හඬ (Voice Functions) යන මාධ්‍යයන් ඔස්සේ එය සිදු කරන ආකාරය මෙහෙයවීමට මේ හරහා අපයෝජකයින්ට අවකාශ සැළසේ.
- මෙබඳු අපයෝජකයින් සඳහා සමහර ප්‍රජාවන් අතර ඉඩ ලබාදීමක් දක්නට ලැබේ. මෙය දුගීබව, අන්තර්ජාලය පිළිබඳව ඇති සීමිත අවබෝධය, කායික වශයෙන් සිදුවන ලිංගික අපයෝජනයක් තරම් මෙය බරපතල නොවේයැයි පවතින මිත්‍යාව හා නීතිය හමුවේ මෙය තවමත් අපරාධමය වරදක් ලෙස එම ප්‍රජාවන්වල හඳුනාගෙන නොතිබීම හේතුවිය හැකිය.

- එබැවින් අන්තර්ජාලය හරහා සජීවීව විකාශනය එම ප්‍රජාවන්වල ආදායම් ඉපැයීමේ පහසු හා ඉක්මන් ක්‍රමවේදයක් ලෙස හඳුනාගෙන ඇත.

**අපරාධමය වරදවල්**

සජීවීව අන්තර්ජාලය හරහා විකාශනයවන ළමා ලිංගික සූරාකෑම සම්බන්ධව නිශ්චිත වශයෙන් කලාපීය හෝ අන්තර්ජාතික මට්ටමෙන් නෛතික රාමුවක් නොමැත.
ළමයින් විකිණීම, ළමයින් ගණිකා සේවයේ යෙදවීම සහ ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන හා සම්බන්ධ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ; විකල්ප සම්මුතියෙහි (Optional Protocol) වගන්ති අංක 3 (1) (අ) යටතේ ඕනෑම ආකාරයකින් ළමා ලිංගික සූරාකෑම සඳහා දරුවෙකු පිරිනැමීම, භාරදීම හෝ පිළිගැනීමේ ක්‍රියාවන් සාපරාධී වරදක් බව දක්වා ඇත.
සජීවී විකාශන ක්‍රියාවලියේ දී ළමයෙකුගේ පින්තූරයක් හෝ වීඩියෝවක් පටිගත කිරීම වෙනුවට සජීවී විකාශනයක් සිදුවන බැවින් අපයෝජනය පිළිබඳව සාක්ෂි ලබා ගැනීම ප්‍රායෝගිකව අපහසුය. එමෙන් ම ළමා ලිංගික අපයෝජනය හා සූරාකෑමේ ප්‍රකාශන සන්තකයේ තබා ගැනීම, නිෂ්පාදනය, බෙදා හැරීම වැනි සාපරාධී ක්‍රියාවන් යටතට අදාළව අපයෝජකයන් නීතියේ රැහැනට හසුකර ගැනීම ඉතා දුෂ්කරය.

ඔබට කළ හැකි දේ :-

- සජීවීව විකාශනය කෙරෙන ළමා අපයෝජනය සම්බන්ධයෙන්වන අවදානම් , බලපෑම සහ නීතිවිරෝධී බව සම්බන්ධයෙන් ප්‍රජාවන් අතර දැනුවත් කිරීම් සහ සංවේදීකරණය සිදුකරන්න.
- සජීවීව විකාශනයවන ළමා ලිංගික අපයෝජනය හෝ ළමා ලිංගික අපයෝජන පිළිබඳ ප්‍රකාශන සම්බන්ධවන ක්‍රියාකාරකම් සාපරාධී වරදක් බව නීතිමය රාමුව තුළ දැක්වීම සඳහා අවශ්‍යය ප්‍රතිපාදන සකස්කිරීම වෙනුවෙන් පෙනී සිටීම.
- මෙම ගැටලුව නිරාකරණය කිරීම සඳහා නීතිය බලාත්මක කිරීමට අවශ්‍යවන වඩාත් සුදුසු සම්පත්වන කැපවූ ධාරිතාවයන් සහිත වෘත්තික යන්, යටිතල පහසුකම් සහ අදාළ මෙවලම් වෙනුවෙන් පෙනී සිටින්න.
- මෙබඳු අපරාධවලට සම්බන්ධයැයි සැකකළ හැකි මූල්‍ය ගණුදෙනු සොයා යෑම සහ හඹායෑම වෙනුවෙන් මූල්‍ය ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටින්න.

### 4.4.6 සයිබර් අවකාශය තුළ සිදුකරන හිංසනය (Cyber Bullying)

සයිබර් අවකාශය තුළ සිදුකරන හිංසන යනු හිතාමතා සාපරාධී ලෙස කෙනෙකු ඉලක්ක කර ගනිමින් ඔහුට හෝ ඇයට හානිදායක, අපහසුතාවයක් ඇතිවන පුද්ගලික තොරතුරු සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ හෝ සෘජුවම වින්දිතයා ඉලක්ක කර ගනිමින් පණිවිඩ යවන අවකාශ අතරේ හුවමාරු කර ගැනීම හා පලකිරීමයි.



සයිබර් අවකාශය තුළ සිදුකරන හිංසන විවිධ ආකාරයේ විය හැක.

- අතවර - නැවත නැවතත් වෛර සහගත සහ අපහාසාත්මක පණිවිඩ යැවීම.
- අපකීර්තියට පත්කිරීම - අන්තර්ජාලය භාවිතයෙන් කෙනෙකු අපවාදයට ලක් කිරීම. යම් පුද්ගලයෙකුගේ පිළිගැනීමට, විශ්වාසනීයත්වයට සහ කීර්තියට හෝ මිත්‍ර සම්බන්ධතාවලට හානි වන පරිදි ඔහු හෝ ඇය සම්බන්ධයෙන් ඕපාදූප, කටකතා සමාජ මාධ්‍ය ජාලාවල පළකිරීම.
- වෙනත් පුද්ගලයෙකු ලෙස පෙනී සිටීම - වෙනත් පුද්ගලයෙකු ලෙස පෙනී සිටිමින් එම පුද්ගලයා කරදරයකට හෝ අන්තරායකර තත්ත්වයකට හෝ ඔහු හෝ ඇය සතු පිළිගැනීම, විශ්වාසනීයත්වය හා කීර්තියට හානි කර අන්දමේ පණිවිඩ, දර්ශන, වීඩියෝ පට ආදිය හුවමාරුව සහ පළකිරීම.
- තොරතුරු බැහැරගත කිරීම - අන්තර්ජාලය හරහා පුද්ගලයෙකුගේ පෞද්ගලික තොරතුරු හෝ ඡායාරූප බෙදා හැරීම.
- අන්තර්ජාලය සහ අදාළ විද්‍යුත් උපාංග භාවිත කරමින් පුද්ගලයන්ව අපහසුතාවයට, හිරිහැරයට ලක්කිරීම සහ බිය වැද්දීම - මෙහි දී සමාජ මාධ්‍ය ජාලා හෝ සෘජු සන්නිවේදන මාධ්‍ය (දුරකථන වැනි) භාවිත කරමින් නිරන්තරයෙන්ම හිරිහැරයට, අපහසුතාවයට සහ තර්ජනය කිරීම්වලට ලක් කරයි. මේ සඳහා තර්ජන, අපහාසාත්මක හා අසභ්‍ය ප්‍රකාශයන්, දර්ශන භාවිත කරයි.

යෞවනයන් ඔවුන්ගේ සංවාදයන් බොහෝ විට අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන බැවින් ඔවුන් බෝහෝ විට සයිබර් අවකාශය තුළ හිංසනයන්ට ලක්ව වින්දිතයින් බවට පත්විය හැකිය. එවැනි හිංසනයන්ට ලක්වෙමින් සිටින දරුවෙකු හෝ යෞවනයෙකු පහත දක්වා ඇති ලක්ෂණ බොහෝ විට පෙන්නුම් කරයි.

- කෙටි පණිවිඩයක්, විද්‍යුත් පණිවිඩයක් ලැබුණු විට කලබලයට පත්වීමේ ස්වභාවය.
- යමෙකු ළඟින් යන සෑම විට ම උපාංගය ක්‍රියා විරහිත කිරීම හෝ තිරය වෙනස් කිරීම.

- අනෙක් අයට දැකිය හැකි අවස්ථාවල දී උපාංග භාවිත කිරීමට අකමැති වීම.
- විශේෂයෙන්ම අන්තර්ජාලයට පිවිසි විට දී පැහැදිලි කළ නොහැකි තරහක් හෝ කලකිරීමක් ඇති වීම.
- පෙර ඉතා උනන්දුවෙන් භාවිත කළ උපාංගය එක්වරම භාවිත කිරීම නතර කිරීම.
- සැබෑ ජීවිතයේ දී (එදිනෙදා කටයුතුවල දී) තම මිතුරන් හා පවුලේ අයගෙන් දුරස් වීම.

මෙම ගැටලුවට එරෙහිව සටන් කිරීම සඳහා මිනිසුන්ගේ ජීවිතවලට ක්‍රියාකාරීව සහභාගීවීම වැදගත්ය. විශේෂයෙන් ම යෞවනයන් අන්තර්ජාලය හරහා කරන්නේ කුමක් ද යන්න පිළිබඳව ප්‍රශ්න ඇසිය හැකි අතර ඔවුන් සමග විවෘතව සංවාදයෙහි යෙදීම වැදගත්ය. ඕනෑම සේවා ස්ථානයක හෝ පාසලක් වැනි අධ්‍යයන ආයතනයක අන්තර්ජාලය සුරක්ෂිතව භාවිතා කිරීම පිළිබඳව හා එහි නිවැරදි භාවිතාව පිළිබඳව මාර්ගෝපදේශනයක් හෝ ප්‍රතිපත්තියක් තිබීම හැමවිටම වැදගත් වේ. එය අවශ්‍යය වනුයේ අන්තර්ජාලය තුළ සිදුකරන ක්‍රියාකාරකම්වල දී සදාචාරාත්මක හැසිරීම් සඳහා දිරි ගැන්වීමට මෙන්ම යහපත් ආකාරයෙන් තාක්ෂණය භාවිතා කිරීමට දිරිගැන්වීම උදෙසා මිස සයිබර් අවකාශය තුළ සිදුවන හිරිහැර කිරීම්වල දරුණු තත්ත්වයන්ට මුහුණ දීම සඳහා පිළියමක් ලෙස නොවේ.

**සයිබර් අවකාශය තුළ හිරිහැර කිරීම් වැළැක්වීමට උපදෙස් :-**

- ඔබ පළකරන අදහස් හා ඡායාරූප ගැන දෙවරක් සිතන්න.
- "මෙම වචන කෙනෙකුට වැරදි ආකාරයෙන් බලපෑ හැකිද?" නැතිනම් "කෙනෙකුව අපහසුතාවයට පත්වේද?" "මෙම පින්තූර බොහෝ දෙනෙකුට දැකීමට සුදුසු ඒවාද ?" ආදී වශයෙන් පළ කිරීමට පෙර තමන්ගෙන් ම විමසන්න.
- ඔබ අන්තර්ජාලය හරහා පළකරන ලද දෙයකට දරුණු ආකාරයේ, ප්‍රතිචාරයක් හෝ කතාබහකට ලක්ව ඇති විටක දී එම අදහස් පළ කිරීම් (Posts) ඉවත් කරගන්න (Remove) . එවිට ඔබ එම ගැටලුකාරී තත්ත්වයේ කොටස්කාරයෙකු නොවනු ඇත.
- යමක් පළ කිරීමට පෙර, "මෙවැනි දෙයක් කියවීමට මා කැමති ද ?" යන්න තමන්ගෙන් ම විමසන්න. මෙය අන්තර්ජාලය තුළ කිසියම් ම වූ ආකාරයක අවභාවිතාවකට මඟ පෑදීමක් සිදු නොකරන අතර එය ඉතා සුබවාදී දර්ශනයකි.
- අන්තර්ජාලය තුළ හැමවිටම සුරක්ෂිතව කටයුතු කිරීමට වගබලා ගන්න. "වචන" සිත් රිදවීම් පමණක් නොව ඊට වඩා එහා ගිය දරුණු ආකාරයේ බලපෑම් ද පුද්ගලයෙකුට සිදුකරන බවට අවබෝධ කරගන්න.



### 4.4.7 නිරුවත් දර්ශන යැවීම හා කාන්දු කිරීම යනු කුමක්ද?

**පුද්ගලයින් නිරුවත් දර්ශන හුවමාරු කරගන්නේ ඇයි?**

මෙවැනි නිරුවත් දර්ශන හුවමාරු කරගැනීමට බොහෝවිට 'විශ්වාසය' සහ 'ආදරය' යන සංකල්ප හේතු වන බව හඳුනාගෙන ඇත. මෙවැනි ඡායාරූප සහ වීඩියෝපට 'ආදරයේ' සහ 'විශ්වාසයේ' සංකේත ලෙස සලකා යුවල අතරේ හුවමාරු කරගනු ලැබේ. එමෙන්ම, මෙම හුවමාරු කර ගැනීම් සම්බන්ධතා ගොඩනගා ගැනීමේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස සිතා ඒ සඳහා දිරි ගැන්වීම සිදුවේ.



නව යොවුන් වියෙහි මුල් අවදියේ දී ඇතිවන ලිංගික අවශ්‍යතා, යම් කලකිරීම් හා ආකර්ශනයන් හේතුවෙන් ද මෙම ඡායාරූප හුවමාරු කර ගැනීම සිදුවේ. දෙදෙනෙක් සිටින දුර ප්‍රමාණය වැඩි වන විට හා ලිංගික සම්බන්ධතා ඇති කර ගැනීමට අවස්ථා නොමැති වන විට මෙවැනි ඡායාරූප හුවමාරු කරගැනීමෙන්, එම ඡායාරූප හා වීඩියෝ මඟින් ලිංගික තෘප්තියක් ලබා ගැනීමේ ප්‍රවණතාව වැඩි බව ද හඳුනාගෙන ඇත. කාමුක දර්ශන සුලභ වීම, සමවයස් කණ්ඩායම්වල පීඩනය, සංස්කෘතිමය බාධා වැනි බාහිර සාධක හේතුවෙන් ද මෙම හුවමාරුව තවත් ශක්තිමත් විය හැකිය. උදාහරණයක් ලෙස යෞවන යෞවනියන් අතර මෙය සම්මතයක්/ප්‍රවණතාවක් බවට පත්වී ඇති හෙයින් ඔවුන් ඔවුන්ගේ සහකරුට/සහකාරියට එවැනි නිරුවත් ඡායාරූප යැවීම සඳහා බලකරනු ඇත.

යම්කිසි සම්බන්ධතාවයක ඇති ස්වභාවය හා අවශ්‍යතාවය අනුව ද මෙම හුවමාරුව සිදුවිය හැක. උදාහරණයක් ලෙස යමෙක් ඡායාරූප හුවමාරු කර නොගන්නේ නම්, සම්බන්ධතාව අවසන් කරන බවට තර්ජනය කර, එවැනි නිරුවත් දර්ශන හුවමාරු කිරීමට සහකරුවාට/සහකාරියට බල කරයි. තවත් අයෙකු තම සහකරුවා/සහකාරිය වෙනත් කෙනෙකුගෙන් ලිංගික අවශ්‍යතා සපුරා ගැනීමට සහ ලිංගික තෘප්තියක් ලබාගැනීමට යාම වළක්වා ගනිමින් සුරක්ෂිත කර ගැනීමට එම ඡායාරූප හුවමාරු කරගනී.

අවසාන වශයෙන්, පුද්ගලයින් දුප්පත්කම හා මූල්‍ය අගහිගකම් හේතුවෙන් ආදායම් උපයා ගැනීමේ අරමුණෙන් ද අනෙක් අය සමඟ තම නිරුවත් ඡායාරූප බෙදා ගන්නා බව ද ඇතැම් අවස්ථා වලදී සොයාගෙන ඇත.

### 4.4.8 පුද්ගලයින් නිරුවත් දර්ශන කාන්දු කරන්නේ ඇයි?

මෙම ඡායාරූප නිතරම තුන්වන පාර්ශවයකට කාන්දු කරන්නේ පළිගැනීම හෝ මූල්‍යමය වාසි ලබාගැනීම සඳහා වේ. පළිගැනීමේ අවශ්‍යතා සාමාන්‍යයෙන් ඇති වන්නේ සම්බන්ධතාවයක් බිඳුනු විට දී එම පුද්ගලයා කෝපයට/කළකිරීමට පත්වීම හේතුවෙනි. කුතුහලය දනවන කරුණක් වනුයේ, සමහර අවස්ථාවල දී වින්දිතයාගේ පවුලේ යම් සාමාජිකයෙකුගෙන් පළිගැනීමේ අරමුණෙන් ද මෙම ඡායාරූප කාන්දු කරන බව සොයා ගැනීමයි.

මෙම ඡායාරූප යහළුවන්ට, නාඳුනන පුද්ගලයින්ට මෙන්ම මූලිකවම මුදල් ලබා ගැනීමේ චේතනාවෙන් අසභ්‍ය වෙබ් අඩවි වලට මුදා හැරීම ද සිදුකරනු ලබයි. මෙම ඡායාරූප වෙළඳාම් කිරීම හේතුවෙන් කාන්දු කිරීමේ ප්‍රමාණය අධික ලෙස ඉහළ ගොස් ඇත. මෙය ශ්‍රී ලංකාවේ ගෘහස්ථ කාමුක දර්ශන නිපදවීමේ කර්මාන්තයට අනිසි දිරිමත් කිරීමක් ලෙස හඳුනාගෙන ඇත.

මෙම ඡායාරූප මිතුරන් අතරේ බෙදා ගැනීමෙන් තම සමවයස් පුද්ගලයන් හමුවේ එකී පුද්ගලයාගේ ආත්ම අභිමානය සහ කීර්තිය වැඩි කර ගැනීමට එය මාර්ගයක් වන බවත් සොයා ගෙන ඇත. ඇතැමුන් අවංකවම තම සහකරුගේ/සහකාරියගේ 'ලස්සන' තම මිතුරන්ට පෙන්වීමට කැමැත්තක් දක්වයි. එවැනි අවස්ථා වල දී එම පුද්ගලයාට එම ඡායාරූප කාන්දු කිරීමට මිතුරන් විසින් බල කරනු ලැබූ සිදුවීම් ද දක්නට ඇත.

සමහර අවස්ථාවල දී, සම්බන්ධතාවයක් නතර කිරීමට අවශ්‍ය වූ විට ද මෙම ඡායාරූප භුවමාරු කරනු ලැබේ. පුද්ගලයෙකු තව දුරටත් එම සම්බන්ධතාවය කරගෙන යෑමට අකමැති නම් ඔහු හෝ ඇය එම ඡායාරූප කාන්දු කිරීමට ඉඩ ඇත. එවැනි අවස්ථාවල දී, අපරාධකරු විසින් වින්දිතයාට මෙම ඡායාරූප කාන්දු කරන බවට තර්ජනය කරමින් සූරාකෑමකට හෝ අවමානයකට ලක් කරයි.

යම් පුද්ගලයෙකුට තාක්ෂණය සහ සමාජ මාධ්‍ය ජාලා පිළිබඳව ඇති නොදැනුවත්කම හා නොසැලකිලිමත්කම නිසා ද මෙවැනි දේ සිදුවිය හැකිය. නීතිමය හා සමාජීය ප්‍රතිවිපාක පිළිබඳව නොදැනුවත්භාවය ද මෙවැනි හැසිරීම් වලට හේතුවේ.

තවදුරටත් කරුණු ඉදිරිපත් කරන්නේ නම්, පුද්ගලයෙකුගේ ස්මාර්ට් ජංගම දුරකථනයට අනවසරයෙන් ඇතුළු වීමෙන් හෝ විශ්වාස කළ නොහැකි දුරකථන අලුත්වැඩියා කරන ස්ථාන වලට ලබාදීමෙන් ද මෙම ඡායාරූප ලබාගෙන ඇත. තාක්ෂණයේ දියුණුවත් සමඟ දත්ත ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව ඇති මෘදුකාංගය සාදා ඇත්තේ තැනැත්තෙකුට අවශ්‍ය පරිදි ස්මාර්ට් ජංගම දුරකථනවල මකා දමා ඇති දත්ත පවා ලබා ගැනීමට හැකි වන අයුරිණි.

## 4.5 අන්තර්ජාලය භාවිතය හේතුවෙන් දැකියහැකි ඇබ්බැහිවීම්වල අවදානම හා එහි ස්වරූප

පහත පරිච්ඡේදයේදී ළමුන් අතර අන්තර්ජාලය භාවිතය හේතුවෙන් ඇතිවන ඇබ්බැහිවීම් කිහිපයක් පිළිබඳ සාකච්ඡා කෙරේ. ඇබ්බැහිවීමක්ද යන්න සායනිකව නිගමනය කිරීම මනා සායනික දැනුමකින් හෙබි මනෝ චිකිත්සක වෘත්තිකයකු විසින් පමණක් සිදුකල යුතු බව අප අවබෝධ කරගත යුත්තකි. මෙම පරිච්ඡේදය පරිශීලනය කිරීම හරහා එබඳු අවදානම් සහගතයයි හැඟෙන ළමයෙකු අදාළ වෘත්තිකයන් වෙත යොමුකරලීමට ඔබට උපකාරීවනු ඇත.

## 4.5.1 තිරය මත ඇබ්බැහිවීම Screen Addiction

තාක්ෂණික දියුණුවත් සමඟ අන්තර්ජාල භාවිතයෙන් ලොව පුරා එකිනෙකා සම්බන්ධ කළද, අනෙක් අතට එමගින්ම භෞතික ලෝකය තුළ ඔවුන්ව එකිනෙකාගෙන් දුරස්ථ කොට තිබීම දැකිය හැකිය. විටෙක එය ඉන් නොනැවතී ඇබ්බැහිවීමක් දක්වාද ළඟා වූ අවස්ථා දැකිය හැක. සාම්ප්‍රදායිකව "ඇබ්බැහිවීම" යන්න මත්ද්‍රව්‍ය හේතු කොට ගෙන ඇතිවන කායික හා මානසික තත්ත්වයන් හැඳින්වීමට බොහෝ විට යෙදුණද, අදවන විට විවිධාකාර තාක්‍ෂණික ඇබ්බැහිවීම් ද සමීක්ෂණ හරහා හඳුනාගෙන ඇත. "තිරය මත ඇබ්බැහිවීම" (Screen Addiction) පරිශීලකයෙකු විසින් තිරය ආශ්‍රිත විවිධ ක්‍රියාකාරකම් සඳහා පාලනයකින් තොරව, ගැටලුකාරී තත්ත්වයන් ඇතිවන පරිදි නිරතවීම ලෙස හඳුනාගත හැක. තිරයක් සහිත මෙවලම් ලෙස පරිගණක, ලැප්ටොප් , ස්මාර්ට් දුරකථන හා ටැබ් පරිගණක හඳුනාගත හැක (Balhara,Verma & Bhargava, 2018).

තිරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විසින් මනස හා පුද්ගල හැසිරීම නිරන්තර පාලනය, මුහුණුවර (Mood) උත්තේජකයක් ලෙස මෙම ක්‍රියාකාරකම් තමා විසින් පිළිගැනීම, තිරය ආශ්‍රිත ක්‍රියාකාරකම් තුළින් කලින් ලැබූ තෘප්තිමත්භාවයේ මට්ටම ලබා ගැනීම සඳහා පෙරට වඩා වැඩි යෙදීමක් ඒ සඳහා අවශ්‍ය වීම, තිරය ආශ්‍රිත ක්‍රියාකාරකම් අඩු කළ විට හෝ නැවැත්වූ විට ඇතිවන කායික හා මානසික අප්‍රසන්නකාරී තත්ත්වය, තමා සමඟ ම හා අවට සිටින්නන් සමඟ තිරය ආශ්‍රිත ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන ගැටලුකාරී තත්ත්වය, මෙම ක්‍රියාකාරකම් පාලනය කිරීම හෝ නවතා දැමීම යම් කාලසීමාවකට සිදුකළද නැවත නැවතත් පෙර තත්ත්වයටම යොමුවීමේ ප්‍රවණතාවය තිරය මත ඇබ්බැහිවීමේ මූලික ලක්ෂණයි. බෙල්ල, උරහිස, සහ පිට කොන්ද ආශ්‍රිත වේදනාවන්, ඇස් පෙනීමේ දුබලතා, හිසරද තත්ත්වයන් හා නින්දෙහි ඇතිවන ගැටලුකාරී තත්ත්වයන් වැනි කායික ලක්‍ෂණ ද මෙම ඇබ්බැහිවීම් ආශ්‍රිතව හඳුනා ගැනීමට පුළුවන. (Griffiths, 2005)

ළමුන් සමග දෙමාපියන් හෝ භාරකරුවන් කටයුතු කිරීමේදී පහත ලක්‍ෂණ ඔවුන් තුළින් හඳුනාගත හැකිනම් ඔවුන් තිරය මත යෙදීම අධික විය හැක (Gagne, 2019).

- ළමයාට තිරය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල යෙදීම පාලනය කරගත නොහැකිවීම.
- ළමයා අනෙකුත් ක්‍රියාකාරකම්වල යෙදීමට ඇති කැමැත්ත අඩුවීම.
- ළමයාගේ මනස වෙනත් සිතුවිල්ලකට නොයා තිරය ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳවම යෙදීම.
- ඔහු/ඇය සමාජානුයෝජනය වීමේ මන්දගාමී බව.
- තිරය ආශ්‍රිත ක්‍රියාකාරකම් හේතුවෙන් පවුලේ ගැටළු ඇතිවීම.
- තිරය ආශ්‍රිත මෙවලම් පරිශීලනය කිරීමට නොහැකිවූ විට එදිනෙදා කටයුතු නිසිලෙස කිරීමේ නොහැකියාව.
- තිරය ආශ්‍රිත මෙවලම් භාවිතය පිළිබඳව දෙමාපියන්ගෙන් සහ භාරකරුවන්ගෙන් සැඟවීම.

දශක ගණනාවකට පෙර සිටම එක්සත් ජනපදය වැනි රටවල තිරය ආශ්‍රිත මෙවලම් පරිශීලනය කළ යුතු කාලය පිළිබඳ නිර්ණායක යොදවා ඇත. ජාතික සෞඛ්‍ය මට්ටම ඉහළ නැංවීමේ හා විවිධ රෝගාබාධ වැළැක්වීමේ ප්‍රමුඛතාවක් ලෙස මෙය හඳුනාගැනීම එබඳු නිර්ණායක හඳුන්වාදීමේ අරමුණුය. (Balhara,Verma & Bhargava, 2018)

තිරය ආශ්‍රිත මෙවලම් හරහා ඇතිවන ගැටලුකාරී තත්ත්ව අවම කිරීමට පහත ක්‍රියාමාර්ග අනුගමනය සැලකිල්ලට ගත හැකිය (The Sun, 2019).

- තමාට අවශ්‍යය හා ගැලපෙන යෙදවුම් ( Applications ) පමණක් භාවිත කිරීම.
- තිරය ආශ්‍රිත ක්‍රියාකාරකම් හා ඔබගේ අනෙකුත් ක්‍රියාකාරකම් අතර තිබිය යුතු තුලනය ( Balance ) හඳුනා ගැනීම
- තිරය ආශ්‍රිත මෙවලම් භාවිතයේදී ස්වයං පාලනයක් ඇති කරගැනීම
- ළමුන් විසින් තිරය ආශ්‍රිත මෙවලම් භාවිත කිරීමේදී වැඩිහිටියන් විසින් සුදුසු පරිදි සීමාවන් හඳුන්වා දීම
- ළමුන් නැළවීමේ හා සන්සුන් කිරීමේ උපක්‍රමයක් ලෙස තිරය ආශ්‍රිත මෙවලම් භාවිතයට නොගැනීම
- රාත්‍රී නින්දට පෙර මෙබඳු මෙවලම් භාවිතය අවම කිරීම.

Reference List


- Balhara, Y.P.S, Verma, K & Bhargava, R. 2018 . Screen time and screen addiction: Beyond gaming, social media and pornography- A case report. 1 Asian J Psychiatr. Jun(35), pp. 77-78.
- Gagne, C. 2019. Today's Parent . [Online]. [24 October 2019]. Available from: https://www.todaysparent.com/kids/ kids-health/ kids-are-sleep-deprived-and-its-affecting-their-development/
- Griffiths, M. 2005. A 'components' model of addiction within a biopsychosocial framework. Journal of Substance Use. August(10(4)), pp. 191–197.A 'components' model of addiction within a biopsychosocial framework
- The sun. 2019. The Suncouk. [Online]. [24 October 2019]. Available from: https://www.thesun.co.uk/fabulous/ 8123694/ screen-addiction-children-parenting-advice/


### 4.5.2 වීඩියෝ ක්‍රීඩාවලට ඇබ්බැහිවීම (Video Game Addiction)

වීඩියෝ ක්‍රීඩා අද වන විට ළමයින්ගේ හා යෞවනයින්ගේ ප්‍රමුඛතම විනෝදාස්වාද මාධ්‍යයක් බවට පත්ව ඇත. මෙම වීඩියෝ ක්‍රීඩාවල සංකීර්ණත්වය පියවරෙන් පියවරට (Step by Step) ඉහළ නැංවේ. තවද ක්‍රීඩාවේ යම් ඉලක්කයකට ළඟාවීමට එකිනෙකට වෙනස් ආකාර ගණනාවක් සම්පාදනය කෙරේ. ක්‍රීඩාව කරන අතරතුර දින ගණනාවක් මුළුල්ලේ නොකඩවා යොදනු ලබන ප්‍රයත්නයක් ක්‍රීඩාව තුළ ඉදිරියට යාමට අවශ්‍යවේ.

සාර්ථකත්වය ලබාගත් විට ඒ සඳහා ප්‍රතිලාභ මෙන්ම, උත්තේජක හා පිළිගැනීම ද ක්‍රීඩාව තුළින්ම ලබාදේ. (Stockdale Coyne 2018) විවිධ සමීක්ෂණ හරහා වීඩියෝ ක්‍රීඩා සඳහා යමෙකු යොමුවීමට බලපාන ප්‍රධාන උත්තේජන තුනක් හඳුනාගෙන ඇත. ඉන් ලැබෙන ජයග්‍රහණ (Achievement), ක්‍රීඩාව හරහා ගොඩනැගෙන අන්තර් පුද්ගල සබඳතා (Socialization), සහ ක්‍රීඩාව තුළ විවිධ සොයාගැනීම් (Discoveries)/භූමිකා නිරූපණ (Role play)/තම සිතැඟිවලට අනුකූලව වෙනස් කිරීමේ හැකියාව (Customization) වැනි දෑ තුළින් ඇතිකරනු ලබන ප්‍රබල මානසික ග්‍රහණය (Immersion) මෙම උත්තේජන කාණ්ඩ තෙවර්ගයයි.

පසුගිය වසර කිහිපය තුළ වීඩියෝ ක්‍රීඩාවල සංකීර්ණත්වයේ, විවිධත්වයේ, තාත්විකත්වයේ හා ආකර්ෂණීයත්වයේ වඩා වැඩි වර්ධනයක් දැකිය හැකි විය. ප්‍රජානනය/ඥානය (Cognition) මූලික කරගත් ක්‍රීඩා (අවධානය, මතකය වැනි දෑ ඉලක්ක කරගත්), චලිතය (Movement Skills) මූලික කරගත් ක්‍රීඩා හා අන්තර්ජාලය හරහා අන්‍යෝන්‍යය සබඳතා (Online Social Interaction ) මූලික කරගත් වීඩියෝ ක්‍රීඩා ලෙස වීඩියෝ ක්‍රීඩා වර්ගීකරණය කළ හැක. ඇතැම් ළමයින් හා යෞවනයන් වීඩියෝ ක්‍රීඩා හරහා විනෝදාස්වාදයක් ලබා ගත්තද, ඇතැම් විට වීඩියෝ ක්‍රීඩා කරා ඇති යොමුව ඇබ්බැහිවීමක් දක්වා ගමන් කළ අවස්ථා ද පවතී. Internet Gaming Disorder ලෙස හඳුනා ගැනෙන මෙම තත්ත්වය, නොනැවතී නැවත නැවතත් අන්තර්ජාලය හරහා වීඩියෝ ක්‍රීඩාවල (බොහෝවිට වෙනත් ක්‍රීඩකයින් සමග) යෙදීම තුළින් ඇතිවන සායනිකව අර්ථ දක්වන ලද ගැටලුකාරී තත්ත්වයක් ලෙස හඳුනා ගත හැක. කායිකව හා මානසිකව වීඩියෝ ක්‍රීඩා සඳහාම යොමුවීම, වීඩියෝ ක්‍රීඩා නැවැත්වූ විට / ඉන් ඉවත්වූ විට ඇතිවන අපහසුකාරී තත්ත්වය, මුලින් වීඩියෝ ක්‍රීඩා හරහා ලැබූ තෘප්තිමත්භාවයම ලැබීමට වැඩි කාලයක් යොමුවීමට සිදුවීම, ස්වයං පාලනයකට ඇති නොහැකියාව, අනෙකුත් විනෝදාස්වාදී ක්‍රියාකාරකම්වලින් ඈත්වීම, වීඩියෝ ක්‍රීඩා හරහා හානිකර බලපෑම් පැමිණියද එය නොකඩවා භාවිතය, වීඩියෝ ක්‍රීඩා භාවිතය පිළිබඳ අන් අයගෙන් සැඟවීම, මුහුණුවර ( Mood)/ භාවයන් උත්තේජනය කරන මාධ්‍යයක් ලෙස වීඩියෝ ක්‍රීඩා හඳුනා ගැනීම හා සමීප සබඳතාවක් / රැකියාවක් හෝ වෙනත් එබඳු අංගයක් වීඩියෝ ක්‍රීඩා නිසා අහිමිවීම වැනි ලක්ෂණ කාලයක් පුරා පැවතීම Internet Gaming Disorder හිදී දැකිය හැක (Saquib et al 2017 ).

Internet Gaming Disorder හරහා ජීවිතය පිළිබඳ තෘප්තිමත්භාවය අඩුවීම, හුදකලා බව සමාජ ක්‍රියාකාරීත්වයේ අපොහොසත් බව, අධ්‍යාපනය අඩාල වීම, ආවේගාත්මක හැසිරීම්වල වර්ධනය, කාංසාව (Anxicty) හා විෂාදය (Depression) වැනි තත්ත්වයනට පත්වීම වැනි අවදානම් හඳුනාගෙන ඇත. සමීක්ෂණ අනුව වීඩියෝ ක්‍රීඩා තුළින් වැඩි වශයෙන් ආවේගයන්ට හා ප්‍රචණ්ඩත්වයට නිරාවරණය වීම පුද්ගල සංවේදීභාවයට හා සහකම්පනයට ඍණාත්මක බලපෑම් ඇති කරන බව හඳුනාගෙන ඇත (Saquib et al, 2017 ).

මොළයේ ස්කෑන් දත්ත හරහා කළ පරීක්ෂණවලින් Internet Gaming Disorder සඳහා ගොදුරුවූවන් ගේ මොළයේ ආවේග පාලනයට හා තීරණ ගැනීමට සම්බන්ධ කලාපවල අසාමාන්‍ය වෙනස්කම් හඳුනාගෙන ඇත. වීඩියෝ ක්‍රීඩා සඳහා වැඩි කාලයක් වැය කිරීම හරහා නින්ද අඩුවීම, නින්දයාමට ගතවන කාලය අධිකවීම හා සුව නින්දක් නොලැබීම වැනි ගැටලුකාරී තත්ත්වයන් ද ඇතිවිය හැක (Saquib et al, 2017 ).

.

වීඩියෝ ක්‍රීඩා සඳහා ළමුන් ඇබ්බැහිවීම තුළින් අන්තර්ජාලය හරහා සිදුවන ළමා ලිංගික සූරාකෑම්වලට ගොදුරුවීමේ අවදානමද ඉහළ දමයි. මන්දයත් වීඩියෝ ක්‍රීඩා ආශ්‍රිත අදහස් හුවමාරු අවකාශ (Forums/Chatrooms) සයිබර් අපරාධකරුවන්ට නිදැල්ලේ ළමුන් සමඟ සමීපවීමට අවකාශ සැළසීමයි (Child Safty Group, 2019).

වීඩියෝ ක්‍රීඩා ආශ්‍රිතව ළමයින්ට ඇතිවන ගැටලුකාරී තත්ත්ව අවම කිරීමට පහත ක්‍රියාමාර්ග අනුගමනය අවධානයට ගත හැකිය (Webnd LLC, 2019).

- වීඩියෝ ක්‍රිඩා හා අනෙකුත් ක්‍රියාකාරකම් අතර තුලනයක් (Balance) ඇතිකිරීමට ආකර්ෂණීය උපක්‍රම භාවිතය.
- වීඩියෝ ක්‍රීඩා වයසට ගැලපෙනවාද හා එහි අන්තර්ගතය ගැලපෙනවාද යන්න තහවුරුකර ගැනීම.
- වීඩියෝ ක්‍රීඩා හා එම මෙවලම් සමග ළමයා ගණුදෙනු කරන ආකාරය පිළිබඳව සුපරික්ෂකාරී වීම. ළමයා තුළ අසාමාන්‍ය ලෙස ඇතිවන ආවේග හා නොරිස්සුමේ ස්වභාවය ළමයා වීඩියෝ ක්‍රීඩා සඳහා යොදවන කාලය අධික බව දක්වන දර්ශකයන්ය.
- වීඩියෝ ක්‍රීඩාවල යෙදීම සඳහා යොදවන කාලය පිළිබඳ කාල සීමා ඇතිකර ගැනීම සඳහා ළමයාට උපකාර කිරීම.
- යම් ළමයෙකු වීඩියෝ ක්‍රිඩාවලට ඇබ්බැහිවී ඇත්නම් ඔහුට හෝ ඇයට අවශ්‍ය සහාය ලබාගැනීමට මනෝ විද්‍යාව හා සම්බන්ධ වෘත්තිකයෙකු වෙත ප්‍රවේශ වීම.

Reference List


- Child safety group. 2019. How to Protect a Child from Online Predators. [Online]. [28 October 2019]. Available from: http://www.childsafetygroup.org/blog_8.html
- Granic, I, Lobel, A & Engels, R.C.M.E. 2014. The Benefits of Playing Video Games. American Psychologist. 69(1), pp. 66-78.
- Saquib et al.. 2017. Video game addiction and psychological distress among expatriate adolescents in Saudi Arabia. Addictive Behaviors Reports .6(1), pp. 112-117.
- Šporčić, B & Glavak-tkalić, R. 2018. The relationship between online gaming motivation, self-concept clarity and tendency toward problematic gaming. Cyberpsychology: Journal of Psychosocial Research on Cyberspace. 12(1), pp. Article 4.
- Stockdale, L & Coyne, S.M. 2018. Video game addiction in emerging adulthood: Cross-sectional evidence of pathology in video game addicts as compared to matched healthy controls. Journal of Affective Disorders. 225(1), pp. 265-272.
- Webmd LLC. 2019. Video Game Addiction. [Online]. [28 October 2019]. Available from: https://www.webmd.com/mental-health/ addiction/ video-game-addiction#1

## 4.5.3 අන්තර්ජාල ඇබ්බැහිවීමේ සහලක්‍ෂණ සහ ආබාධ (Internet Addiction Syndrome & Disorders)



අන්තර්ජාල අවභාවිතය නිසා ඇතිවී තිබෙන අන්තර්ජාලයට ඇබ්බැහිවීමේ ප්‍රවණතාවය නොහොත් අර්බුදකාරී අන්තර්ජාල භාවිතය (problematic internet use) ලෝකය පුරාම මහත් අන්දෝලනයට තුඩුදී ඇති ගැටලුවකි. මෙම ගැටලුව හේතුවෙන් ස්නායු ආබාධ, මානසික ආබාධ සහ සමාජීය ප්‍රශ්න ඇතිවී තිබෙන බව එක්සත් ජනපදයේ කරනලද සමීක්‍ෂණවලින් සමාජය තැතිගන්වන සුලු ආකාරයේ දත්ත ලැබී ඇත. ඇමෙරිකානු සමීක්‍ෂණවලින් හෙළිවන්නේ ලෝක ජනගහනයෙන් මිලියන 8.2 ක ප්‍රමාණයක් අන්තර්ජාලයට ඇබ්බැහිවී ඇති බවය. අන්තර්ජාලය භාවිත කරන්නන් ගෙන් 6% ඇබ්බැහි වීමට ගොදුරුව සිටී. ශ්‍රී ලංකාවේ අන්තර්ජාලය භාවිත කරන්නන් මිලියන 7ක් පමණ ඇත. මෙම දත්තවලට අනුව අන්තර්ජාලයට ඇබ්බැහි වූවන් ශ්‍රී ලංකාවේ ලක්‍ෂ 5ක් පමණ ඇති බවට අනුමාන කළ හැකිය.

**අන්තර්ජාල වෙත ඇබ්බැහිවීම** - Internet Addiction

කෙනෙකු අන්තර්ජාලය තුළ බොහෝ වේලාවක් ගත කරන්නේනම් එය අන්තර්ජාලයට ඇබ්බැහි වීමකි. නැතහොත් අර්බුදකාරී අන්තර්ජාල භාවිතයක් ලෙසින් එය හැඳින්විය හැක. මේනිසා ඇතිවන අර්බුදකාරී තත්ත්වයන් අන්තර්ජාලය භාවිත කරන ලොකු කුඩා ගැහැනු, පිරිමි භේදයකින් තොරව ඔවුන්ගේ ජීවිතවලට අහිතකර ලෙස බලපානු ඇත. ඇතැම් වෘත්තිකයන් නැතහොත් අන්තර්ජාලය හා පරිගණකය උපයෝගී කොටගෙන තම රාජකාරි හෝ තම වෘත්තීයමය අරමුණු අරඹයා කටයුතු කරන්නන් අන්තර්ජාලයේ සහ පරිගණකය ඉදිරිපිට පැය ගණන් ගත කිරීම ඇබ්බැහි වීමක් නොවන අතර මෙවැනි අයගේ අරමුණ වන්නේ තමාට පැවරී ඇති රාජකාරිය හෝ තමා කළ යුතු යම් කාර්යභාරයකට හෝ නිර්මාණයකට යොමුවී සිටීම ය. එසේ නොමැතිව පහත සඳහන් ආකාරයට අන්තර්ජාලය සමග යම් පුද්ගලයෙක් කටයුතු කරන්නේ නම් එය ගැටලු සහගත තත්ත්වයකි.

**අන්තර්ජාලයට ඇබ්බැහිවීමේ සහලක්‍ෂණ - සින්ඩ්‍රෝම්** (Internet Addiction Syndrome)

මෙහිදී පහත සඳහන් ලක්‍ෂණ දැකිය හැකිවන අතර ඒවා ඇබ්බැහි වූ පුද්ගලයා අනුව වෙනස් විය හැක.

- ඔවුන් අන්තර්ජාලය තමාගේ ජීවිතයේ කොටසක් බවට පත්වී ඇති බව සිතයි.
- කාලය ගතවීම පිළිබඳ ඔවුන්ට දැනුමක් නැත. කෑම ගැනීම හෝ නිදාගැනීම පිළිබඳ තැකීමක් නැත.
- අන්තර්ජාලයට පිවිසීමට නොහැකි වුවහොත් හෝ කුමන හේතුවක් නිසා හෝ අන්තර්ජාලයෙන් බැහැරවීමට සිදුවුවහොත් මොවුන් අධික ලෙසින් කෝපයට පත්වේ.
- දැනට ලෝකයේ පවතින අන්තර්ජාල පහසුකම් වලින් මෙන්ම තම මෙවලම්වල ඇති ධාරිතාව පිළිබඳව ද මොවුන් සෑහීමකට පත්නොවේ.
- මොවුන් පසුගාමී, සහ කලහකාරී වන අතර තනිව සිටීමට කැමැත්තක් දක්වයි.



- අන්තර්ජාලය තුළින් නිරුවත් දර්ශන හා ලිංගික දර්ශන බාගත (download) කරන නිසා සාමාන්‍ය ජීවිතයේ ලිංගිකත්වය පිළිබඳ ඔවුන් සැලකිල්ලක් නොදක්වයි.
- අන්තර්ජාලයට ඇබ්බැහිවූවන් ජීවිතයේ යථාර්ථයෙන් බැහැර වී සිහින ලෝකයක ජීවත් වේ. එසේ වන්නේ අන්තර්ජාලය තුළින් ඔහු හෝ ඇය ඒ වෙත පොළඹවන බැවිනි.

**අන්තර්ජාල ඇබ්බැහිවීමෙන් ඇතිවිය හැකි ආබාධ** (Internet addiction disorders)

පහත සඳහන් ලක්ෂණ දැකගත හැකිය. එහෙත් මේවා ඇබ්බැහි වූ පුද්ගලයා අනුව වෙනස්වේ.

- ඔහු හෝ ඇය සාමාන්‍ය ජීවිතයේ යැපුම් මානසිකත්වයකට පත්වේ.
- ඔවුන් හේතුවක් ඇතිව හෝ නැතිව කෝපයට පත්වේ.
- කිසිඳු දෙයකින් සෑහීමකට පත් නොවීම නිසා ඇතිවන ආවේගශීලී හැසිරීම් රටාවක් ඔවුන් තුළ පවතී.
- ඔවුන් යථාර්ථවාදීව සිතාබැලීමට කැමැත්තක් නොදක්වයි.
- නින්දයාමේ අඩුබව, දිග්ගැස්සුන මනෝභාවයන්, (Prolong sentiment/Mood) හැසිරීම් රටාවේ වෙනස්කම්, කල්පනා ශක්තිය හීනවීම, කතා කිරීමේ හැකියාව අඩුවීම වැනි දේ ඔවුන් තුළින් විද්‍යාමාන වේ.
- සිරුරේ බර අඩුවීම හෝ වැඩිවීම මෙන්ම ප්‍රකෝපකාරී හැසිරීම් රටාවක් ඔවුන් තුළින් දැකිය හැකිවේ.
- ඔවුන් නිරන්තරයෙන්ම ආතතියට පත් වේ.
- ජීවිතයේ යම් ක්‍රියාකාරකම් වලින් ඉවත්වීමේ ප්‍රවණතාවයක් ඔවුන් (withdrawal) තුළින් දැකිය හැකිය.

**මෙම තත්ත්වය දරුවන් හා තරුණ ප්‍රජාවට බලපාන ආකාරය**

වයස 8 සිට 18 දක්වා දරුවන් විශේෂයෙන් පහළ පංතිවල ඉගෙන ගන්නා දරුවන් සතියකට පැය 75 කට ආසන්න කාලයක් අන්තර්ජාලය තුළ රැඳී සිටින්නේ නම් එය දෙමාපියන් සහ වැඩිහිටියන් විසින් සලකා බැලිය යුතු කාරණයකි. එයට හේතුව මෙසේ පරිගණක ඉදිරියේ සිටීම යනු ඔවුන්ට නිදාගැනීමට ඇති කාලය අඩුවී යාමය. නියමිත වේලාවට නිදාගැනීම දරුවන්ගේ සෞඛ්‍ය හොඳින් තබාගැනීමට අත්‍යාවශ්‍ය සාධකයකි. එසේ නොමැති විට දරුවා මානසික අවපීඩනකාරී තත්ත්වයකට (Depression) ගොදුරු වීමට ඇති ඉඩකඩ බහුලය.

අන්තර්ජාලයට ඇබ්බැහි වීමෙන් පහත සඳහන් තත්ත්වයන්ට දරුවන් ගොදුරු වීමේ ඉඩකඩ බහුලය.

- අන්තර්ජාලයේ සිටින විට වේලාව පිළිබඳ කිසිඳු හැඟීමක් ඔවුන්ට නොමැතිවීම
- නිදාගැනීමට ඇති වේලාව අඩුවී යාම.
- අන්තර්ජාලය තුළ සිටියදී එයට යම් බාධාවක් පැමිණියහොත් හෝ කුමන ආකාරයකින් හෝ අන්තර්ජාලයට පිවිසීමට ඉඩ නොලැබුණහොත් ඔවුන් උද්වේගකාරී ලෙසින් හැසිරේ, කෝපයට පත්වේ.



- අන්තර්ජාලය තුළ කාලය ගතකිරීම නිසා ගෙදර වැඩ හෝ ක්‍රියාකාරකම් කිරීමට ඔවුන්ට කාලයක් නැතිවේ.
- පවුලේ උදවිය, අසල්වැසියන් සහ සමවයසේ මිතුරන් සමග කාලය ගතකිරීමට නොහැකි වේ.
- අන්තර්ජාලය තුළ හමුවන දන්නා හෝ නොදන්නා මිතුරන් ලෙස පෙනී සිටින පුද්ගලයින් සමග මිතුරු ඇසුරු ඇතිකර ගනී.

අන්තර්ජාල ඇබ්බැහියට ගොදුරුවන දරුවන් පසුව පහත සඳහන් රෝගී තත්ත්වයන්ට ගොදුරු වීමේ ඉඩකඩ වැඩිය.

- කාන්සාව - කනස්සළු ස්වභාවයට පත්වී සිටීම - Anxiety
- වරදකාරී හැඟීමෙන් පසුවීම - Feelings of guilt
- අවපාතය - මානසික අවපීඩනය නිතර දුක්බර හැඟීම් සිතට නැඟීම - Mental Depression
- මානසික වශයෙන් පවතින වරදකාරී හැඟීම් හෝ වංකභාවය - Dishonesty
- මානසික තනිකම - කොතරම් පිරිසක් මැද සිටියද තමා තනිවී ඇතැයි යන හැඟීම Isolation

ඉහත සඳහන් ආබාධ සමග දරුවකුට හෝ තරුණයෙකුට යහපත් ජීවන තත්ත්වයකට හිමිකම් කිව නොහැකි වනු ඇත. ඔහු හෝ ඇය සමාජයෙන් කොන්වීමට, සියල්ලන්ගේම පිළිකුලට ලක්වීමට, සමාජයේ දෝෂ දර්ශනයට ලක්වීමට මෙන්ම බොහෝ සමාජීය ගැටලුවලට භාජනය වීමට ඇති ඉඩකඩ බහුල වනු ඇත.

දරුවන් මෙවැනි තත්ත්වයකට පත් වුවහොත් මේ සඳහා ඇති ප්‍රතිකාර මොනවාදැයි විමසීම මෙහිදී කළ යුතුව ඇත. මෙවැනි තත්ත්වයක් තුළදී මනෝවිද්‍යා උපදේශකයකුගේ සහාය අත්‍යාවශ්‍ය වනු ඇත. එම උපදේශකවරයා/වරිය චර්යා රටාවන් වෙනස්කිරීමේ චිකිත්සකයෙකු ද විය යුතුම ය. ඔහු හෝ ඇය විසින් ඇබ්බැහි වූ පුද්ගලයාට හෝ දරුවාට අන්තර්ජාලය හෝ ඊට අදාළ උපාංගවලින් ඈත්වී සිටීමට යෝජනා කළහොත් එය, එයට ඇබ්බැහි වූවන්ට කළ නොහැකි දෙයක් වනු ඇත. එයට හේතුව ජංගම දුරකථනය අද කාලයේ දරුවන් ඇතුළු සියලු දෙනාට අත්‍යාවශ්‍ය මෙවලමක් වී ඇති බැවිනි. අන්තර්ජාල භාවිත කරන අනිකුත් මෙවලම්වල තත්ත්වය ද මෙබඳුම ය. ඒවා අධ්‍යාපනය, රැකියාව ඇතුළු එදිනෙදා බොහෝ දේ කිරීමට දරුවන්ට අවශ්‍යම තත්ත්වයකට පත්ව තිබේ.

ඔබ විසින් තෝරා ගනු ලබන චිකිත්සකවරයා/වරිය අන්තර්ජාල ඇබ්බැහි වූ පුද්ගලයාට හෝ දරුවාට; ඇබ්බැහි වීම හේතුවෙන් ඔහුට හෝ ඇයට සිදුවූ අනර්ථයන් පිළිබඳ අවබෝධ කරදෙනු ඇත. ඉන්පසු මෙවලම් භාවිතයට ඉඩ දෙන අතරම අන්තර්ජාලය සීමාවක් ඇතිව පරිහරණය කරන ක්‍රමය ක්‍රමානුකූලව වින්දියාට පහදා දෙනු ඇත.



මෙයට චිකිත්සක ප්‍රතිකාර කිරීමේදී, ඒ සඳහා වින්දිතයින්ගේ දෙමාපියන් ගුරුවරයින් මෙන්ම ඔවුන් සමග කාලය ගතකරන සියලුදෙනා සහ දරුවා ඇසුරු කරන සමවයසේ මිතුරු කණ්ඩායම්හි සහාය (Peer Group) ලැබීම ප්‍රතිකාරයේ සාර්ථකත්වයට තුඩුදෙනු ඇත.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ අයි.සී.ඩී (ICD) යනුවෙන් හඳුන්වන ග්‍රන්ථය අන්තර්ජාතික රෝගාබාධ වර්ගීකරණයයි. 2019 වන විට මෙම ග්‍රන්ථයෙහි වෙළුම් 1 සිට 11 දක්වා ඇති අතර එහි ලෝකයේ පවතින රෝගාබාධ පිළිබඳ විස්තර දක්වා තිබේ. අයි.සී.ඩී 11 ග්‍රන්ථයේ අන්තර්ජාල ඇබ්බැහිවීම රෝගාබාධයක් ලෙස සඳහන් වන්නේ නැත. එහෙත් අයි.සී.ඩී 10 ග්‍රන්ථයේ පරිගණක ක්‍රීඩා සඳහා ඇබ්බැහි වීම රෝගයක් වශයෙන් හඳුන්වා ඇති නමුත් අයි.සී.ඩී 11 ග්‍රන්ථයේ එවැනි දෙයක් සඳහන්ව නොමැති අතර එයට හේතු වශයෙන් දක්වන්නේ හොඳ සෞඛ්‍ය සම්පන්න පුද්ගලයින් පරිගණක ක්‍රීඩා කරන අතර එය ආබාධයක් ලෙසින් නම් කළහොත් එය එහි හොඳින් ක්‍රීඩාවේ යෙදෙන්නන්හට කරන අනර්ථයක් වියහැකිය යනුවෙනි.




**Reference List**

- https://www.ncbi.nlm.nih.gov/pmc/articles/PMC2911081/
- https://www.psycom.net/iadcriteria.html
- https://www.ncbi.nlm.nih.gov/pmc/articles/PMC2911081/
- https://www.webroot.com


## 4.6 අන්තර්ජාලය භාවිතය හේතුවෙන් සිදුවිය හැකි තාක්ෂණිකමය අවදානම හා එහි ස්වරූපය

ඔබ අවධානයෙන් සිටිය යුතු විවිධාකාරයේ සයිබර් අපරාධයන් සයිබර් අවකාශය තුළ සිදුවිය හැකි පහත සඳහන් කර ඇති පොදු තර්ජනයන් මඟින් ඕනෑම අයෙකුගේ පරිගණකයේ හෝ උපාංගවල ඇති දත්ත හා තොරතුරු අපරාධකරුවන් අතට පත් විය හැකිය. මේවා පුළුල් පරාසයක් ඔස්සේ පැතිර තිබිය හැකි අතර දිනෙන් දින මෙම තර්ජනයන් අලුත් මුහුණුවරයන් ඔස්සේ වර්ධනය වෙමින් පවතී. ඒවායෙහි සුලබව පවත්නා අවස්ථාවන් කිහිපයක් පහත සඳහන් ආකාරයට හඳුනාගත හැකිය.

(i) හැකින් (Hacking)

පරිගණක පද්ධතිය තුළට අනවසරයෙන් ප්‍රවේශ වී දත්ත ලබා ගෙන කඩාකප්පල්කාරී ක්‍රියාවන්හි යෙදීම සයිබර් අපරාධයකි. මෙලෙස අනවසරයෙන් දත්ත ලබා ගන්නා පුද්ගලයන් පරිගණක පද්ධතිවල සහ ජාලවල පවතින නොයෙකුත් දෝෂ හඳුනා ගෙන ඒවා ප්‍රයෝජනයට ගනිමින් එම පද්ධතීන් ට ඇතුළු වීමට උත්සාහ කරති.

(ii) මැල්වෙයාර් (Malware)
පරිගණක හිමියා නොදැනුවත්වම පරිගණකයට ඇතුල් කෙරෙන වයිරස් ට්‍රෝජන් වැනි විනාශකාරී මෘදුකාංග මෙම නමින් හැඳින්වෙයි.
පරිගණක භාවිත කරන්නෝ මෙම විනාශකාරී මෘදුකාංගවල තර්ජනයට ගොදුරු වීමේ අවදානමට ලක් වන අතර ඒවායේ වින්දිතයකු වීමේ අවදානමට ද භාජන වෙති.

(iii) අනන්‍යතාව සොරා ගැනීම /වංචාව (Identity Theft)
වෙනත් පරිගණක භාවිත කරන්නන්ගේ පෞද්ගලික තොරතුරු සොරා ගැනීමට අපරාධ කරුවෝ අන්තර්ජාලය භාවිත කරති. ඉතා ප්‍රකට වූ අනන්‍යතා වංචාව සිදු කරනු ලබන්නේ ෆිෂිං හෝ ෆාමිං මඟිනි. අපරාධකරුවෝ මෙම ක්‍රම දෙක ම යොදා ගෙන නීත්‍යනුකූලසේ පෙනීසිටින ව්‍යාජ වෙබ් අඩවිවලට යාමට පරිගණක භාවිත කරන්නන් නම්මාගෙන ඔවුන්ගේ පෞද්ගලික තොරතුරු ඒවායේ සටහන් කිරීමට පොලඹවා ගනිති.

(iv) ෆිෂින් (Phishing)
මින් හඟවන්නේ කෙනෙකුගේ පෞද්ගලික තොරතුරු සොරා ගැනීමේ උත්සාහයකි. මෙම අපරාධකරුවන් නීත්‍යනුකූල වෙබ් අඩවියකින් එවන්නාක් මෙන් හඟවා පරිගණක භාවිත කරන්නන් වෙත ඉලෙක්ට්‍රොනික ලිපි එවා ලබන්නාගේ පෞද්ගලික තොරතුරු ඇතුළත් කරන ලෙස මෙබඳු ඉලෙක්ට්‍රොනික පණිවිඩවලින් දන්වනු ලැබේ.
ෆිෂිං ඉලෙක්ට්‍රොනික පණිවිඩය සකස් කර ඇත්තේ විශේෂයෙන් භාවිත කරන්නන්ට නියමිත යතුර තදකිරීමට ය. තමන් එම පණිවිඩය පිළිගත් පසු පරිගණක භාවිත කරන්නාගේ දැනුමෙන් තොර ව වයිරස පරිගණකයේ තැන්පත් විය හැකි ය.

(v) ෆාමින් (Pharming)
ව්‍යාජ වෙබ් අඩවි මගින් පෞද්ගලික තොරතුරු ලබා ගැනීම ෆිෂිං ක්‍රමයෙන් කෙරෙන අතර මෙහි දී සිදුවන්නේ බොහෝ විට පරිගණක භාවිත කරන්නා නොදැන ම ඔහු ව්‍යාජ වෙබ් අඩවිවලට නැවත යොමු කිරිම යි.

(vi) සයිබර් අවකාශය හරහා රහසේ ලුහුබැඳීම (Cyber Stalking )
මූලික වශයෙන් සයිබර් අතවර ලෙස හඳුන්වන්නේ සයිබර් අවකාශය උපයෝගී කර ගනිමින් වෙනත් කෙනෙකුට නොකඩවා හිංසා කිරීම යි. අතවර කිරීමේ ස්වරූපය ලිංගික හිරිහැරවල සිට කෝපය හා එදිරිවාදිකම් දක්වා විවිධාකාර වෙයි. අන්තර්ජාලයෙහි තම පෞද්ගලික තොරතුරු සටහන් කිරීම නිසා යමෙක් සයිබර් පීඩාවන්ට ගොදුරු වීමේ අවදානමට භාජනය වෙයි.

(vii) ස්පෑම් (Spam)
ඉල්ලුම් නොකරන ලද දීර්ඝ පණිවිඩ වග විභාගයක් නැති ව යැවීමට ඉලෙක්ට්‍රොනික පණිවිඩ හුවමාරු පද්ධති යොදා ගැනීම ස්පෑම් යනුවෙන් හැඳින්වෙයි. වැඩි වශයෙන් පිළිගත් ස්පෑම් වර්ගය ඉලෙක්ට්‍රොනික ලිපි ස්පෑම් වේ.



# වැළැක්වීම හා ප්‍රතිචාර දැක්වීම

## පියවර 5



## 5.1 අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික සූරාකෑම් වලට ගොදුරු වූ වින්දිතයින් හඳුනා ගැනීම.

**අනතුරු අවදානමට ලක්වන්නේ කවුරුන්ද?**
පොළඹවා ගැනීමකට ලක්වීම සඳහා ඕනෑම දරුවෙකු කෙරෙහි ම අනතුරු අවදානමක් ඇත. පිරිමි ළමයින් සහ ගැහැනු ළමයින් යන දෙපාර්ශවයම ලිංගිකමය පොළඹවා ගැනීම්වලට නතුවිය හැකිබව මතක තබා ගැනීම වැදගත්ය.

අන්තර්ජාලය හරහා පෙළඹවීමට ලක්වන දරුවන් ඔවුන් හොඳින් දන්නා කෙනෙකු විසින් ද අපයෝජනයට ලක්කළ හැකිය. තවද ඔවුන්, අන්තර්ජාලය හරහා කෙටිකාලයක් අතරතුර හඳුනාගත් අයෙකු හෝ දිගු කාලයක් තිස්සේ ළමයා සමඟ සම්බන්ධතාවයක් ගොඩනගා ගෙන සිටින ආගන්තුක අයෙකු ද විය හැකිය.

විශේෂයෙන් ම, විවිධ ආබාධ සහිත හෝ නොසලකා හරින ලදුව හෝ රැකබලා ගැනීම සඳහා ආයතනගතකර ඇති දරුවන් පොළඹවා ගන්නන් ගේ ඉලක්කගත ගොදුරු බවට පත් විය හැකිය.

පොළඹවාගන්නෙකු දරුවෙකු හෝ යෞවනයෙකු කෙරෙහි පවතින ඕනෑම අවදානම් සහගත තත්ත්වයකින් අයුතු ප්‍රයෝජන ලබාගනිමින් ඔවුන් තමන් මත යැපීමට ඇති සම්භාවිතාවය වැඩි කර ගනී. එයින් ඔවුන් දරුවා හෝ යෞවනයා ඒ පිළිබඳව හෙළිදරව් කිරීමට ඇති ඉඩකඩ අඩුකර ගනී.

ළමයින් ලිංගික සූරාකෑම් වලට ලක්වීම බොහෝ අවස්ථාවල හඳුනා ගැනීමට අපහසුය. දරුවා අන්තර්ජාලය තුළ වින්දිතයෙක් බවට පත්ව සිටින බව ඔබට හඳුනා ගැනීම සඳහා උපකාර විය හැකි සංඥා කිහිපයක් පහත දැක්වේ.

**උපාංග භාවිතයෙහි ක්ෂණික වෙනස්කම් ඇති වීම** - දරුවා දුරකථනයෙහි හෝ පරිගණකයෙහි පෙරට වඩා වැඩි හෝ අඩු කාලයක් ගත කරයි නම් හෝ සම්පූර්ණයෙන්ම භාවිතයෙන් ඉවත්ව ඇත්නම් ඒ පිළිබඳව සාකච්ඡා කිරීම වැදගත් වෙයි.

**ගිණුම් මකා දැමීම** - සමාජ මාධ්‍ය ජාලා තුළින් ඇති වන කැළඹීම් නිසා බොහෝ තරුණ තරුණියන් තම ගිණුම මකා දැමීමට හෝ අක්‍රීය කිරීමට තීරණය කරයි. මෙය ඉතා වැදගත් සංඥාවක් ලෙස සැලකිය හැක. එයින් පැහැදිලි වන්නේ ඔවුන්ට හිංසනයන්ට මුහුණ දීමට නොහැකිව එම අවස්ථාවෙන් පලා යාමට උත්සාහ කරන බවයි. එනම් ඔවුන්ට සියලු සම්බන්ධතා අත්හැර දැමීමට තරම් ප්‍රබල බලපෑම් එල්ල වී ඇති බවයි.

**"අනෙක් අයව අවහිර කරන්නේ කෙසේද?" යන්න විමසීම** - දරුවා වෙනත් කෙනෙකු සමාජ මාධ්‍ය ජාලා තුළ අවහිර කරන්නේ කෙසේද යන්න ඔබෙන් විමසයි නම් ඒ පිළිබඳ වැඩිදුර සොයාබැලීම වැදගත් විය හැක.

**ස්වරූපයේ වෙනස්වීම** - දරුවා, ඔහුගේ පරිගණකය හෝ ජංගම දුරකථනය ක්‍රියා විරහිත කර දමන ආකාරය හා ඒවා භාවිතයෙන් ඉවත් කරන ආකාරය පිළිබඳව ඔබගේ අවධානය යොමු කරන්න. එමගින් ඔහු මුහුණපා ඇති තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයන් සපයනු ඇත.

**ආත්ම අභිමානය පහත වැටීම** - "ජීවිතය තේරුමක් නෑ", "මට එපා වෙලා", "මිනිස්සු මහ එපා කරපු ජාතියක්" වැනි අදහස් දැක්වීමෙන් සියලු දේ කෙරෙහි අප්‍රසාදයෙන් සිටීම දරුවා අන්තර්ජාලය තුළ අපහසුතාවකට ලක්වන බව පෙන්වන ප්‍රබල ප්‍රකාශයන් වේ. "මොකක් ද වෙලා තියෙන්නෙ කියලා මට කියන්න" යන්න එවැනි ඕනෑම ගැටලුවකට ඉතා හොඳ ප්‍රතිචාරයකි.

**කායික වෙනස්කම්** - ආහාර චර්යාවේ වෙනස්කම්, නින්දෙහි අක්‍රමිකතා දරුවා අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික සූරාකෑම් වලට ලක්වී ඇතැයි සැලකීමට හේතුන් වේ. ඔවුන්ගේ පරිගණක හෝ ජංගම දුරකථන වෙනත් කෙනෙකු භාවිත කරන විට දී ඔවුන් කලබල හා ඉතා නොසන්සුන්තාවයට පත්වීම පිළිබඳ වැඩිදුර සොයාබැලීම වැදගත් විය හැක.

මෙයට අමතරව ළමයෙකු අන්තර්ජාලය හරහා පෙළඹීමට ලක්වන බව හඳුනා ගැනීමට පහත ලක්ෂණ උපකාර විය හැක.

- අන්තර්ජාලය තුළ සිටින විටදී හා අනෙක් අවස්ථාවලදී ඔවුන්ගේ කාලය ගතකරන්නේ කෙසේද යන්න පිළිබඳව ඉතා රහසිගතව සිටීම.
- වයසින් ඉතා වැඩි පෙම්වතෙක් හෝ පෙම්වතියක් සිටීම.
- ඔවුන්ට ලැබුණු ආකාරය විස්තර කළ නොහැකි හෝ විස්තර නොකරන මුදල් හෝ ඇඳුම් පැළඳුම් සහ ජංගම දුරකථන වැනි ආගන්තුක දෑ පරිහරණය කිරීම.
- බාල වයසේදීම මත්පැන් පානය කිරීම හෝ මත් ද්‍රව්‍ය ගැනීම.
- අන්තර්ජාලය සහ ඔවුන්ගේ මෙවලම් භාවිතා කරන කාලය වෙනදාට වඩා අඩු හෝ වැඩිවීම.
- කලබලකාරී ස්වභාවයෙන් හෝ අවුල් වූ සිතැතිව සිටීම, ඉවත්වීම පසුබැසීම හෝ පීඩාවට පත්වීම.
- ලිංගිකමය හැසිරීම වයසට නොගැලපෙන භාෂාව හෝ ලිංගිකත්වය පිළිබඳ අදහස් හා දැනුමෙන් යුක්තව සිටීම.
- නිවසින් බැහැරව වැඩි කාලයක් ගත කිරීම හෝ කාලයක් තිස්සේ අතුරුදන් වී සිටීම.

තමන්, ලිංගික කටයුතු සඳහා පෙළඹවීමට ලක් වී ඇති බව දරුවෙකුට දැන ගැනීමට අපහසුය. ඔවුන් කනස්සල්ලට හෝ ව්‍යාකූලත්වයට පත්විය හැකි අතර ඔවුන් විශ්වාස කරන වැඩිහිටියෙකු සමඟ කථා කිරීමට ඇති ඉඩකඩ අඩුය. ඔබ දරුවෙකු පිළිබඳව සැළකිලිමත් වී ඔවුන් සමඟ කතා කිරීමට කැමති නම්, එවැනි අසීරු හා බැරෑරුම් සංවාදයක් පැවැත්වීමට පහත උපදෙස් ප්‍රයෝජනවත් වනු ඇත.

## 5.2 ඔබ වින්දිතයෙකු පිළිබඳව දැන ගත් විට කුමක් කළ යුතුද?

අන්තර්ජාලය හරහා ළමයෙකු හිංසනයට ලක්වේ නම් එය බරපතල තත්ත්වයකි. ළමයෙකු එසේ හිංසනයට ලක්වේ නම් එවැනි අවස්ථාවන් සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ග තුළින් ඔවුන්ට උපකාර කිරීම වැදගත් වේ.

එය ළමයාගේ වරදක් නොවන බව පළමුවෙන්ම ළමයාට වටහා දෙන්න. ළමයාව කිසිවෙකු කෲරත්වයට පත් කරන්නේ නම් එය හිංසනයක් වන අතර, එය අපයෝජනයක් හා සූරාකෑමක් වන අතර එය ළමයාට දොස්පැවරිය යුතු කරුණක් නොවේ. කෲර ලෙස සැලකුම් ලැබීමට කිසිවෙකුත් අපේක්ෂා කරන්නේ නැත.

ඔහු/ඇය අසාධාරණයකට ලක්ව ඇති බවත් එම ළමයා වෙනුවෙන් ඔබ පෙනීසිටින බවත් ඔහුට/ඇයට දැනගැනීමට සලස්වන්න.

ඔහු/ඇය ඒ පිළිබඳව කතා කිරීමට තරම් ඔහු/ඇය සතු නිර්භීත බව අගය කර එසේ කතා කිරීම වැදගත් බව ඔවුන්ට මතක් කර දෙන්න. ඔවුන් කියන දේට හොඳින් සැලකිල්ලෙන් සවන් දෙන්න.

අන්තර්ජාලය හරහා හිංසනයන්ට ලක්වීමේදී ඒ පිළිබඳ තොරතුරු රැස්කර ගැනීමට ඒවා තැන්පත් කර තබා ගැනීමට සහ උපකාර සඳහා තවත් අයෙකුට පෙන්වීමට බොහෝ විට හැකියාව ඇත. ඔවුන්ට සාක්ෂි රැස්කිරීමට හා ඒවා සුරක්ෂිත කර ගැනීමට උදව් වන්න, උදා: තිරයේ දිස් වුණු දෑ ඡායාරූප ගත කිරීම (Screen Shot), ඡායාරූප, කෙටි පණිවිඩ හා විද්‍යුත් තැපැලෙන් ලද ලිපි.

ළමයා හිංසනයට ලක් කිරීම ආරම්භ කළ පාර්ශවය ළමයා ගෙන් කිසියම් ප්‍රතිචාරයක් බලාපොරොත්තු වෙයි. එවිට ඔවුන් බල සම්පන්න යැයි සිතයි. නමුත් හිංසකයෙකු බල සම්පන්න අයෙකු යැයි ඒත්තු ගැන්වීමට අවශ්‍ය නැත. හිංසකයෙකු සමඟ එකට එක කිරීමෙන් ළමයා තව තවත් එහි පැටලෙනු ඇත. එබැවින් එම අවස්ථාවෙන් මිදීමට වග බලා ගන්න.

බොහෝ සමාජ මාධ්‍ය ජාලා හා සේවාවන් ඔබව හිංසනයට ලක් කරන පුද්ගලයා අවහිර කිරීමට අවසර ලබා දේ. අපරාධකරුවා අවහිර (Block) කර ඒ ගැන වාර්තා කිරීමට (Report) යෝජනා කරන්න. හිංසනය, යෙදුමක (Application) වුවද, කෙටි පණිවිඩයක වුවද, අදහස් දැක්වීම් හෝ ඇමිණූ ඡායාරූපයක වුවද විකල්පයක් වශයෙන් එම පුද්ගලයාව අවහිර කිරීමේ හා වාර්තා කිරීමේ හැකියාව ඇත.

ඔහුගේ/ඇයගේ ආරක්ෂක පිවිසුම් (Privacy Settings) තරකර ගැනීමට උදව් කරන්න. එවිට ඔවුන්ගේ තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂිත වන අතර අවදානම අවම වනු ඇත.

අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන සූරාකෑම සහ හිංසන වලට එරෙහිව කටයුතු කරන ආකාරය eSafety වෙබ් අඩවිය ඔස්සේ පිරික්සන්න.

දෙමාපියන්ට /පවුලේ වැඩිහිටියකුට/විශ්වාසවන්ත පුද්ගලයෙකුට ඒ බව දැනුම් දීම වඩා යෝග්‍යබව ළමයාට ඒත්තු ගන්වන්න.

අදාළ ගැටලුවට මැදිහත් වීමට වැඩිදුර සහාය අවශ්‍යනම් එම පාර්ශව වෙත යොමුවීමට යෝජනා කරන්න (උදා: වෛද්‍යවරයෙක්, මනෝවිද්‍යා උපදේශකවරයෙක්). අන්තර්ජාලය පිටත දී කායික හානි සිදු කරනවා යැයි තර්ජනය කරයි නම්, එය අදාළ බලධාරීන් වෙත හෝ වෙනත් අදාළ ආයතනයකට වාර්තා කිරීමට යෝජනා කරන්න.

ළමයා පිළිබඳ පසුවිපරමක යෙදීමේ ක්‍රමවේදයක් සැකසීමට උත්සුක වන්න.

## 5.3 ළමයෙකුට දෙමාපියන්/භාරකරුවන් වෙත ප්‍රවේශවීමට මඟ පෙන්වන්නේ කෙසේද?

ළමයකුට; සිදුවන්නේ කුමක්දැයි දෙමව්පියන්ට/භාරකරුවන්ට පැවසීමට අවශ්‍යය නමුත්, සමහරවිට එම සංවාදය පටන් ගන්නේ කෙසේද යන්න හරියාකාරව නොදන්නවා විය හැකිය.

එවැනි අවස්ථාවකදී ප්‍රයෝජනවත් විය හැකි අදහස් කිහිපයක් පහත දැක්වේ.

සිදුවන දේ පිළිබඳ පැහැදිලි අදහසක් ළමයා තුළ ඇති කරවන්න. කරුණු ගොනුකර ගත නොහැකි නම් දෙමව්පියන්ට/භාරකරුවන්ට ළමයාට උදව් විය හැකි හැකියාව අඩුවනු ඇත.ළමයා විසින් ඔවුන්ට සම්පූර්ණ සත්‍ය සිද්ධිය පැහැදිලි කිරීම අත්‍යාවශ්‍ය වේ.

දෙමව්පියන්ගේ/භාරකරුවන්ගේ සම්පූර්ණ අවධානය ඇති විටෙක එය පැවසීමට ළමයා දැනුවත් කරන්න. ඔවුන් යම් දෙයක් සමඟ කාර්ය බහුල නම් ළමයා පවසන දේට ඇහුම්කන් දීමට ඔවුන්ට නොහැකි වනු ඇත. එමෙන්ම දෙමව්පියන් භාරකරුවන් හැකි ඉක්මනින් දැනුවත් වීම ද වැදගත්වනු ඇත.

දෙමව්පියන්ට/භාරකරුවන්ට මේ පිළිබඳ අවබෝධයක් තිබේ නම් දෙමව්පියන් හා එක්ව පිළිතුරු සෙවීමට ළමයා යොදවන්න. ළමයින් දෙමව්පියන්ට/භාරකරුවන් වඩා දේවල් පිළිබඳව දන්නවා විය හැක. එසේනම්, අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික සූරාකෑම හා සයිබර් අවකාශය තුළ සිදුවන හිංසන පිළිබඳව ළමයා දන්නා දේ දෙමාපියන් හා හුවමාරු කිරීම වැදගත් විය හැක.

එවැනි අවස්ථාවක නීතිමය අවකාශය පිළිබඳ ළමයා දෙමව්පියන්/භාරකරුවන් දැනුවත් කරන්න. උපකාරී වේ යැයි ඔබ සිතන වෙබ් අඩවි හා වෙනත් සම්පත් බෙදා ගන්න. මේ ආකාරයට ඔබ කියන්නේ කුමක් ද යන්න පිළිබඳව ඔවුන්ට වඩා හොඳ අදහසක් ලබා ගත හැකිවනු ඇත.

ළමයාට දෙමව්පියන්/භාරකරුවන් සමඟ සංවාදය ආරම්භ කළ හැකි ආකාර කිහිපයක් පහත දැක්වේ.

- අම්මේ/තාත්තේ, ඉන්ටනෙට් එකේ වෙච්ච දෙයක් ගැන කියන්න ඕනෑ. මම දන්නේ නෑ ඒක කියන්නේ කොහොමද කියලා. ඇත්තටම උනේ මේකයි.
- "අම්මේ/තාත්තේ මට දවසක් මේ මැසේජ් එක ආවා. ඒක දැක්කම මම කලබල වුණා ".
- "අම්මේ/තාත්තේ ප්‍රශ්නයක් තියෙනවා මට ඒක විසඳගන්න උදව් කරන්න". ළමයින් මෙබඳු සයිබර් වින්දිතභාවයන්ට ලක්වීමෙන් වළක්වා ගැනීමට දෙමාපියන්ට හා භාරකරුවන්ට විශාල කාර්යභාරයක් සිදුකළ හැක.

**සුරක්ෂිතව සිටීම පිළිබඳව දරුවන් සමඟ කතා කරන්න.**

- වඩාත් යහපත් සම්බන්ධයක් සහ අන්තර්ජාලය තුළ අරක්ෂිතව සිටින්නේ කෙසේද යන්න පිළිබඳව ළමයින්ට සහ යෞවනයින්ට ඉගැන්වීම ලිංගික සූරාකෑම වැළැක්වීමට උපකාරීවේ. මෙම අඩිතාලම දැමීම දරුවෙකුගේ කුඩා වයසේ සිටම ආරම්භ කළ හැකිය.
- ඔවුන්ට සිදුවිය හැකි කරදර, හිරිහැරයන් ගැන ඔවුන්ට කතා කළ හැකි විශ්වාසවන්ත වැඩිහිටියන් කල් ඇතිව හඳුනාගෙන අවබෝධයෙන් සිටීමට දරුවන් දැනුවත් කරන්න.

**ළමයින්ට අන්තර්ජාලය තුළ සුරක්ෂිත වීමට උදව් කරන්න.**

- ඔබේ දරුවන් අන්තර්ජාලය හරහා සිදුකරන ක්‍රියාකාරකම් සම්බන්ධව විනිවිදභාවයක් ඇතිකර ගැනීම සඳහා ඔවුන්ව දිරිමත් කරන්න.
- දෙමාපිය අධීක්ෂණය යටතේ අන්තර්ජාලය සහ ඒ ආශ්‍රිත මෙවලම් භාවිතා කිරීමට දරුවන්ට අවකාශ සලසන්න.
- අන්තර්ජාලය හරහා තොරතුරු හුවමාරුකර ගැනීමේ ඇති අවදානම ගැන ඉගෙන ගැනීමට ළමයින්ට උදව් වන්න. ඔවුන්ව දැනුවත් කරන්න.
- ළමයින් සහ යෞවනයන් භාවිත කරනු ලබන යෙදවුම් (Apps) සහ ක්‍රීඩා පිළිබඳව කාලීන තොරතුරු දැනගන්න. එමෙන්ම අවශ්‍ය විටෙක දරුවන් කෙරෙහි දෙමාපියන් ගේ පාලනයද ක්‍රියාත්මක කරන්න.

## 5.4 සයිබර් වින්දිතභාවයේ බලපෑම්

සයිබර් වින්දිතභාවය තුළින් කෙටි හා දිගු කාලීන බලපෑම් දරුවෙකුට ඇතිවිය හැකිය. එය සිදුවූයේ අන්තර්ජාලයෙන් පිටතදී මුහුණට මුහුණ හමුවීම් සහිතව හෝ රහිතව වුවද එහි බලපෑම් ජීවිත කාලය පුරාම පැවතිය හැකිය.

මේ මඟින් ළමයෙකුට නිදා ගැනීමේ අපහසුතා ඇතිවිය හැකිය. කනස්සල්ලට/කාන්සාවට පත්වීම හෝ පාසල් වැඩකටයුතු කෙරෙහි අවධානය යොමු කිරීමට හෝ ඒවාට මුහුණ දීම සඳහා බලවත් පරිශ්‍රමයන් දැරීමට සිදුවේ. ඔවුන් ක්‍රම ක්‍රමයෙන් මුළුගැන්වීම, අන් අය සමඟ පවතින සන්නිවේදන සබඳතා අඩු කිරීම/හෝ මුළුමනින්ම අතහැර දැමීම සහ කෝපයට පත්වීම හෝ කලබලකාරී හෝ අවුල් සහගත බවින් යුතු තත්ත්වයකට පත්විය හැකිය.

මෙයට අමතරව ඔවුන් පහත සඳහන් දේ සමඟ ජීවත් විය හැකිය.

- කාංසාව සහ විෂාදය.
- ආහාර ගැනීමේ අක්‍රමිකතා.
- පශ්චාත් කම්පන සහගත ආතතිය.
- ආතතිය සමනයකර කටයුතු කිරීමට අපහසුවීම.
- ස්වයංහානි (Self harm ) සිදුකර ගැනීම.
- සියදිවි නසා ගැනීමේ සිතුවිලි.
- ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදන.
- ගර්භනීභාවයට පත්වීම.
- ලැජ්ජාව සහ වරදකාරී හැඟීම්වලින් යුක්තවීම.
- මත්ද්‍රව්‍ය සහ මධ්‍යසාර පිළිබඳ ගැටලු.
- පවුල, මිතුරන් සහ සහකරු/සහකාරිය සමඟ පවතින සබඳතාවන්හි ගැටලු

## 5.5 සයිබර් අවකාශය හරහා සිදුවන අපයෝජන වැළැක්වීම

සමාජීය වශයෙන් සිදුවන සයිබර් අපයෝජනයන් වැළැක්වීමට නම් පුද්ගලයෙක් වශයෙන් පුද්ගල අභ්‍යන්තරයේ පවතින මනෝභාවයන් වෙනස්විය යුතුය. ස්වයං පරිවර්තනයන් තුළින් සාකල්‍ය සමාජීය පරිවර්තනයන් කෙරෙහි යොමුවීමට හැකියාව පවතී. ඒ සඳහා තනි පුද්ගලයන් වශයෙන් ගෞරවය, ආත්ම විශ්වාසය හා ආත්ම අභිමානය සහිතව ජීවත් විය යුතු අතර ඒ තුළින් යහපත් සම්බන්ධතාවයන් කෙරෙහි ප්‍රවේශ වීමට හැකියාව ලැබෙනු ඇත.

### 5.5.1 ගෞරවය යනු කුමක්ද?

ගෞරවය යනු පරිණතභාවය හා අන්‍යෝන්‍ය සුහදත්වය මත ගොඩනැගෙන අන්තර් පුද්ගල සම්බන්ධතාවයන් තුළින් සංවර්ධනය වන ආකල්පයකි. තවදුරටත් විස්තර කරන්නේ නම්, ගෞරවය යනු අනෙක් අයගේ විෂමතා පිළිගන්නා ආකල්පයකි. අනෙක් අය සමඟ ගැටුම් ඇති කර නොගෙන සමගියෙන් සිටීමට නම් ඔබ අනෙකාට ගෞරව කිරීම අවශ්‍ය වෙයි.

කෙනෙකුට ගෞරව කිරීම යනු අපගේ **විෂමතා පසෙකට දැමීමකි.** එය අපට අනෙක් පුද්ගලයින්ගේ පෞද්ගලික කැමැත්ත සහ අදහස් විනිශ්චය කිරීමෙන් වැළැකී සිටීමට ද උපකාරී වේ.

කෙනෙකුට ගෞරව කිරීම යනු **ඇයගේ/ඔහුගේ පෞද්ගලිකත්වය පිළිගැනීම,** ඔවුන්ගේ අදහස් සහ හැසිරීම් වෙනස් කරගැනීමට බල නොකිරීමයි.

ගෞරවනීය පුද්ගලයින්; සෑම කෙනෙකුටම **තමන් සැබැවින්ම කවුරුන්දැයි තෝරා ගැනීමේ අයිතියක් ඇති බව වටහා ගනී.** එමෙන්ම යම් කෙනෙකුට තමන් කැමති පුද්ගලයා වීමේ නිදහසක් ඇත්නම්, කිසිම කෙනෙකුට අනෙක් පුද්ගලයින් සම්බන්ධයෙන් විනිශ්චය කිරීමට, තීරණ ගැනීමට කිසිදු අයිතියක් හෝ වගකීමක් නැත.

ඔබ කෙනෙකුගේ ජීවන රටාව, ඔවුන් යම් දෙයකට මුහුණ දෙන ආකාරය, තීරණ ගන්නා ආකාරය හෝ හැසිරීම පිළිබඳව **විනිශ්චයන් ඉදිරිපත් නොකරන විට,** එයින් ඔබ ඔබේ ගෞරවය ඔවුන් වෙත ලබාදෙයි. විවිධ පුද්ගලයින්ට විවිධ රුචිකත්වයන් ඇති බව අපි නිතරම සිහියේ තබා ගැනීම වැදගත් වෙයි.

ඔබ කිසිවෙකු හැසිරිය යුතු ආකාරය හෝ ඔබ අපේක්ෂා කරන ආකාරය පිළිබඳව චෝදනා නොකරයි නම් එය ද ඔබ තවත් කෙනෙකුට දක්වන ගෞරවයකි.

**අපි අනෙක් අයගේ පෞද්ගලිකත්වය පිළිබඳ පිළිගැනීම, විශ්වාස කිරීම** ඒ අය කෙරෙහි අපට ඇති ගෞරවය පෙන්විය හැකි ඉතාම ප්‍රශස්ථ අවස්ථාවයි.

ගෞරවය ආකාර තුනකින් පවතින බව වටහා ගැනීම වැදගත් වෙයි. තමන් කෙරෙහි පවතින, සෙසු අය කෙරෙහි පවතින හා සෙසු අයගේ විවිධත්වය කෙරෙහි දක්වන ගෞරවය වශයෙනි.

### 5.5.2 ආත්ම අභිමානය සහ ආත්ම විශ්වාසය යනු කුමක්ද?

තමා පිළිබඳව ඇති වටිනාකම් පද්ධතිය පිළිබඳ කෙනෙකු සතුවන සමස්ත තක්සේරුව ආත්ම අභිමානය වශයෙන් හැඳින්විය හැකිය. වෙනත් වචනවලින් කියන්නේ නම් ඔබට ඔබ පිළිබඳව ඇති අගය හා කැමැත්තයි. ආත්ම අභිමානය යනු ඔබ කෙරෙහි ඔබ තුළ පවතින විශ්වාසයන්ගේ සංකලනයකි. එනම්, සමාජය හමුවේ ඔබ පෙනී සිටින ආකාරය, ඔබේ විශ්වාසයන්, චිත්තවේගයන් හා චර්යා රටාවන් පිළිබඳ ඔබේ විශ්වාසයයි. ජීවිත කාලය පුරාවටම ඔබේ සාර්ථකත්වය සහ අභිප්‍රේරණය සඳහා ආත්ම අභිමානය මහගු කාර්යභාරයක් ඉටු කරනු ලබයි. යහපත් ආත්ම අභිමානයක් තිබීම ජීවිතයේ ධනාත්මක ආකර්ෂණීය ආකල්ප ඇතිව ජීවත් වීමට මෙන්ම ඔබේ අරමුණු ඉටු කර ගැනීමට හැකි යැයි විශ්වාසය ඇති කරගැනීමට උපකාරී වේ.

| උසස් ආත්ම අභිමානයක් ඇති පුද්ගලයින් | දුර්වල ආත්ම අභිමානයක් ඇති පුද්ගලයින් |
|---|---|
| තමන් තුළ පවත්නා හොඳ ගැන සිතයි. | තමන් තුළ පවත්නා හොඳක් ගැන නොසිතයි. |
| තමන්ට කළ හැකි දේ ගැන ආඩම්බර වෙයි. | තමන් අනෙක් අය මෙන් හොඳ යැයි නොසිතයි. |
| සෑම ප්‍රයත්නයක්ම සාර්ථක නොවුණත්, තමන් ගැන විශ්වාසයෙන් කටයුතු කරයි. | තමන් ගැන අඩු තක්සේරුවෙන් ලෙහෙසියෙන්ම යම් කාර්යයක් අත් හරිනු ලබයි. |
| කරුණාව හෝ යමක් කිරීමට ඇති හැකියාව වැනි තමා සතු හොඳ ගතිගුණ දකී. යහපත් ආකල්ප ගැන සිතයි. | යමක් හොඳින් සිදු කළ අවස්ථා ගැන සිතනවාට වඩා තමන් පසු බෑමට ලක් වූ අවස්ථා ගැන සිතයි. යහපත් ආකල්ප ගැන නොසිතයි. |
| සෙසු අය තමන්ට දක්වන කැමැත්ත, ආදරය, ගෞරවය ගැන දැනෙයි. | සෙසු අය තමන්ට දක්වන කැමැත්ත, ආදරය, ගෞරවය ගැන නොදැනෙයි. |
| තමන් අතින් වරදක් සිදු වූ විට එය පිළිගනියි. | තමාගේ බොහෝමයක් දේ නරක යැයි සිතයි. තමන් අතින් වරදක් වූ විට පිළිගැනීමට පසුබට වෙයි. |

යහපත් සහ ධනාත්මක ආත්ම අභිමානයක් ගොඩනඟා ගැනීමට කෙනෙකු සතුවන ආත්ම විශ්වාසය ද ඉවහල් වේ. ආත්ම විශ්වාසය ගොඩනඟා ගැනීමට කෙනෙකුට තමන් සතු හැකියාවන්, කුසලතාවයන් පිළිබඳව අවබෝධය ඉවහල් වෙයි. හොඳ ආත්ම විශ්වාසය යහපත් ආත්ම අභිමානයක තීරණාත්මක සාධකයක් වන අතර කෙනෙකු ගොඩනගා ගෙන ඇති ආත්ම අභිමානය තමා තුළ නිරවුල් හා ශක්තිමත් විශ්වාසයක් ගොඩනඟා ගැනීමට හා ශක්තිමත්කර ගැනීමට ඉවහල් වේ.

### 5.5.3 යහපත් සම්බන්ධතාවයක් යනු කුමක්ද?

සම්බන්ධතාවයක් සැමවිටම කොපමණ යහපත්දැයි තීරණය කළ හැක්කේ සම්බන්ධතාවය පවත්වා ගෙන යන අයට පමණි. ඇතැම් විට සම්බන්ධතාවලදී පුද්ගලයන් ව්‍යාජ ප්‍රතිරූප මවාපායි යහපත් සම්බන්ධතාවයන් සඳහා ප්‍රධානතම සාධකය වන්නේ අව්‍යාජ ප්‍රතිරූපයක් සහිත අන්‍යෝන්‍යය සුහදතාවයි.

යහපත් සම්බන්ධයක් සඳහා පහත කරුණු වැදගත්වේ.

- තමා කෙරෙහි ඇති ගෞරවය, තමා තුළ ඇති හැඟීම් හා වටිනාකම් පිළිබඳ ඇති අවබෝධය.
- අනෙක් අයගේ හැඟීම් පිළිබඳව සංවේදී වී ඔවුන්ගේ ආත්ම අභිමානයට හා අයිතීන් වලට ගරු කිරීම.

- අපේක්ෂාවන් හුවමාරු කර ගැනීම.

- අවංක බව සහ නිර්ව්‍යාජ බව.

- යහපත් සන්නිවේදන හා භාෂා හැකියාවන්.

- අන්‍යෝන්‍ය උපකාරය.

- එකිනෙකා ගැන සිතීම, එකට කාලය ගත කිරීම සහ එකිනෙකා කෙරෙහි අවධානය යොමු කිරීම.

තෘප්තිමත් සහ ගෞරවණීය සම්බන්ධතාවයක් පැවතීම අපේ යථාර්ථය මෙන්ම අපේ ඉලක්කය විය යුතුය. ඕනෑම සම්බන්ධතාවයක යහපැවැත්ම මෙන්ම දිගු කාලීන බව තහවුරු කිරීමට තෘප්තිමත් බව සහ ගෞරවණීය බව අත්‍යවශ්‍ය වේ. සම්බන්ධතාවක් තුළ කිසිදාක බලකිරීමක් හෝ අපහසුතාවක් සිදු නොවිය යුතුය.



# සටහන්

# නෛතික රාමුව හා ආයතනික ව්‍යුහය

# පියවර 6



## 6.1 හැඳින්වීම

ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට, අපයෝජනයට හා සූරාකෑමට එරෙහිව ප්‍රතිචාර දැක්වීමේ දී නීතිය හා නීතිය ක්‍රියාත්මක කරන ආයතන වෙත වැඩි වගකීමක් පැවරෙයි. වගකීම් සහගත සමාජයක් ගොඩ නැගීමේ දී සෑම අයෙකුම සතු නීතිය පිළිබඳ දැනුම හා අවබෝධය තීරණාත්මක සාධකයක් වෙයි. නීතියේ බලය හා ආධිපත්‍යය බිඳ වැටුණු සමාජයක් අරාජික තත්ත්වයට පත් වීමේ ඉතා ඉහළ සම්භාවිතාවක් ඇති අතර එහි අනිවාර්ය ප්‍රතිඵලයක් වශයෙන් මිනිස් ජීවිත අනාරක්ෂිත හා අවදානම්කාරී තත්ත්වයට පත් වෙයි.

සමාජයක් ගත් කල ළමයින් සාපේක්ෂව ප්‍රචණ්ඩත්වයට, අපයෝජනයට හා සූරාකෑමට ලක් වීමේ අවදානම හා ප්‍රවණතාවය වඩා වැඩි බව පැහැදිලි කරුණකි. මේවා හුදෙක් අපරාධ හා වරදවල් පමණක් නොවේ. ඒවා දේශීය නීතීන් මෙන්ම අන්තර්ජාතික මානව හිමිකම් පිළිබඳ සම්මුතීන්හි අන්තර්ගත අයිතිවාසිකම් බරපතල ලෙස උල්ලංඝනය කිරීම් වෙයි.

වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ලිංගිකත්වය, හැකියා මට්ටම් ආදී විවිධත්වයන් අනුව කිසිදු වෙනස් කොට සැළකීමකට භාජනය නොවී ළමයින්ට ජීවත්වීමට, ස්වකීය යහ පැවැත්ම හා සංවර්ධනය තහවුරු කර ගැනීමට හා උපරිම යහපත සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය සාධනීය වටපිටාව සැකසීමට සමත් ඉතාමත් වැදගත් හා තීරණාත්මක අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පිළිබඳ සම්මුතීන් සෑම එකක්ම පාහේ ශ්‍රී ලංකා රජය විසින් පිළිගෙන, ස්ථිර කොට අත්සන් තබා තිබීම රටක් වශයෙන් සතුටට පත් විය හැකි කරුණකි.

**ශ්‍රී ලංකාව විසින් ස්ථිර කරන ලද මානව අයිතිවාසිකම් පිළිබඳ සම්මුතීන්**

| ජාත්‍යන්තර සම්මුතිය | ශ්‍රී ලංකාව විසින් ස්ථිර කොට පිළිගත් දිනය |
|---|---|
| 1948 මිනිස් අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය UDHR | 1980 (Ratified) |
| 1966 දෙසැම්බර් 16 දින සම්මත වූ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතීය සම්මුතිය | 1980 ජූනි 11 |
| 1966 දෙසැම්බර් 16 දින සම්මත වූ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතීය සම්මුතිය | 1980 ජූනි 11 |
| 1979 දෙසැම්බර් 18 දින සම්මත වූ කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය. | 1981 ඔක්තෝම්බර් 5 |
| 1999 ඔක්තෝබර් 6 දින සම්මත වූ කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියට අදාළ වෛකල්පිත සන්ධානය | 2002 ඔක්තෝබර් 15 |
| 1989 නොවැම්බර් 20 දින සම්මත වූ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය | 1991 ජූලි 12 |
| 2000 මැයි 25 සම්මත වූ සන්නද්ධ අරගලවලට ළමයින් යොදා ගැනීමට අදාළ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළ වෛකල්පිත සන්ධානය | 2000 සැප්තැම්බර් 8 |
| 2000 මැයි 25 සම්මත වූ ළමයින් විකිණීම, ළමා ගණිකා වෘත්තිය සහ ළමා අශ්ලීල ප්‍රකාශනවලට අදාළ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළ වෛකල්පිත සන්ධානය. | 2002 සැප්තැම්බර් 22 |

6.1 වගුව

## 6.2 ළමා අපයෝජන වින්දිතයන්ට රැකවරණය හා ප්‍රතිචාර දැක්වීම සඳහා වන දේශීය නීතිය



80 දශකයෙන් ඉක්බිතිව එළැඹි කාලවකවානුව තුළ සිදු වූ විශාල සමාජීය, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික පෙරළියත් සමග ශ්‍රී ලාංකීය ජන ජීවිතයට බොහෝ බලපෑම් සිදු වූ බව කවුරුත් පිළිගන්නා කරුණකි. වසර 30කට අධික කාලයක් පැවැති සිවිල් යුද්ධය හා සමගාමීව රට අභ්‍යන්තරයේ හට ගත් සිවිල් හා දේශපාලන අර්බුද හේතුවෙන්, සාමාන්‍ය ජන ජීවිතය වසා ගත් ප්‍රචණ්ඩකාරී පරිසරයක් නිර්මාණය වූ බව පසුගිය වසර 20ක පමණ කාලයක් තිස්සේ වාර්තා වූ විවිධ අපරාධ පිළිබඳ සිද්ධීන් හා ඒවායෙහි සීඝ්‍ර වර්ධනය සාක්ෂි දරයි. අවාසනාවට මෙන් ඉහළයාමේ ප්‍රවණතාවයක් පෙන්වන අපරාධ හා ප්‍රචණ්ඩකාරී වාතාවරණයෙහි ඉතා පහසු හා ආසන්නතම ගොදුරු බවට පත් වීමේ වැඩි අවදානමකට ලක් වී ඇත්තේ ළමයින් හා කාන්තාවන්ය.

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ ළමා හා කාන්තා කාර්යාංශය විසින් පවත්වා ගෙන යනු ලබන සංඛ්‍යා දත්තයන්ට අනුව වසර 2005 සිට 2016 දක්වා කාල පරාසය තුළ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩකාරී සිද්ධීන් 33,000 ක් වාර්තා වී ඇත. 2006 වසරෙහි වාර්තා වූ ස්ත්‍රී දූෂණ හා ව්‍යාභිචාරී අපරාධමය සිද්ධීන් ප්‍රමාණය 1463 ක් වී ඇති අතර වසර 10 කට පසු එනම් 2016 වන විට එම ප්‍රමාණය සිද්ධීන් 2036 ක් දක්වා ඉහළ ගොස් ඇත. එය ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ 40% ක වර්ධනයකි. එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ ඇස්තමේන්තුවකට අනුව සෑම ශ්‍රී ලාංකික කාන්තාවන් සිව්දෙනෙකුගෙන් එක් අයෙකුම වයස අවුරුදු 18 වන විට ලිංගික අපයෝජනයකට ලක් වී ඇති බව අනාවරණය කරයි.

සාපේක්ෂව ශ්‍රී ලාංකීය පිරිමි ළමයින් ද ලිංගිකව අපයෝජනයට ලක්වීමේ ඉතා ඉහළ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන අතර විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය ආශ්‍රිතව පිරිමි ළමයින්ට එරෙහිව සිදුවන අපයෝජන, හිංසන හා සූරාකෑම පිළිබඳව ශ්‍රී ලංකාව කුප්‍රකටය.

ශතවර්ෂයකට අධික කාලයකට පෙර සම්මත කළ දණ්ඩ නීති සංග්‍රහය, ළමයින්ට හා කාන්තාවන්ට එරෙහිව සිදුවන හා ඉහළ යාමේ ප්‍රවණතාවයක් පෙන්වන අපරාධ මැඬලීමේ අරමුණින් 1995 දී සංශෝධනය විය. 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත, 1998 අංක 29 සහ 2006 අංක 16 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් දෙකින් නැවතත් සංශෝධනය විය. මෙම දණ්ඩ නීති සංග්‍රහ සංශෝධන පනත් මඟින් ළමයින්ට හා කාන්තාවන්ට එරෙහිව සිදුවන අපරාධ විශේෂයෙන්ම ලිංගික අපයෝජන, හිංසන හා සූරාකෑම ඉතා පුළුල් පරාසයක් තුළ හඳුනාගෙන එවැනි අපරාධමය වැරදි සිදු කරන්නන්ට ලබා දිය හැකි දඬුවම් සුවිශේෂීව දක්වා ඇත. මෙම සංශෝධනයන් මගින් වින්දිතයන්ට සිදුවන මනෝ විද්‍යාත්මක හෝ මානසික කම්පනය ද අපරාධයන්ට එරෙහි යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ දී සැලකිල්ලට භාජනය කර ඇත. දණ්ඩ නීති සංග්‍රහය උක්ත පනත් මගින් සංශෝධනය කරන විට වැඩි අවධානයක් ළමයින්ට එරෙහි ලිංගිකමය අපරාධ කෙරෙහි යොමු කර ඇති බව පහත සංක්ෂිප්ත වගුව පරිශීලනය කරන විට පැහැදිලි වනු ඇත.

ළමයින්ට හා කාන්තාවන්ට එරෙහි දණ්ඩනීය වරදවල්

| නීතිමය ප්‍රතිපාදනය | වරද | අදාළ දණ්ඩ නීති සංග්‍රහ සංශෝධන පනත |
|---|---|---|
| 286 අ | ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය පළ කිරීම්, ප්‍රදර්ශන ආදිය | 1995 අංක 22<br>1998 අංක 29 |
| 286 ආ | ළමයෙකු ලිංගික අපයෝජනය කිරීම වැළැක්වීම පරිගණක මගින් සේවා සපයන තැනැත්තෙකුගේ කාර්යය බව මෙය පැහැර හැරීම අපරාධමය වරදක් බව | 2006 අංක 16 |
| 286 ඇ | ළමා අපයෝජනය සඳහා පරිශ්‍රයක් භාවිත කරන බවට දැනුම් දීමට ඇති කාර්ය භාරය - මෙය පැහැර හැරීම අපරාධමය වරදක් බව | 2006 අංක 16 |
| 288 | ළමයින්ට සිඟා කෑමට සැළැස්වීම හෝ කුට්ටනය | 1998 අංක 29 |
| 288 අ | ලිංගික සංසර්ගය සඳහා කුට්ටානියකු වශයෙන් ක්‍රියා කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම | 1998 අංක 29 |
| 288 ආ | සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයෙහි යෙදවීම | 1998 අංක 29 |
| 308 අ | ළමයින් කෲරත්වයට භාජනය කිරීම | 1995 අංක 22 |
| 311 | බරපතල තුවාල | 1995 අංක 22 |
| 345 | ලිංගික අතවර කිරීම | 1995 අංක 22 |
| 360 අ | කුට්ටනය | 1995 අංක 22 |
| 360 ආ | ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | 1995 අංක 22 |
| 360 ඇ | තැනැත්තන් වෙළඳාම් කිරීම | 1995 අංක 22<br>2006 අංක 16 |
| 360 ඉ | ළමයකු පොලඹවා ගැනීමට ඇවිටිලි කිරීම | 1995 අංක 22 |
| 363ඇ | ස්ත්‍රී දූෂණය | 1995 අංක 22 |
| 364 අ | ව්‍යාභිචාරය | 1995 අංක 22 |
| 365 | අස්වාභාවික වැරදි | 1995 අංක 22 |
| 365 අ | තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා | 1995 අංක 22 |
| 365 ආ | බරපතල ලිංගික අපයෝජනය | 1995 අංක 22 |
| 365 ඇ | ඇතැම් වැරදිවලට අදාළ කරුණු පල කිරීම | 1995 අංක 22 |

6.2 වගුව

ළමයින්ට හා කාන්තාවන්ට එරෙහි ලිංගික අපරාධ නිසා ඔවුන් අත් විඳින මානසික කම්පනය හා චිත්තවේගී වේදනාව එම අපරාධයන්ට ගොදුරු වීම නිසා ඇති වන ශාරීරික වේදනාවට වඩා කිහිප ගුණයක් වනු ඇති අතර ජීවිත කාලය පුරාම ඔවුන් ඒ නිසා තැවෙනු දැවෙනු ඇත. සමාජය, විශේෂයෙන්ම තමාට සමීපතමයන් ම විසින් එල්ල කරන නින්දා අපවාද, වෙනස් කොට සැලකීම් හා කොන් කිරීම් නිසා ඔවුන් නැවත නැවතත් වින්දිතභාවයට පත් වෙයි.

ළමයින්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වය, ලිංගික සූරාකෑම හා අයුතු ලිංගික ප්‍රයෝජනයට එරෙහි ව්‍යවස්ථාපිත නීතීන් පිළිබඳ 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන පනත) තීරණාත්මක හැරවුම් ලක්ෂය වන අතර එයින් අනතුරුව සිදු කර ඇති 1998 අංක 29 සහ 2006 අංක 16 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් දෙකට අමතරව පහත සඳහන් නීතීන් ද පරිශීලනය හා අධ්‍යයනය වැදගත් වනු ඇත.

1841 අංක 4 දරන  අයාල ආඥා පනත

1889 අංක 5 දරන ගණිකා නිවාස ආඥා පනත

1927 අංක 4 දරන අශ්ලීල ප්‍රකාශන පිළිබඳ පනත

1956 අංක 48 දරන ළමයින්ට හා තරුණයින්ට (හානි කරවන ප්‍රකාශන) පනත

## 6.3 ළමයින් සයිබර් අවකාශය තුළ වින්දිතභාවයට පත් වීම



කවර ආකාරයේ වුවද ලිංගික අපයෝජනයකට, සූරා කෑමකට ලක් වුවහොත් ළමයෙකුගේ උපරිම යහපත වෙනුවෙන් පරිශීලනයට ගත හැකි නීතිමය ප්‍රතිපාදන පිළිබඳව මෙතෙක් අපි සාකච්ඡා කළෙමු. එහිදී අපගේ අවධානය නිරායාසයෙන්ම යොමු වී තිබුණේ අපගේ දෛනික ජීවිතය තුළ, අපගේ පියවි ඇසට ලක් වන භෞතික අවකාශය තුළ සිදුවන අපයෝජන හා ඒවාට ප්‍රතිචාරාත්මක වශයෙන් නීතිමය ප්‍රතිපාදන භාවිත වන ආකාරය පිළිබඳවයි.

මී ළඟට අප අවධානය යොමු කරන්නේ සයිබර් අවකාශය තුළ (අන්තර්ජාලය භාවිතය, ඩිජිටල් උපාංග භාවිතය හා සමාජ මාධ්‍ය පරිශීලනයේදී) ළමයින් අනතුරු අවදානමකට, අපයෝජනයකට හෝ සූරාකෑමකට ලක් වුවහොත් නෛතික වශයෙන් කිනම් ආකාරයකට ප්‍රතිචාර හා සහාය සේවාවන් ලබා දිය හැකිද යන්න පිළිබඳවයි. සයිබර් අවකාශය තුළ අයෙකුගේ පුද්ගලිකත්වය හා අනන්‍යතාවය, මනෝ සමාජීය ඒකාග්‍රතාවය හා පිළිගැනීම බිඳ වැටෙන ආකාරයෙන් කටයුතු කිරීම, බුද්ධිමය හෝ මූල්‍යමය දේපළ අවභාවිත කිරීම, තර්ජනය කිරීම, බිය වැද්දීම වැනි අපරාධමය වැරදි දිනෙන් දින ඉහළ යන ආකාරය මීට ඉහත කළ සාකච්ඡාවල දී පැහැදිලි විය. මේවා සයිබර් අපරාධ වශයෙන් හැඳින්වෙයි.



## ළමයින් සයිබර් අවකාශය තුළ වින්දිතභාවයට පත්වීම වැළැක්වීම හා ප්‍රතිචාර දැක්වීම සඳහා පවතින අන්තර්ජාතික එකඟතාවයන් හා සම්මුතීන්

| අන්තර්ජාතික සම්මුතිය | ආවරණයවන විෂය පථය |
|---|---|
| ළමයින් විකිණීම, ළමා ගණිකා වෘත්තිය සහ ළමා අශ්ලීල ප්‍රකාශන සම්බන්ධයෙන් ළමා අයිතිවාසිකම් සම්මුතියට අදාළ වෛකල්පිත සන්ධානය<br><br>The Optional Protocol to the Convention on the Rights of the Child on the Sale of Children, Child Prostitution and Child Pornography (OPSC) | ළමයින් ලිංගිකව සූරාකෑම පරමාර්ථ කර ගෙන ළමයින් සම්බන්ධ අශ්ලීල ප්‍රකාශන නිපදවීම, බෙදා හැරීම, ආනයනය, අපනයනය, විකිණීම හා සන්තකයේ තබා ගැනීම ආවරණය කොට ඇත. මෙහි ළමා අශ්ලීල ප්‍රකාශන හා මාධ්‍යයන් වෙත පිවිසීම හා ඒවා හුදෙක් කෙනෙක් සන්තකයේ තබා ගැනීම වරදක් ලෙස සඳහන් වී නොමැත. එසේම පරිගණක/ඩිජිටල් උපාංග භාවිත කොට නිපදවන ළමා ලිංගික අපයෝජන හා සූරාකෑමේ ප්‍රකාශන අශ්ලීල ප්‍රකාශන මාධ්‍යයක් වශයෙන් සැලකිල්ලට භාජනය කොට නොමැති අතර එය වැඩිදියුණු විය යුත්තකි. |
| සයිබර් අපරාධ පිළිබඳ යුරෝපා කවුන්සිලයේ සම්මුතිය (බුඩාපෙස්ට් සම්මුතිය) - 2004 ජූලි 01<br>The Council of Europe Convention on Cybercrime (Budapest Convention) | පරිගණක පද්ධතියක් උපයෝගී කරගෙන ළමයින් සම්බන්ධ අශ්ලීල ප්‍රකාශන නිපදවීම, පිරිනැමීම, බෙදා හැරීම හෝ ව්‍යාප්ත කිරීම, ලබා ගැනීම හා සන්තකයේ තබා ගැනීම ආවරණය කොට ඇත. මෙහි ළමා අශ්ලීල ප්‍රකාශන යන්න නිර්වචනයේදී සැබෑ ලිංගික හැසිරීමක් සහිත තාත්වික දර්ශන හා ඒ සඳහා බාල වයස්කරුවකු පෙනී සිටීම හා දායක වීම සැලකිල්ලට ගෙන ඇත. |
| ලිංගික සූරාකෑම හා ලිංගික අපයෝජන වලින් ළමයින් ආරක්ෂා කිරීම පිළිබඳ යුරෝපා කවුන්සිලයේ සම්මුතිය<br>The Council of Europe Convention on the Protection of Children against Sexual Exploitation and Sexual Abuse (Lanzarote Convention) | ළමයින් සම්බන්ධ අශ්ලීල ප්‍රකාශන නිපදවීම, පිරිනැමීම, බෙදා හැරීම හෝ ව්‍යාප්ත කිරීම, ලබා ගැනීම, සන්තකයේ තබා ගැනීම හා සවිඥාණිකව පරිගණක ආශ්‍රිත ළමා අශ්ලීල ප්‍රකාශන වෙත පිවිසීම ආවරණය කොට ඇත. |
| ළමා ශ්‍රමය පිටු දැකීම සඳහා වන ලෝක කම්කරු සංවිධානයේ 182 සම්මුතිය<br>International Labour Organisation Convention 182 concerning the Prohibition and Immediate Action for the Elimination of the Worst Forms of Child Labour (ILO Convention 182) | ළමා අශ්ලීල ප්‍රකාශන නිෂ්පාදනය සඳහා ළමයින් ලබා ගැනීම හෝ වෙනත් පාර්ශවයන් වෙත ලබා දීම පමණක් ආවරණය කරයි. මෙම සම්මුතියෙහි ළමා අශ්ලීල ප්‍රකාශන හෝ ළමා ලිංගික අපයෝජන/සූරාකෑම පිළිබඳ ප්‍රකාශන හෝ මාධ්‍ය පිළිබඳ නිර්වචනයක් සඳහන් නොවෙයි. |
| සයිබර් සුරක්ෂිතභාවය හා පුද්ගලික තොරතුරු ආරක්ෂාව පිළිබඳ අප්‍රිකානු සංගමයේ සම්මුතිය<br><br>The African Union Convention on Cyber Security and Personal Data Protection (AU Cyber Convention) | ළමයින් සම්බන්ධ අශ්ලීල ප්‍රකාශන නිර්මාණය, ලියාපදිංචිය, පිරිනැමීම, නිෂ්පාදනය, සැපයීම, බෙදා හැරීම හෝ ව්‍යාප්ත කිරීම, ලබා ගැනීම, ආනයනය හෝ අපනයනය, සන්තකයේ තබා ගැනීම ආවරණය කොට ඇත. ළමා අශ්ලීල ප්‍රකාශන යන නිර්වචනයට පරිගණක/ඩිජිටල් උපාංග භාවිත කොට නිපදවන ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන සැලකිල්ලට භාජනය කොට ඇත. |

6.3 වගුව

## 6.4 ළමයින් සයිබර් අවකාශය තුළ වින්දිතභාවයට පත්වීම වැළැක්වීම හා ප්‍රතිචාර දැක්වීම සඳහා පවතින දේශීය නීතිය



**1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන පනත)**

**286 අ. ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය පළ කිරීම් ප්‍රදර්ශන ආදිය**

(1) පහත සඳහන් යම් ක්‍රියාවක් සිදු කරන, එනම් :

(අ) යම් අසභ්‍ය හෝ අශ්ලීල ප්‍රදර්ශනයක හෝ දර්ශනයක පෙනී සිටීමට හෝ රඟපෑමට හෝ, යම් අසභ්‍ය හෝ අශ්ලීල ඡායාරූපයක හෝ චිත්‍රපටයක රූගත කරනු ලැබීමට, එහි නිරූපණයක් කිරීමට හෝ පෙනී සිටීමට, යම් ළමයෙකු කුලියට ගන්නා හෝ සේවයෙහි නියුක්ත කරන, එහි ලා උපකාර කරන, ඒ සඳහා කැමති කරවා ගන්නා, යොදවන, පොලඹවන හෝ බල කරන හෝ එවැනි යම් ඡායාරූපයක් හෝ චිත්‍රපටයක් විකුණන හෝ බෙදාහරින නැතහොත් අන්‍යාකාරයකින් පළ කරන හෝ තම සන්තකයෙහි තබා ගන්නා කවර හෝ තැනැත්තකු; හෝ

(ආ) ළමයකුගේ දෙමව්පියන්ගෙන් කෙනෙකු, භාරකරුවකු හෝ ඒ ළමයාගේ භාරකාරත්වය දරන තැනැත්තකුව සිටිමින්, යම් අසභ්‍ය හෝ අශ්ලීල ප්‍රදර්ශනයක හෝ දර්ශනයක සේවයෙහි නියුක්ත කිරීමට හෝ එවැන්නකට සහභාගි වීමට හෝ (අ) ඡේදයෙහි සඳහන් අන්දමේ යම් ඡායාරූපයක හෝ චිත්‍රපටයක රූගත කරනු ලැබිමට, නිරූපණය කිරීමට හෝ පෙනී සිටිමට ඒ ළමයාට සලස්වන හෝ ඉඩ දෙන කවර හෝ තැනැත්තකු; හෝ

(ඇ) (i) ළමයකුගේ යම් අශ්ලීල ඡායාරූපයක් ගන්නා හෝ ගැනීමට උපකාර කරන කවර හෝ තැනැත්තකු; හෝ

(ii) එවැනි යම් ඡායාරූපයක් බෙදාහරින හෝ පෙන්වන හෝ එවැනි යම් ඡායාරූපයක් සහිත යම් පළ කිරීමක් බෙදාහරින හෝ පෙන්වන කවර තැනැත්තකු; හෝ

(iii) එවැනි යම් ඡායාරූපයක් හෝ පළ කිරීමක් බෙදා හැරීම සඳහා හෝ පෙන්වීම සඳහා තම සන්තකයෙහි තබා ගෙන සිටින කවර හෝ තැනැත්තෙකු; හෝ

(iv) එවැනි යම් ඡායාරූපයක් හෝ පළ කරන හෝ පළ කිරීමට සලස්වන හෝ යම් ප්‍රචාරක දැන්වීමක් පළ කරන්නා හෝ ඒ ප්‍රචාරක දැන්වීමෙහි නම් කර ඇති තැනැත්තා එවැනි යම් ඡායාරූපයක් හෝ පළ කිරීමක් බෙදාහරින නැතහොත් පෙන්වන තැනැත්තකු හෝ එසේ කිරීමට අදහස් කරන තැනැත්තකු ය යන පණිවිඩය දීමට හැකිවන ආකාරයෙන් යම් ප්‍රචාරක දැන්වීමක් පළ කරන හෝ පළ කිරීමට සලස්වන කවර හෝ තැනැත්තකු

ළමයින්ට අදාළව අසභ්‍ය පළ කිරීම් සහ ප්‍රදර්ශනය පිළිබඳ වරද සිදු කරන අතර ඒ තැනැත්තා වරදකරු කරන ලැබූවිට, අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු දහයක් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතුය; තවද, ඒ තැනැත්තාට දඩයකින්ද දඬුවම් කරනු ලැබිය හැකිය.

**360ආ. ළමයින් ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ලබාගැනීම**

(1) පහත දැක්වෙන ක්‍රියාවල යෙදෙන, එනම්:

(අ) යම් ළමයෙකු ලිංගික අපයෝජනයකට පාත්‍ර කිරීමේ කාර්යය සඳහා හෝ කවර වුවද ආකාරයක ලිංගික ක්‍රියාවකට හෝ යම් අසභ්‍ය හෝ අශ්ලීල ප්‍රදර්ශනයකට නැතහොත් දර්ශනයකට ළමයකු සහභාගි කරවා ගැනීම සඳහා යම් පරිශ්‍රයක රැඳී සිටීමට දැන දැනම ඒ ළමයාට ඉඩදෙන ;

(ආ) ලිංගික සංසර්ගය සඳහා හෝ කවර වුවද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා හෝ ළමයකු කුට්ටනය කරන්නකු වශයෙන් ක්‍රියාකරන ;

(ඇ) මුද්‍රණ මාර්ගයෙන් හෝ වෙනත් සන්නිවේදන මාධ්‍යයකින් හෝ වාචිකව කරනු ලබන ප්‍රචාරක දැන්වීම් මගින් හෝ වෙනත් සමාන මාර්ගයකින් ලිංගික සංසර්ගය සඳහා හෝ කවර වුවද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා හෝ ළමයකුගේ සේවාදායකයෙකු වීමට, යම් තැනැත්තකු පොලඹවන;

(ඈ) ළමයෙකු කෙරෙහි තමා දරන වගකීම, බලපෑම හෝ ළමයකු විෂයයෙහි තමාට ඇති ඥාති සම්බන්ධතාව ඒ ළමයා ලිංගික සංසර්ගයෙහි යෙදවීම හෝ කවර වුවද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා කුට්ටනය කිරීම පිණිස ප්‍රයෝජනයට ගන්නා;

(ඉ) ළමයෙකු ලිංගික සංසර්ගයෙහි යෙදවීම හෝ කවර වුව ද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා ඒ ළමයා කුට්ටනය කිරීම පිණිස ඒ ළමයාට තර්ජනය කරන හෝ සාහසිකත්වය පාන;

(ඊ) යම් ළමයෙකු ලිංගික සංසර්ගයෙහි යෙදවීමේ හෝ කවර වුව ද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා වූ චේතනාවෙන් යුතුව ඒ ළමයාට හෝ ඔහුගේ දෙමව්පියන්ට මුදලින් ප්‍රතිෂ්ඨාවක්, භාණ්ඩ හෝ වෙනත් ප්‍රතිලාභ ලබාදෙන

කවර හෝ තැනැත්තකු "ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ වරද" සිදු කරනු ලබන අතර ඒ තැනැත්තා වරදකරු කරනු ලැබූවිට අවුරුදු පහකට නො අඩු වූද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකින් ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතුය. තවද දඩයකින් ද ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය හැකිය.

(2) මේ වගන්තියේ "ළමයා"යන්නෙන් වයස අවුරුදු දහඅටකට අඩු තැනැත්තෙක් අදහස්වේ.

**1998 අංක 29 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන පනත)**



**286 අ. ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය පළ කිරීම් ප්‍රදර්ශන ආදිය**

(2) විකාශනය සඳහා තමාට භාරදෙන ලද යම් ඡායාරූපයක් හෝ චිත්‍රපටයක් ළමයෙකුගේ අසභ්‍ය හෝ අශ්ලීල ඡායාරූපයක් හෝ චිත්‍රපටයක් බව ඡායාරූප හෝ චිත්‍රපට විකාශකයකු වන යම් තැනැත්තෙකු විසින් සොයා ගනු ලැබීමේදී

ඒ තැනැත්තා විසින් නොපමා ව ඔහුගේ සන්තකයේ එම ඡායාරූපය හෝ චිත්‍රපටය තිබෙන බව ළඟම පොලිස් ස්ථානය භාර නිලධාරියාට දැන්විය යුතුය.

(3) (2) වන උප වගන්තියේ විධි විධාන කඩ කරමින් ක්‍රියා කරන ඡායාරූප හෝ චිත්‍රපට විකාශකයෙකු වන කවර හෝ තැනැත්තෙක් අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාරගත කරනු ලැබීමකින් හෝ දඩයකින් හෝ ඒ දෙකෙන්ම හෝ දඬුවම් කරනු ලැබිය යුතුය.

## 2006 අංක 16 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන පනත)

### 286 ආ. ළමයෙකු ලිංගික අපයෝජනය කිරීම වැළැක්වීම පරිගණක මගින් සේවා සපයන තැනැත්තකුගේ කාර්යය බව.

(1) පරිගණකයක් මගින් සේවා සපයන තැනැත්තකු විසින් ළමයකු ලිංගික අපයෝජනය කිරීම සම්බන්ධයෙන් වරදක් සංයුක්තවන ක්‍රියාවක් සිදු කිරීම සඳහා එම පරිගණක පහසුකම භාවිත නොකරන බවට සහතික වීම පිණිස අවශ්‍ය සියලු පියවර ගත යුතුය.

## 1927 අංක 4 දරන අසභ්‍ය ප්‍රකාශන ආඥා පනත

මෙම පනත 1983 සහ 2005 වර්ෂ වලදී සංශෝධනයන්ට ලක් කර ඇත. ඒ අනුව යම් අසභ්‍ය රචනා, රූප, ඡායාරූප, වීඩියෝ, චිත්‍රපට බෙදා හැරීම, ප්‍රසිද්ධකිරීම, නිෂ්පාදනය කිරීම,විකිණීම, සය මසකට නොවැඩි සිර දඬුවමකට ලක් වීමට හා /හෝ දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට ලක්වීමකට හේතුවන අපරාධයක් බව දක්වා තිබේ. ඒ අනුව වයස් බේදයකින් තොරව, යම් පුද්ගලයකුගේ හෝ කණ්ඩායමක අසභ්‍ය ක්‍රියාකාරකමක් හෝ හැසිරීමක් සහිත ප්‍රකාශනයක් පිළිබඳ පැමිණිල්ලක් ලද විට බහුලව නීතිය ක්‍රියාත්මක කරනුයේ මෙම වගන්තිය යටතේය. යම් ආකාරයකින් එකී තොරතුරු ඇතුළත් පරිගණක උපාංගයක් පරීක්ෂා කර සාක්ෂි ලබා ගැනීම අවශ්‍ය වුවහොත් 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත මගින් අවශ්‍ය තොරතුරු අදාළ කර ගත හැක.

## 1956 අංක 48 දරන ළමයින්ට හා තරුණයින්ට (හානි කරවන ප්‍රකාශන) පනත



යම් ළමයකු හෝ තරුණයෙකු අතට පත් වීමට ඉඩ තිබෙන ලිඛිත සහිත හෝ රහිත චිත්‍ර මගින් නිරූපණයවන,

(i) යම් අපරාධයක් කිරීම හෝ

(ii) යම් ප්‍රචණ්ඩ හෝ කෲර ක්‍රියාවක් හෝ

(iii) පිළිකුල් සහගත හෝ භයංකර ස්වභාවයේ සිද්ධියක් හෝ

අතට පත් වන ළමයකු හෝ තරුණයකු දූෂණය කිරීමට තුඩු දෙන ආකාරයේ පොතක්, සඟරාවක් හෝ වෙනත් ප්‍රකාශනයක් සම්බන්ධව අදාළය.

## පරිගණක ගත සාක්ෂි අධිකරණ ක්‍රියාවලියේ දී පිළිගැනීම, බලාත්මක කිරීම 1995 අංක 14 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත




මෙම පනත මගින් අධිකරණය ඉදිරියේ කරුණු ඔප්පු කිරීමේ හා බිඳ හෙළීමේ කාර්යයට ඉලෙක්ට්‍රොනික සාක්ෂි, එනම් CCTV කැමරා පටිගත කිරීම් වැනි සාක්ෂි අදාළ කර ගැනීමට අවසර ලැබිණි. එමෙන්ම දරුවකු අන්තර්ජාලය ඔස්සේ සූරාකෑමට ලක්කරන ලද බවට යම් පරිගණක උපාංගයක අන්තර්ගත සාක්ෂියක් අධිකරණ ක්‍රියාවලියට අදාළ කර ගනු ලබන්නේ ද මෙම පනත මගින් ලබා දී ඇති බලාත්මකභාවය තුළිනි. මෙම පනතේ 12 වගන්තියෙහි පරිගණකය යන්නට තොරතුරු සකස් කිරීමට හෝ ගබඩා කිරීමට යොදා ගන්නා ඕනෑම උපාංගයක් සහ එවැනි නිර්මාණයක් කිරීමට යොදාගත් යම් සාක්ෂියක් හෝ පද්ධතියක් සම්බන්ධයෙන් වන පටිගත කිරීමක් ද ඇතුළත් වන බවට අර්ථ නිරූපණය කර ඇත.

වර්තමානයේ සිදුවන ගනුදෙනු බොහොමයක් තොරතුරු සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිතව සිදුවේ. උදාහරණ වශයෙන් බැංකු ගනුදෙනු කටයුතු, අධ්‍යයන කටයුතු හා සම්බන්ධ පුස්තකාල සමග පොත් ගනුදෙනු කිරීම, අන්තර්ජාලය මගින් රැකියා අයදුම්පත් යොමු කිරීම දැක්විය හැක. මෙවැනි අවස්ථාවලදී අතිශය පුද්ගලික තොරතුරු ද පුද්ගලයන් අතර හා ආයතන අතර හුවමාරු වේ. එම ඉලෙක්ට්‍රොනික ගනුදෙනු සඳහා බලාත්මකභාවය ලබා දීම මෙම පනත මගින් සිදු විය. රාජ්‍ය ආයතන හා ව්‍යවස්ථාපිත අධිකාරීන් විසින් ඉලෙක්ට්‍රොනික් අත්සන් සහ වාර්තා පවත්වාගෙන යාමේදී අනුගමනය කළ යුතු පියවර මෙම පනතේ 8 වන වගන්තියෙහි දක්වා ඇත. ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් ගිවිසුම් ඇති කර ගැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග මෙම පනතේම 3 වන පරිච්ඡේදයේ දක්වා ඇත.

## 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත

පුද්ගලයකු විසින් සිය දැනුම සහ හැකියාවන් යොදා සකස් කරන නිර්මාණයන්හි අනන්‍යතාව ආරක්ෂා කිරීම 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතෙහි අරමුණ වේ. මෙම පනත මගින් වෙබ් අඩවි, ඩිජිටල් ඡායාරූප, චිත්‍රපට හා සංයුක්ත පරිපථයන් සඳහා වූ පිරිසැකසුම් නිර්මාණ (LAYOUT DESIGNS OF INTEGRATED CIRCUITS) බුද්ධිමය දේපළ වශයෙන් ආවරණය කර ඇත. යම් හෙයකින් පරිගණක මෘදුකාංගයක් නීතිවිරෝධී ආකාරයෙන් පිටපත් කළ හොත් ඒ සඳහා ගත හැකි නීතිමය ක්‍රියා මාර්ග මේ පනත මගින් හඳුන්වා දී ඇත. මෙම පනත මගින් බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල් ධූරයක් පිහිටුවා ඇති අතර එමගින් බුද්ධිමය දේපළ ලියාපදිංචිය, පාලනය හා පරිපාලනය සිදු කරනු ලබයි. මෙම පනතේ 38 වන පරිච්ඡේදයේ 177 සිට 203 දක්වා වගන්ති වල බුද්ධිමය දේපළ සම්බන්ධ වරදවල් සහ ඒවාට හිමිවන දඬුවම් දක්වා ඇත.

මෙම පනත යටතේ ක්‍රියාත්මක කළ යුතු යම් නඩු කටයුත්තක් වේ නම් ඒ සඳහා අධිකරණ බලය ලබා දී ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තිය  අනුව ස්ථාපනය කරන ලද 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත යටතේ පිහිටුවා ඇති පළාත්බද මහාධිකරණ වලටය.

## 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත (Computer Crimes Act No 24 of2007)

මෙම පනත මගින් පරිගණක භාවිත කරමින් පුද්ගල තොරතුරු අනවසරයෙන් භාවිත කිරීම සම්බන්ධයෙන් නීතිය හඳුන්වා දී තිබේ. පරිගණකයකට, පරිගණක පද්ධතියකට හෝ පරිගණක වැඩසටහනකට හානි කිරීමේ හෝ නිත්‍යානුකූල නොවන වෙනස් කිරීමකට භාජනය කිරීමේ චේතනාවෙන් යම් ක්‍රියාවක් සිදු කරන අයෙකුට වසර පහක් දක්වා වන සිර දඬුවමකට ලක්වීමට හා/ හෝ ලක්ෂ තුනක් දක්වා උපරිම දඩයකට යටත් වීමට සිදු වන බව 5 වන වගන්තියෙන් දක්වා ඇත. පනතේ 8 වන වගන්තියෙන් දක්වා ඇත්තේ නීති විරෝධී ආකාරයෙන් දත්ත අත්කර ගැනීම වරදක් වන බවයි.

අධිකරණ කාර්යයන් සඳහා පරිගණක ආශ්‍රිත දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විශේෂඥ දැනුම ඇති පුද්ගලයින් පත් කරනු ලබන්නේ මෙම පනත මගිනි. එමෙන්ම විමර්ශන කාර්යයන් සඳහා රජයේ විමර්ශන නිලධාරීන්ට ද මෙම පනත මගින් විශේෂ නියෝග ලබා ගෙන පරිගණක ආශ්‍රිත උපාංග පරීක්ෂාවට ලක් කිරීම, සීල් තැබීම හා විශේෂඥයින් මගින් පරීක්ෂා කරවා ගැනීම සිදු කළ හැක. දරුවකු අන්තර්ජාලය මගින් ලිංගික සූරාකෑමට ලක් කළ අවස්ථාවක දී අදාළ පරිගණක උපාංග තුළ ගබඩා වී ඇති හෝ ඒවා මගින් හුවමාරු වූ ප්‍රකාශන මෙම පනත යටතේ විශේෂඥයින් ලවා පරීක්ෂා කර සාක්ෂි වශයෙන් අධිකරණයට ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.

මීට අමතරව පහත දක්වා ඇති පනත් මගින්ද මේ ආශ්‍රිත වරදවල් සම්බන්ධයෙන් ඇති නීතිමය තත්ත්වයන් දක්වා ඇත.
2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත
2005 අංක 28 දරන ගෙවීම් හා නිෂ්කාශන පද්ධති පනත
2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත
2006 අංක 30 දරන ගෙවීම් උපාංග සාවද්‍ය පරිහරණ පනත



## 6.5 සයිබර් අවකාශය තුළ සිදුවන අපරාධ වැළැක්වීම හා වින්දිතභාවයට පත්වන පාර්ශවයන්ගේ ආරක්ෂාව සැලසීම සඳහා කටයුතු කරන ආයතන

**පරිගණක හදිසි සූදානම්තා කණ්ඩායම**

තොරතුරු සන්නිවේදනය උපයෝගී කරගනිමින් රාජ්‍ය ප්‍රතිපත්ති, ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේ මූලික අරමුණ ඇතිව 2003 අංක 27 දරන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පනත ඇති කරන ලදී. එහි ක්‍රියාකාරී යාන්ත්‍රණය වශයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (Information and Communication Technology Agency of Sri Lanka – ICTA) පිහිටුවන ලදී. 2008 දී සිදුකරන ලද සංශෝධනයක් මගින් මෙම පනතේ කාර්යයන් පුළුල් පරාසයක් වෙත යොමු කර ඇති අතර මෙමගින් තොරතුරු සන්නිවේදන තාක්ෂණය ක්‍රියාත්මක කිරීමෙහිලා ජාතික ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමට කටයුතු කරන අන්තර් අමාත්‍ය කමිටුවක් පිහිටුවා තිබේ.

මෙසේ තොරතුරු තාක්ෂණය සම්බන්ධව රාජ්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන විට ඇතිවන සයිබර් ප්‍රහාර ඇතුළු අනෙකුත් ගැටලු නියාමනය කිරීමට හැසිරවීමට හා පාලනය කිරීමට ද ආයතනයක් ද ඇති කරන ලදී. එනම් 2006 වර්ෂයේ දී ICTA සහයෝගිත්වයෙන් ආරම්භ කරන ලද, පරිගණක හදිසි සූදානම්තා කණ්ඩායම (Computer Emergency Readiness Team- CERT) යි. ප්‍රධාන වශයෙන් හදිසි අවස්ථාවක දී ප්‍රතිචාර දැක්වීම, දැනුවත් කිරීමේ සේවා පවත්වාගෙන යාම, පර්යේෂණ කටයුතු සිදු කිරීම, ප්‍රතිපත්ති සංවර්ධනය සහ උපදේශන සේවා ලබා දීම වැනි කාර්යයන් මෙම ආයතනය විසින් සිදු කරනු ලබයි. එමෙන්ම රජයේ හෝ පුද්ගලික ආයතන වලට තොරතුරු තාක්ෂණය වඩා ආරක්ෂාකාරී ලෙස අවදානමකින් තොරව භාවිත කිරීමට අවශ්‍ය මග පෙන්වීම ලබා දේ. එමෙන්ම අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය භාවිතයෙන් සිදුවන විවිධ සිදුවීම් සම්බන්ධව දැනුවත් කිරීම හා සිදුවීමකින් පසු අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා මග පෙන්වීම සිදු කරනු ලබයි. නමුත් නීතිමය ක්‍රියාමාර්ග සඳහා මැදිහත් වීම, වරදකරුවන් සොයා දීම, වෙබ් අඩවි අවහිර කිරීම මෙම ආයතනය විසින් සිදු නොකරයි.

0112 691 692/ 0112 695 749/ 0112 679 888 යන දුරකථන අංක ඔස්සේ ශ්‍රී ලංකා පරිගණක හදිසි සූදානම්තා කණ්ඩායම ඇමතීමට හැකියාව ඇත. එමෙන්ම cert@cert.gov.lk යන විද්‍යුත් ලිපිනය හරහා තොරතුරු ලබා ගත හැකිය.

report@cert.gov.lk යන විද්‍යුත් ලිපිනය හරහා සමාජ මාධ්‍ය ආශ්‍රිත සිද්ධීන් වාර්තා කළ හැකිය.

### ශ්‍රී ලංකා පොලිසියේ සයිබර් අපරාධ අංශය

යම් පුද්ගලයකු සයිබර් අපරාධයක ගොදුරක් බවට පත් වුවහොත් ළගම ඇති පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැක. දරුවකුට සිදුවන සයිබර් අපරාධයකදී පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ යුතු වන අතර එවිට අදාළ අංශ වෙත දැනුම් දී විමර්ශන කටයුතු සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ මූලස්ථානයෙහි සයිබර් අපරාධ අංශයක් ස්ථාපනය කොට ඇත. යම් අයෙකුට සයිබර් අවකාශය ආශ්‍රිතව සිදුවන අපරාධයක් සෘජුවම මෙම අංශයට ද වාර්තා කළ හැකි අතර එමගින් විමර්ශන කටයුතු සිදු කර අදාළ අපරාධකරු නීතියේ රැහැනට හසුකර ගැනීම සිදු කෙරේ. 0112 326 979 යන සෘජු දුරකථන මාර්ගය ඔස්සේ සයිබර් අපරාධ අංශය හෝ 0112 320 141 යන අපරාධ විමර්ශන අංශයෙහි පොදු දුරකථන මාර්ගය ඔස්සේ සම්බන්ධ වී ඔවුන්ගෙන් උපකාර ඉල්ලා සිටිය හැක. එමෙන්ම dir.cid@police.lk සහ telligp@police.lk යන විද්‍යුත් ලිපිනයන් දෙකටම විද්‍යුත් ලිපි මඟින් තොරතුරු ලබා දිය හැක.

### ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

දේශය තුළ දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සුවිශේෂ අධිකාරියක් පිහිටුවීමේ දිගුකාලීන අවශ්‍යතාව මල්ඵල ගන්වමින් 1998 වර්ෂයේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවන ලදී. මෙම අධිකාරිය පිහිටුවන ලද්දේ 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත යටතේය.

මෙම පනත මගින් දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීමට හා ඒ සඳහා රජයට මග පෙන්වීම හා ළමා අපයෝජන තුරන් කිරීමට ගත හැකි සියලු පියවරයන් ගැනීමට රජය හා සමග කටයුතු කිරීමට බලය ලබා දී ඇත. විශේෂයෙන්ම එම පනතේ 14(ඔ) වගන්තිය යටතේ ළමා අපයෝජන සම්බන්ධයෙන් පැමිණිලි ලබා ගැනීමටත් එම පැමිණිලි සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගැනීමටත් අවශ්‍ය බලය ලබා දී ඇත. ඒ අනුව දරුවකු සම්බන්ධයෙන් වන ඕනෑම පැමිණිල්ලක් සිදු කිරීමට පැය විසි හතරම ක්‍රියාත්මක වන සේවාවක් වශයෙන් ළමා ආරක්ෂක අධිකාරිය විසින් 1929 ළමා උපකාරක සේවාව ආරම්භ කර ඇත. මෙමගින් අදාළ සිදුවීම පිළිබඳව හැකි ඉක්මනින් විමර්ශන කටයුතු සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. දරුවකු අන්තර්ජාලය ආශ්‍රිතව ලිංගික සූරාකෑමට ලක් වූ අවස්ථාවක දී වුවද ඒ සම්බන්ධයෙන් 1929 ළමා උපකාරක සේවාවට පැමිණිලි කිරීමේ හැකියාව ඇත. අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර හෝ දුරකථන අංක 0112 778911-2-3-4 යන ලිපිනය හා දුරකථන මාර්ගය ඔස්සේ ද සම්බන්ධ විය හැකිය.

# සටහන්

# විෂය ආශ්‍රිත කියවීම්

## පියවර 7



# අන්තර්ජාලයේ භාවිතවන අයි.පී. ලිපිනය (IP Address) යනු කුමක්ද?

## එය ළමා ලිංගික සූරාකෑමෙහි යෙදෙන අපරාධකරුවකු හඳුනා ගැනීමට යොදා ගන්නේ කෙසේද?

- IP ලිපිනය, අන්තර්ජාලය භාවිත කරන සියලු දෙනාටම අනිවාර්යයෙන් තිබිය යුතු ලිපිනයකි. Internet Protocol යන්න IP යනුවෙන් හඳුන්වයි.
- මෙය අන්තර්ජාලය හරහා උපාංග (Device) දෙකක් සමග සම්බන්ධ වීමට හා සන්නිවේදනය කිරීමට අවස්ථාව සලසා දෙන ශිල්පීය භාෂාවක් වේ.
- අන්තර්ජාල ලිපිනයන් ස්ථිර (Static) හෝ තාවකාලික (Dynamic) විය හැක.

**අන්තර්ජාල මූල ලිපිනයක සැකැස්ම**

අන්තර්ජාල මූල ලිපිනයක අංක හා බිංදු ප්‍රමාණයක් ඇත.

අන්තර්ජාල මූල ලිපිනයන්ගේ ප්‍රමාණය වැඩිවෙමින් පවතින නිසා නව අනුවාද පුළුල් වශයෙන් දැකිය හැක. IP version 6 or IPv6 බහුලව භාවිත වේ.




**එය ක්‍රියාත්මක වන්නේ කෙසේද?**

අන්තර්ජාල මූල ලිපිනය එය භාවිත කරන උපාංගයට ආවේණික හඳුනා ගැනීමක් හෝ අනන්‍යතාවක් වන අතර එම උපාංග අන්තර්ජාලයට සම්බන්ධව පවත්නා අනෙකුත් උපාංගවලින් වෙන් කර ගැනීමට හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙයි. පරිගණකයක්, රූපවාහිනියක්, ක්‍රීඩා හසුරු පුවරුවක් වැනි ඕනෑම උපාංගයක එයටම ආවේණික වූ අන්තර්ජාල මූල ලිපිනයක් ලබාදිය හැකිය.

පුද්ගලයකුට තැපෑලෙන් ලිපියක් යැවීමට අදාළ පුද්ගලයාගේ ලිපිනය අවශ්‍ය වන්නේ යම්සේද දුරස්ථව පවතින පරිගණකයට වෙනත් උපාංග සමග සන්නිවේදනයේ දී මූල ලිපිනයක් අවශ්‍ය වෙයි. මෙලෙස ලබා ගන්නා අන්තර්ජාල මූල ලිපිනය භාවිත කරන්නාට නියමිත ගමනාන්තයට එම දත්ත සන්නිවේදනය කිරීමට අවස්ථාව ලබා දෙයි.

මෙම මූලකරණ (protocol) ක්‍රියාවලිය විශ්වයටම පොදු එකක් වන අතර සෑම උපාංගයකටම හෝ ස්ථානයකටම එක ලෙස කටයුතු කරයි. තව ද අදාළ උපාංගය ඇති ස්ථානය හා උපාංගයට සේවා සපයන අන්තර්ජාල සේවා සපයන්නා කවරෙක්ද යන තොරතුරු ද මූල ලිපිනය හරහා ලබා ගත හැකිය.

# අන්තර්ජාලයේ භාවිතවන අයි.පී. ලිපිනය (IP Address) යනු කුමක්ද?

## එය ළමා ලිංගික සූරාකෑමෙහි යෙදෙන අපරාධකරුවකු හඳුනා ගැනීමට යොදා ගන්නේ කෙසේද?

**ළමා ලිංගික අපරාධකරුවන් හඳුනාගැනීම සඳහා අන්තර්ජාල මූල ලිපිනයන් භාවිත කිරීම**

ළමුන් යොදා ගනිමින් ලිංගික සූරා කෑමෙහි යෙදෙන අපරාධකරුවන් අන්තර්ජාලයට සම්බන්ධ වන්නේ අන්තර්ජාල මූල ලිපිනයක් සහිත උපාංගයක් මඟිනි. මෙම ලිපිනයේ අන්තර්ජාල ක්‍රියාකාරකම් පිළිබඳ සලකුණු සනිටුහන් වෙයි. බලධාරීන්ට මෙම උපාංග පරීක්ෂා කිරීමෙන් මෙම උපාංග භාවිත කරන්නේ කුමන අවස්ථාවල දී ද? කොතැනදී ද? යන්න සොයා ගැනීමේ අවස්ථාව හිමිවෙයි. එම උපාංගය යොදා ගනිමින් අපරාධයක නියැලෙන අයෙකුව හඳුනා ගැනීමට මෙමඟින් පහසු කෙරෙයි.

භාවිත කරන්නන් හඳුනා ගැනීම සඳහා අදාළ බලධාරීන්හට සේවා සපයන්නන් (Internet Service providers) සමඟ එක්ව අන්තර්ජාල මූල ලිපිනයන් මඟින් ප්‍රවේශ වී එම පද්ධති තුළ ඔවුන්ගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කළ හැක.

අවාසනාවන්ත ලෙස සමහර අපරාධකරුවන් අන්තර්ජාල මූල ලිපිනය සැඟවීමේ පියවරයන් අනුගමනය කිරීමට පෙළඹී ඇත. එක් ක්‍රමයක් වන්නේ නියෝජිත සර්වරයක් එනම් proxy server යොදා ගැනීමයි. අදාළ පිටුවට සෘජුවම සම්බන්ධවීම වෙනුවට භාවිත කරන්නා විසින් නියෝජිත සර්වරය හරහා එම පිටුවට සම්බන්ධ වීමට ඉල්ලීම ඉදිරිපත් කරයි. එහිදී නියෝජිත සර්වරයට ඉල්ලීම ඉදිරිපත් කරන උපාංගයේ අන්තර්ජාල මූල ලිපිනය සඟවයි. මෙය නිර්ණාමිකත්වයක් ජනිත කරවයි.

අනෙක් ක්‍රමය වන්නේ අන්තර්ජාල මූල ලිපිනය වෙනුවට වෙනත් ලිපිනයක් ප්‍රදර්ශනය වන පරිදි ව්‍යාජ අන්තර්ජාල මූල ලිපිනයන් භාවිතකර එය නීති විරෝධී කටයුත්තට අයත් ලිපිනය බව එළි දැක්වීමය.

ඊට අමතරව අන්තර්ජාල මුල ලිපිනයන් අනාවරණය කර ගැනීම ඉතා සංකීර්ණ කරවන සහ වැඩිපුර කාලය ගත වීමට සලස්වන ආකාරයේ මෙවලම් මේ වන විට අන්තර්ජාලයේ දක්නට ඇත.

# පෙරහන් කිරීම හා අවහිර කිරීම (Filtering & Blocking) යනු කුමක්ද?

## සහ

## එය ළමා ලිංගික අපයෝජන ප්‍රකාශනයන්හි යොදා ගන්නේ කෙසේද?

**එය ක්‍රියාත්මක වන්නේ කෙසේද?**

බොහොමයක් අන්තර්ජාල සේවා සපයන්නන් සහ අනෙකුත් සජීවී ජාල ඔස්සේ සේවා සපයන්නන් තම පාරිභෝගිකයින් ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන සහිත වෙබ් අඩවිවලට පිවිසීම වැළැක්වීමට උත්සාහ කරයි. ඊට අමතරව තම සේවාදායකයන් ළමා ලිංගික අපයෝජන වීඩියෝ, ඡායාරූප බාගත කිරීම, ගබඩා කිරීම සහ වෙබ් අඩවිවලට එක් කිරීම වැළැක්වීමට ඔවුන්ට අවශ්‍ය විය හැක. ඒ සඳහා තෝරා ගැනීම සහ අවහිර කිරීමේ තාක්ෂණික ක්‍රමවේදයන් යොදා ගැනේ.

ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන සහිත වෙබ් අඩවි ලැයිස්තු ගත කර ඇති අතර අදාළ සේවාවන් ලබා ගන්නා ආයතන වලට ඒවා ලබා දී එය සෘජුවම එම ආයතනවල ආරක්ෂක ප්‍රතිපත්තිය තුළට ඇතුළත් කර ඇත.

මෙම වෙබ් අඩවි තුළට ඇතුල්වීමට දරන ඕනෑම උත්සාහයක් පෙරහන් කිරීම සහ අවහිර කිරීමට ලක්වෙයි. ආරක්ෂක සේවා සහ සෘජු දුරකථන සේවා මගින් මෙම වෙබ් අඩවි ලැයිස්තු ගත කිරීම සහ ඒවා අදාළ සමාගම් වෙත ලබා දීම සිදු කරයි. සමහර රටවල අන්තර්ජාල සේවා සපයන්නන් විසින් මෙම වෙබ් අඩවි පෙරහන් කිරීම සහ අවහිර කිරීම අනිවාර්ය වේ.

ආරක්ෂක අංශ මගින් හඳුනා ගන්නා ලද ඡායාරූපයක හෑෂ් හෝ සංඛ්‍යාංක ඇඟිලි සලකුණු නිර්මාණය කිරීම Photo DNA වැනි හෑෂ් තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් සිදු කෙරේ. මෙම හෑෂ් තාක්ෂණය ඔස්සේ හඳුනා ගන්නා ලද ඡායාරූප දත්ත ගබඩාවට හා පද්ධතියට ඇතුළත් කිරීම මගින් එම ඡායාරූපයේ අනුපිටපත් සේවාවන්ට එකතු කිරීම (upload), බා ගත කිරීම, හුවමාරු කිරීම හෝ ගබඩාකර

- ළමුන් සම්බන්ධ මේ ප්‍රකාශන නිදහසේ අන්තර්ජාලය තුළ සැරි සැරීම වැළැක්වීම මෙම තාක්ෂණයේ අරමුණ වේ.
- සෝදිසි යාන්ත්‍රණ (Search Engine) මගින් ලැයිස්තු ගත කර ඇති දර්ශන හා වෙබ් අඩවි සඳහා පමණක් මෙය බලපායි.
- Filtering & Blocking තාක්ෂණය ප්‍රධාන වචන (Key words), තහනම් කරන ලද වෙබ් ලිපින (URL) සහ හෑෂ් මත පදනම්ව ක්‍රියාත්මක වෙයි.

**අවධානයට**

මෙබඳු පෙරහන්වලට නීත්‍යානුකූල හා, නීත්‍යානුකූල නොවන ප්‍රකාශනයක් අතර වෙනස හඳුනාගැනීම සැම විටම පහසු නොවේ. එමනිසා ඇතැම් විට වැරදි ලෙස අවහිර කිරීමේ අවදානමක් ද ඇත. (පමණට වඩා අවහිර කිරීම්)

# පෙරහන් කිරීම හා අවහිර කිරීම (Filtering & Blocking) යනු කුමක්ද?

## සහ

## එය ළමා ලිංගික අපයෝජන ප්‍රකාශනයන්හි යොදා ගන්නේ කෙසේද?




**ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන පෙරහන් කිරීම සහ අවහිර කිරීම**

මෙම තාක්ෂණයේ අරමුණ හා පරමාර්ථය අන්තර්ජාලය තුළ ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන ප්‍රමාණය අවම කිරීම හෝ සීමා කිරීමය. එමගින් භාවිත කරන්නා නීතිවිරෝධී ලෙස අනවශ්‍ය ගොනු වෙත යොමු වීම වළකාලයි. එමෙන්ම ළමා ලිංගික අපරාධකරුවන්ට, ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන හුවමාරු කිරීමට ඇති හැකියාව වළකාලයි.

එම අසභ්‍ය ඡායාරූපවලට යොදා ගන්නා ලද වින්දිතයන්ට ද මෙම තාක්ෂණය ප්‍රයෝජනවත් වෙයි. මෙවැනි දර්ශනවලට පිටස්තරයන් ප්‍රවේශ වීම වැළැක්වීමෙන් වින්දිතයන්ගේ ආත්ම ගරුත්වය, පුද්ගලිකත්වය ආරක්ෂාවන අතර ඔවුනට තවදුරටත් සිදුවිය හැකි හානි සඳහාවන ඉඩ ප්‍රස්ථා මෙමගින් අවම කෙරේ.

# රහස් කේතනය (Encription) යනු කුමක් ද?

**ළමා ලිංගික අපරාධකරුවන්ගේ මෙවලමක් බවට මෙය පත් වී ඇත.**

**එය ක්‍රියාත්මක වන්නේ කෙසේද?**

රහස් කේතනය යනුවෙන් අදහස් වනුයේ මෘදුකාංගයක් ආධාරයෙන් පියවරයන් ගණනාවක් මගින් පණිවිඩයක් වසන් කොට සඟවා යැවීමයි.

එම පණිවිඩය වැරදි පුද්ගලයකු අතට පත්වුවත් එය දකින, කියවන පුද්ගලයාට එය වටහාගත නොහැකි තත්ත්වයක් ඇති වේ. උදාහරණයක් වශයෙන් “I will meet you Monday” යනුවෙන් සඳහන් පණිවිඩයක් එය දකින පුද්ගලයාට පෙනෙන්නේ “p98hUIs#yeb!” යනුවෙනි.

මෙසේ වටහාගත නොහැකි ලෙස කේතාංකනය කළ පණිවිඩය අන්තර්ජාලය ඔස්සේ ලබන්නා වෙත යවනු ලැබේ. පණිවිඩය යවන පුද්ගලයා විසින් ලබා දෙන අන් අයට විවෘත නොවූ පණිවිඩය තේරුම්ගත හැකි ක්‍රමවේදයක් තිබිය යුතු අතර එමගින් නියම පණිවිඩය විවෘත කර ගැනීම හෝ ආරක්ෂිතව ගබඩා කර ගැනීම කළ හැකිය. මෙම ක්‍රියාවලිය විසංකේතනය (Decryption) ලෙස හැඳින්වේ.

එම විසංකේතන ක්‍රමය නොමැතිව එම පණිවිඩය කිසිදු අයෙකුට කියවීමට නොහැකිවන අතර එම පණිවිඩය රූපයක් නම් එය දර්ශනය නොවේ.

## මූලික කරුණු

- රහස් කේතනය බොහොමයක් ජාල අතර උපාංග හරහා දත්ත හුවමාරු කර ගැනීමේදී යොදා ගැනේ.
- රහස් කේතනය ගබඩා කර තිබෙන හෝ හුවමාරු කරන දත්ත වසන් කිරීමෙන් ආරක්ෂා කිරීම සිදු කෙරෙයි.

**රහස් කේතනය මගින් ආරක්ෂාව සැපයෙන දේ.**

දත්ත (ගොනු, රූප, පරිගණක) අන්තර්ජාල හුවමාරු (බැංකු කටයුතු, මුරපද, ජාල, ඊ මේල් පණිවිඩ)



# රහස් කේතනය (Encription) යනු කුමක් ද?

**ළමා ලිංගික අපරාධකරුවන්ගේ මෙවලමක් බවට මෙය පත් වී ඇත.**

ළමා ලිංගික අපයෝජකයන් විසින් රහස් කේතන භාවිතා කිරීම

ආරක්ෂක ඇසට හසු නොවන අයුරින් තම අනන්‍යතාවය ආරක්ෂා වන ආකාරයට එකිනෙකා සමඟ සන්නිවේදන කටයුතු සිදු කිරීම සඳහා ළමා ලිංගික අපරාධකරුවන් අන්තර්ජාලයේ ඇති විවිධ උපාංග හා ක්‍රමවේද භාවිත කරනු ලබයි. උදාඃ අපරාධකරුවන් ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන, නිලධාරීන්ට පහසුවෙන් විසංකේතනය කළ නොහැකි ලෙස රහස් කේතනය කර ඇත. එසේම අදාළ ස්ථාන වැටලීමේදී සොයා ගැනෙන පරිගණක හා පරිගණක තැටි බලධාරීන්ට නීතිමය ක්‍රියාමාර්ග පරිවේෂණීය සාක්ෂි සඳහා යොදා ගැනීමේ ඉඩ ප්‍රස්ථා නැතිවන සේ රහස් කේතනය කර ඇත.

ඊට අමතරව රහස් කේතනය යොදා ගනිමින් තමා සමඟ ගනුදෙනු කරන පුද්ගලයින්ගේ අනන්‍යතාව හඳුනා ගැනීමේ පහසුකම අපරාධකරුවන්ට සැලසෙයි. සමහර රහස් කේත ක්‍රම ශක්තිමත් පරිගණක ක්‍රම උපයෝගී කරගනිමින් බිඳ දැමිය හැකි වුව ද සාමාන්‍යයෙන් පුළුල් වශයෙන් භාවිතයේ පවතින ශක්තිමත් රහස් කේතන ක්‍රම විකේතනයක් නොමැතිව නිරාවරණය කළ නොහැක. එබැවින් රහස් කේතනය නීතිය බලාත්මක කරන විමර්ශන නිලධාරීන්ගේ කාර්යභාරය වඩාත් සංකීර්ණ කරයි.

# හැෂ් /Photo DNA තාක්ෂණය යනු කුමක් ද?

ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන සඳහා මෙම තාක්ෂණයේ භාවිතය

### මූලික කරුණු

සෑම රූපයකට ම ඊටම ආවේණික වූ සලකුණක් ඇති අතර Photo DNA තාක්ෂණය යොදා ගනිමින් හැෂ් ලෙස හඳුන්වන අනන්‍ය කේතයක් (සංඛ්‍යාත්මක) සේ තම සලකුණ ප්‍රකාශ කළ හැක.

මෙම තාක්ෂණය මයික්‍රොසොෆ්ට් ආයතනය මඟින් පළමුව නිර්මාණයකර තිබේ. ගූගල් සමාගම ද ඒ හා සමාන වීඩියෝ සඳහා යොදා ගත හැකි තාක්ෂණයක් හඳුන්වාදීම සඳහා කටයුතු කරයි.

පුද්ගලයෙකුට පියවි ඇසින් බැලීමකින් තොරව ඡායාරූපවල අනුපිටපත් හඳුනා ගැනීමට මෙම තාක්ෂණය යොදා ගත හැක.

මෙම තාක්ෂණය නීති බලාත්මක කරන අධිකාරීන් ද ගූගල්, ෆේස් බුක් සහ ට්විටර් වැනි සමාගම් විසින් යොදා ගනු ලබයි.

### මෙය ක්‍රියාත්මක වන ආකාරය



1. අපරාධ නිවාරණය සිදුකරන රජයේ ආයතනයක් වැනි විශ්වසනීය මූලාශ්‍රයකින් ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන රූපයක් ලබා ගැනීම ප්‍රථම පියවරයි.




2. Photo DNA තාක්ෂණය විසින් එම රූපය කළු සුදු ආකෘතියකට සහ නිශ්චිත පරිමාණයකට සකසනු ලබයි. ඉන් අනතුරුව රූපය කොටු-වලට බෙදා එම එක් එක් කොටුවෙහි ඇති අනන්‍ය ඡායාව ගණිතමය වටිනාකමක් මඟින් නිශ්චය කරයි. මෙම සියලු ගණිතමය වටිනාකම්වල එකතුව එම රූපය සඳහා හැෂ් (පූරකය) නිර්මාණය කරනු ලබයි.




3. නියම රූපයක හැෂ් වටිනාකම් අනෙක් රූප හා සසඳා අනුපිටපත් හඳුනා ගත හැක. මෙම ක්‍රියාවලිය ගැලපීම් ක්‍රියාවලිය ලෙස හඳුන්වන අතර එය;
1. අන්තර්ජාලයේ ඇති හානිදායක අන්තර්ගතයන් හඳුනා ගැනීමට සහ ඒවා මග හැරීමට
2. රූප ගොනුවක් අතරින් දන්නා රූප පමණක් වෙන්කර ගැනීමට භාවිත කරයි.



4. සෑම රූපයකම ඇති ඉලෙක්ට්‍රොනික අනන්‍යතාවය හෝ මුද්‍රාව හෑෂය මඟින් නිරූපණය වේ. රූපය ප්‍රමාණය වෙනස් කිරීමෙන් හෝ වර්ණය මාරු කිරීමෙන් වෙනසකට භාජනය කළ ද එම රූපයට ආවේණික හැෂ් කේතය නොවෙනස්ව පවතී.

**සටහන**

මෙම තාක්ෂණය පින්තූරයක තිබෙන යම් පුද්ගලයෙකු හෝ වස්තුවක් හඳුනා ගැනීමට හෝ පින්තූරය නැවත මුල් තත්ත්වයට පත් කිරීමට සහ ප්‍රතිනිර්මාණය කිරීමට යොදාගත නොහැකිය.

# හැෂ් /Photo DNA තාක්ෂණය යනු කුමක් ද?

ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන සඳහා මෙම තාක්ෂණයේ භාවිතය




## ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන සඳහා PhotoDNA තාක්ෂණය භාවිතය

### නීති බලාත්මක කිරීම

අතුරුදන් වූ සහ සූරාකෑමට ලක් වූ ළමුන් සම්බන්ධයෙන්වන අන්තර්ජාතික මධ්‍යස්ථානයේ (International Center for Missing and Exploited Children (ICMEC)) සහයෝගයෙන් නෛතික බලධාරීන් විසින් Project Vic නැමැති රූප සහ වීඩියෝ හැෂ් හුවමාරු කිරීම සඳහාවන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය මගින් ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන ඇතුළත් දත්ත මිලියන ගණනක දත්ත ගබඩාවක් පවත්වාගෙන යමින් නීති බලාත්මකකරන බලධාරීන්ට මේවන විට හඳුනාගෙන ඇති සහ හඳුනා නොගත් දෑ වෙන්කර හඳුනා ගැනීමට උපකාර කරයි. මෙමඟින් අනුපිටපත් නැවත නැවත පරීක්ෂණයට ලක් කිරීම වළක්වන අතර, අලුත් හා හඳුනා ගැනීමට ලක් නොවූ ළමුන් සිටිය හැකි ප්‍රකාශන වෙත පමණක් අවධානය යොමු කිරීමට බලධාරීන්ට ඉඩ සලසයි. මේ අනුව Project Vic මඟින් පරීක්ෂණ කිරීමේ ක්‍රියාවලිය අනුකූලතාවයෙන් යුතු විමර්ශන ක්‍රියාවලියක් බවට පත්කර ඇත.

### අන්තර්ජාල සේවා සපයන්නන්

මෙම හැෂ් ක්‍රමය අන්තර්ජාල සේවා සපයන්නන් සහ සමාජ ජාලා වෙබ් අඩවි අතර හුවමාරු වෙයි. හැෂ් තාක්ෂණය එම වෙබ්අඩවිවල පළකර ඇති ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන හඳුනා ගැනීමට, ඉවත් කිරීමට හෝ අවහිර කිරීමට පහසුකම් සලසා දෙයි.

# ජාලගත පරිගණකකරණය හෙවත් ක්ලවුඩ් කම්පියුටින් (Cloud Computing)

## එය අදාළකර ගැනීම සහ ළමා ලිංගික අපයෝජකයින් විසින් අන්තර්ජාලය තුළ භාවිතා කිරීම

### මූලික කරුණු

- ලබා ගන්නා සේවාව මත කරන අය කිරීමක් සඳහා හෝ කිසිදු මුදලක් අය නොකරමින් ක්ලවුඩ් සේවා පහසුකම ක්ෂණිකව ලබා ගැනීමේ අවස්ථාව පාරිභෝගිකයාට හිමිවෙයි.
- සේවා හා පුද්ගලික දත්ත ක්ලවුඩ් සේවාව වෙත සීඝ්‍ර ලෙස යොමුවනු දැකිය හැක. ඒ අතර ඊ මේල් (e-mail), ඡායාරූප රැස්කරන වෙබ් අඩවි (instgram), ජංගම දුරකථන සඳහා නිපදවන මෘදුකාංග, සැපයුම මත ලබා දෙන චිත්‍රපට (e.g.-netflix), බැංකු සේවා හා දුරස්ථ සේවා දායක ගබඩා කිරීමේ (server storage) යෙදවීම් දක්නට ලැබේ.

### එය ක්‍රියාත්මක වන්නේ කෙසේද?

මෙතෙක් කලක් පැවති ක්‍රමය අනුව යම් අයෙකුට පරිගණකයක නිර්මාණය කරන ලද දෙයක් හෝ සංගීත ඛණ්ඩ එකතුවක් හෝ ඡායාරූප එකතුවක් ගබඩා කර තබා ගැනීමේ අවශ්‍යතාව ඇති වූ විට සංයුක්ත තැටියක හෝ U S B දත්ත ගබඩාවක ගොනු කරනු ලැබේ. එහෙත් එම උපාංගවල ඉඩ නොමැති වූ විට අමතර දෘඩාංග පද්ධතියක දත්ත ගබඩා කිරීමට සිදු වේ. එමෙන්ම වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට (run) අවශ්‍ය වූ විට අදාළ මෘදුකාංගය බාගත කොටගෙන තම උපාංගයේ ගබඩා කිරීමෙන් පසු වැඩසටහන ක්‍රියාත්මක කළ හැකි වේ. තම උපාංගය තුළ අවකාශ නොමැති නම් වැඩසටහන ක්‍රියාත්මක කළ නොහැක.

අන්තර්ජාලයේ පැමිණීමත් සමඟ මෙම තත්ත්වය සම්පූර්ණයෙන්ම පාහේ වෙනස් විය. ජාලය නැතිනම් ක්ලවුඩ් තුළ සිදුවන වර්ධනයන්ට අන්තර්ජාලය මඟින් ඉඩ සලසා ඇත. එමඟින් දුරස්ථ සේවාදායකයන් (Remote Server) භාවිත කරමින් දත්ත ලිපිගොනු සහ වැඩසටහන් ඕනෑම ප්‍රමාණයක් ගබඩා කිරීමට සහ සේවාවන් ක්‍රියාත්මක කරවීමට (run) හැකියාව ඇත. අන්තර්ජාලය ලෝකය පුරා නිරන්තරයෙන් සක්‍රීයව පවත්නා නිසා අප සියලු දෙනා ජංගම පරිගණක තුළ නිරන්තරයෙන් සක්‍රීය වේ. එමඟින් අප සිදු කරන ඕනෑම දෙයක් පසුව ඕනෑම මොහොතක ප්‍රයෝජනයට ගැනීමට හැකි ලෙස ගබඩා කළ හැකි වේ.

ක්ලවුඩ් සේවාව සපයන සමාගම්, අවශ්‍ය කරන යෙදවුම් උපාංග, මෘදුකාංග සහ යටිතල පහසුකම් සපයන අතර ඒවායේ පැවැත්ම සහ ආරක්ෂාව සම්බන්ධව සහතික වෙයි. භාවිත කරන්නාට අන්තර්ජාලය හරහා සේවාවට ප්‍රවේශ විය හැකි අතර ඒ සදහා අවශ්‍ය වන්නේ උපාංගයක්, අන්තර්ජාල පහසුකම් සහ සේවා ගිණුමක් පමණි. මෙමඟින් පරිගණක භාවිත කරන්නන්ට තම පුද්ගලික පරිගණකයට දෘඩාංග සහ මෘදුකාංග ඇතුළත් කිරීම, යෙදවුම් මිලදී ගැනීම හා කළමනාකරණය යන කටයුතුවලින් නිදහස් වීමට හැකි වෙයි.

### අපරාධකරුවන් විසින් ක්ලවුඩ් සේවාව භාවිත කිරීම

පරිගණක අපරාධකරුවන් ද Cyber Locker වැනි ක්ලවුඩ් සේවා ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන ගබඩා කර තැබීමට යොදා ගනී. මෙම ගොනුව ආරක්ෂිතවන අතර එහි ඇතුළත් දෑ විවෘත කළ හැක්කේ අන්තර්ජාලය ඔස්සේ අදාළ රහස් කේතය ඇතුළත් කිරීමෙන් පමණි. අපරාධකරුවන් අදාළ ගොනුවට ප්‍රවේශ වීමේ හැකියාව නොමිලේ හෝ මුදලට හෝ වෙනත් එවැනිම ඡායාරූප හෝ වීඩියෝපට හුවමාරු කිරීමේ පදනම මත ලබා දෙන්නේ අදාළ රහස් යතුර අනෙක් පාර්ශවයට ලබා දීමෙනි. බොහෝ ක්ලවුඩ් සේවා සපයන සමාගම් තම ගබඩා තුළ ඇති අන්තර්ගතය පිළිබඳ දැනුවත් වී නොමැත.

ළමා ලිංගික අපරාධ සදහා යොමුවන නිතර සංචාරයේ යෙදෙන ළමා ලිංගික අපරාධකරුවන් ක්ලවුඩ් අවකාශය භාවිත කර විදේශ රටවලදී ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන නිර්මාණය කරනුයේ තම රටේ අදාළ අංශ මඟින් සිදු කරන සෝදිසි කිරීම්වලින් වැළකීමේ හැකියාව පවතින නිසාය. තව ද තම රටට රැගෙන යාම හෝ තැපැල් කිරිමකින් තොරව අපරාධකරුවන් විසින් මෙම නිෂ්පාදන ක්ලවුඩ් වෙත යොමු කර තම රටට ළඟාවූ පසු ඒව නැවත ලබාගනී.

ක්ලවුඩ් පරිගණක සේවාවේ පැමිණීම නීති බලාත්මක කිරීමේදී නව අභියෝග නිර්මාණය කරයි. ඉතා විශාල ප්‍රමාණයේ ගොනු ප්‍රමාණයක් මේ හරහා හුවමාරු වීම සහ එයින් වැඩි ප්‍රමාණයක් රහස් කේතකරණයට (encrypted) ලක් කර තිබීම එයට හේතුව වී ඇත.

අධිකරණ සීමාව පිළිබඳ ගැටලුද මේ නිසා ම ඇති වී තිබේ. ඕනෑම පුද්ගලයකුට සේවය ලබා ගත හැකි පරිදි ක්ලවුඩ් සේවා සපයන්නන් විසින් භෞතික පහසුකම් ලෝකය පුරා සපයා දී ඇති නිසා මේ පහසුකම් සම්බන්ධ ගැටලු කුමන නීති පද්ධතිය යටතේ ක්‍රියාත්මක කළයුතු ද, කවර අන්තර්ජාල පහසුකම් සපයන්නන් හා පාර්ශවයන් පසු විපරම් කිරීමට පරීක්ෂණ සිදු කිරීමට හා චෝදනා ගොනු කිරීමට බැඳී සිටී ද යන ගැටලු මතු කරයි.

# ස්ප්ලෑෂ්(Splash) පිටු හෙවත් වෛවර්ණ පිටු

අන්තර්ජාලය හරහා ළමුන් ලිංගික අපයෝජන සඳහා යොදා ගැනීම වැළැක්වීමට මෙයින් ඇති ප්‍රයෝජන

**මූලික කරුණු**

ස්ප්ලෑෂ් පිටු හෙවත් වෛවර්ණ පිටු, වෙබ් අඩවි වලට පිවිසෙන්නන් ආකර්ෂණය කර ගැනීමට පණිවිඩයක් දැක්වීමට හෝ වෙනත් අන්තර්ජාල පිටුවක් වෙත යොමු කිරීමට යොදා ගනී.

වෛවර්ණ පිටු රාජ්‍ය නොවන සංවිධාන, කර්මාන්ත සහ නීති බලාත්මක කරන අංශ විසින් යොදා ගනී.

වෛවර්ණ පිටුවක් මගින් භාවිත කරන්නා යම් අන්තර්ජාල පිටුවකට පිවිසීම වළක්වන අවස්ථාවක දී එය වළක්වන පිටුවක් (Stop Page) ලෙස ක්‍රියා කරයි.

**ක්‍රියාත්මකවන ආකාරය**

වෛවර්ණ පිටුවක් යනු අන්තර්ජාලය භාවිත කරන්නා විසින් යම් අන්තර්ජාල පිටුවක් බාගත කරමින් පවතින විට, සම්පූර්ණ තිරය හෝ තිරයෙන් කොටසක දර්ශනය වන පිටුවක් හෝ පින්තූරයකි.

වෙබ් අඩවිවලට පණිවිඩ ඇතුළත් කරන ක්‍රමවේදයක් වන මෙය ඕනෑම අරමුණක් සඳහා යොදාගත හැක. දැන්වීම් පළ කරන්නන් විසින් භාවිත කරන්නන් ආකර්ෂණය කර ගැනීම සඳහා මෙය යොදා ගන්නා අතර අන්තර්ජාලයට පිවිසෙන්නන්ට පණිවිඩයක් ලබා දීම මෙහි අරමුණ වෙයි.

උදා: "ඔබ වැරදි ලිපිනයක් ඇතුළත් කර ඇත." හෝ "ඔබ සොයන වෙබ් අඩවිය තව දුරටත් වලංගු වෙබ් අඩවියක් නොවේ" යන පණිවිඩ ගතහැක.

එමෙන්ම වෛවර්ණ පිටු ඇතැම් තොරතුරුවලින් භාවිත කරන්නන් ඈත්කර තබා ගැනීමට යොදා ගනී.

උදාහරණයක් ලෙස යම් පුද්ගලයෙකු දැනුවත්ව හෝ නොදැනුවත්ව ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන හෝ එබඳු වෙබ් අඩවියක් වෙත ප්‍රවේශ වීමට උත්සාහ දරන විට එම අදාළ ගොනුවට ඇතුල්වීම වළක්වාලමින් පෙරහනයක් හා අවහිර කිරීමක් (Filtering & Blocking) ලෙස මෙම පිටු කටයුතු කරයි.

# ස්ප්ලෑෂ්(Splash) පිටු හෙවත් වෛවර්ණ පිටු

අන්තර්ජාලය හරහා ළමුන් ලිංගික අපයෝජන සඳහා යොදා ගැනීම වැළැක්වීමට මෙයින් ඇති ප්‍රයෝජන

**ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන සඳහා ප්‍රවේශ වීම වැළැක්වීම**

මයික්‍රොසොෆ්ට් සහ ගූගල් වැනි සමහර සමාගම් ඔවුන් ලබා දී ඇති සෙවුම් පහසුකම් (Search) වලදී ඔවුන්ගේ නිවර්තන (Deterrance) ක්‍රියාවලියේ කොටසක් ලෙස මෙමගින් පුද්ගලයන් දැනුවත්ව හෝ නොදැනුවත්ව ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන වෙත ප්‍රවේශ වීම වැළැක්වීමට කටයුතු කරයි. යමෙකු  එවැනි පිටුවක් වෙත ප්‍රවේශ වීටම උත්සාහ කළහොත් ඔහු එයින් වළකාලයි. පසුව වෛවර්ණ පිටුවක් භාවිතයෙන් භාවිත කරන්නා බාධා කිරීමේ පණිවිඩය (Deterrance Message) වෙත යොමු කරයි.

වෛවර්ණ පිටුවල විවිධ තොරතුරු ඇතුළත් වී තිබිය හැක. ඉතාමත් සරල වෛවර්ණ පිටුවක "අදාළ පිටුවට ඇතුල්වීම තහනම් කරනු ලැබේ." යනුවෙන් සඳහන් වී තිබිය හැක. මෙය දෝෂ දක්වන පණිවිඩයක් හෝ "404" පණිවිඩයක් ලෙස හඳුන්වනු ලබයි. සමහර වෛවර්ණ පිටුවල අදාළ ප්‍රවේශය වැළැක්වීමට හේතුව (අදාළ නීතිමය කරුණ ඇතිව හෝ නැතිව) අමතර තොරතුරක් වශයෙන්  දක්වයි. මෙම අමතර තොරතුර ළමුන් සම්බන්ධ ලිංගික හැඟීම්වලින් පෙළෙන කාමාතුර පුද්ගලයන්ට ඒවායින් වැළකීමට හෝ උදව් ලබා ගැනීමට ඇති අවස්ථා ගැන දැනුවත් කිරීමට ද යොදා ගනී.

ඇතැම් වෛවර්ණ පිටු සොයා යන පිටුවෙහි හා භාවිත කරන්නා විසින් සොයන කරුණුවල ඇති නීති විරෝධී බව අනතුරු ඇඟවීමේ පණිවිඩයක් ලෙස ගෙන එයි. භාවිත කරන්නා විසින් අදාළ ගොනුවට පිවිසීම වැළැක්වීම සම්බන්ධයෙන් එකඟ නොවන්නේ නම් පැමිණිලි කිරීමේ ක්‍රමවේදයක් ද සමහර තොරතුරුවලින් දක්වයි. අවසාන වශයෙන් සමහර වෛවර්ණ පිටු ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන පිළිබඳ වාර්තා කිරීමට සෘජු දුරකථන පහසුකම් පිළිබඳ තොරතුරු ද සපයයි.

මෙවැනි තොරතුරු සැපයීම හරහා ස්ප්ලෑෂ් පිටු, ළමා ලිංගික අපයෝජන ප්‍රකාශනවල පවතින නීතිවිරෝධී භාවය පිළිබඳ දැනුමක් ලබා දෙයි. එමෙන්ම එවැනි දේ භාවිත කරන්නන්ට උදව් කිරීම, අපරාධකරුවකු වීමට හේතුවන බවද දැනුවත් කෙරෙයි.
එබඳු දේට යොමු වීමෙන් සිරගත වීමේ ඉඩ ප්‍රස්ථා පිළිබඳ බියක් ජනිතකර ඉන් වැළකී සිටීමට උපදෙස් ලබා හැකි අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමක් ද කරයි. ස්ප්ලෑෂ් පිටු වඩාත් ආරක්ෂාකාරී අන්තර්ජාල පරිසරයක් ඇති කරයි. අන්තර්ජාල භාවිත කරන්නන්ට ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන පිළිබඳව වාර්තා කිරීමට ඉඩ සැලසීම හා එබඳු තොරතුරු තවදුරටත් අන්තර්ජාලයේ සැරි සැරීම වැළැක්වීමට උපකාරී වේ. මෙය ළමා ලිංගික අපයෝජන ප්‍රකාශන ආශ්‍රිත වෙබ් අඩවිවලට පිවිසීම වැළැක්වීමේ ඵලදායී යාන්ත්‍රණයක් වෙයි.



# ළමා අයිතිවාසිකම් සහ වගකීම්



ළමා අයිතීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ සරල පිටපතකි.

## ළමා අයිතිවාසිකම්

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය යනු ළමුන්ගේ අයිතිවාසිකම් කවරේදැයි සඳහන්ව ඇති ජාත්‍යන්තරව පිළිගත් ලියවිල්ලකි. ශ්‍රී ලංකාව ද ඇතුළුව ලොව සෑම රටක් ම පාහේ මෙය නිල වශයෙන් පිළිගෙන ඇති අතර, ළමයින් හට සැලකීමේ දී මෙම ලියවිල්ල පාදක කර ගත යුතු බව එහි සඳහන් වේ.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට අත්සන් කර ඇත්තේ රජයන් වුව ද සෑම පුරවැසියෙක් ම ළමා අයිතීන් පිළිබඳව දැන සිටීම ඉතා වැදගත්ය. මෙහි සඳහන්ව ඇත්තේ ළමා අයිතීන් පිළිබඳ ප්‍රඥප්තියේ සරල අනුවාදයකි.




**වගන්තිය 01 -** ළමයා පිළිබඳ නිර්වචනය
අවුරුදු 18 ට පහළ සෑම තැනැත්තෙකු ම ළමයෙකු ලෙස සැලකේ. ළමුන්ට මෙම ප්‍රඥප්තියේ සඳහන් සියලු ම අයිතිවාසිකම් හිමිවිය යුතුය.

**වගන්තිය 02 -** වෙනසක් නොකිරීම
ළමයින් කවුරුන් වුව ද, කුමන වයසක වුව ද, කිසියම් ආබාධයක් සහිත වුව ද, කුමන වර්ණයකින් යුක්ත වුව ද, කුමන ජාතියකට අයත් වුව ද, කුමන භාෂාවකින් කතා කළ ද ඒ සෑමටම, කිසිදු ආකාරයේ වෙනසකින් තොරව මෙම අයිතීන් හිමි විය යුතු ය.

**වගන්තිය 03 -** ළමයාගේ උපරිම යහපත
ළමයින් හා සම්බන්ධව ක්‍රියා කරන විට දී සහ ඔවුන් පිළිබඳව ගන්නා තීරණවල දී ළමයාගේ උපරිම යහපත සලකා ක්‍රියා කළ යුතුය.

**වගන්තිය 04 -** ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම
ප්‍රඥප්තියට ඇතුළත් කර ඇති සියලු ම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට රජය විසින් හැකි සෑම උත්සාහයක් ම දැරිය යුතු ය.

**වගන්තිය 05 -**
දෙමව්පිය මාර්ගෝපදේශකත්වය හා ළමයාගේ වර්ධනය
ළමයාට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සැලසීමෙහිලා පවුල සතු වගකීමට ද දෙමව්පිය අයිතීන් හා වගකීම්වලට ද රජය ගරු කළ යුතුය.

**වගන්තිය 06 -** පැවැත්ම සහ සංවර්ධනය
ජීවත්වීමට අයිතියක් ළමයින් සතු බව සියලු දෙනාම පිළිගත යුතුය. ළමයාගේ පැවැත්ම හා සංවර්ධනය සුරක්ෂිත කිරීම රජයේ වගකීමක් වේ. ජීවත්වීමේ හා නිසි ලෙස සංවර්ධනය වීමේ අයිතියක් ද ළමුන් සතු වේ.

**වගන්තිය 07 -** නම සහ ජාතිකත්වය
උපන්දා පටන් නමක් හා ජාතිකත්වයක් ලැබීමට සෑම ළමයෙකුට ම අයිතියක් ඇත. ඔහුගේ/ඇයගේ දෙමව්පියන් කවුරුන්දැයි දැන ගැනීමටත්, ඔවුන්ගේ ආදරය ලැබීමටත් ළමයාට අයිතියක් ඇත.

**වගන්තිය 08 -** අනන්‍යතාවය ආරක්ෂා කිරීම

ළමයාගේ අනන්‍යතාව ආරක්ෂා කිරීමට රජය බැඳී සිටී. අනන්‍යතාව නැතිවූ විටෙක අවශ්‍ය ඕනෑම අවස්ථාවක නම, ජාතිය හා පවුල් සබඳතා ඉදිරිපත් කර එය යළිත් ස්ථාපනය කිරීමට ද රජය බැඳී සිටී.

**වගන්තිය 09 -**

දෙමව්පියන්ගෙන් වෙන් කර තැබීම

ළමයාගේ උපරිම යහපත සඳහා පමණක් (එනම් මව්පියන් විසින් ළමයාට අකටයුත්තක් කරනවා නම් හෝ නොසලකා හරිනවා නම්) මිස ඔවුන් දෙමව්පියන්ගෙන් වෙන් නොකළ යුතුය. දෙමව්පියන්ගෙන් වෙන්ව ජීවත් වීමට තීරණය කළ හොත් ළමයාට ඔවුන්ගෙන් එක් අයෙකු සමඟ ජීවත්වීමට සිදු වනු ඇත. එහෙත් මව සහ පියා සමඟ පහසුවෙන් සම්බන්ධතා පවත්වාගෙන යාමට ළමයාට අයිතියක් ඇත.

**වගන්තිය 10 -** පවුලක් ලෙස නැවත එක් වීම

තම පවුල සමඟ නැවත එක් වීම සඳහා ඕනෑම රටකින් පිටවීමටත්, තම රටට නැවත පැමිණීමටත්, ළමයාට අයිතියක් ඇත.

**වගන්තිය 11 -** ළමයින් පැහැරගෙන යාම

දෙමව්පියන් හෝ තුන්වන පාර්ශවයක් විසින් ළමයින් පැහැරගෙන යාම හෝ බලහත්කාරයෙන් රඳවා තැබීම වැළැක්වීම හා ළමයා නැවත ලබා ගැනීමට කටයුතු කිරීම රජයේ වගකීමයි.

**වගන්තිය 12 -** ළමයාගේ මතය

කිනම් ආකාරයකින් හෝ ළමයා කෙරෙහි බලපාන තීරණයක් දෙමව්පියන් හෝ වැඩිහිටියන් විසින් ගනු ලබන විට දී තම මතය ප්‍රකාශ කිරීමට ළමයාට අයිතියක් ඇති අතර, එම මතය සැලකිල්ලට ගත යුතුය.

**වගන්තිය 13 -** නිදහස් ලෙස අදහස් ප්‍රකාශ කිරීම

තොරතුරු රැස් කිරීමටත්, විවිධ ක්‍රම මඟින් අදහස් ප්‍රකාශ කිරීමටත් ළමයාට අයිතියක් ඇත. ඒ සඳහා ළමයාට අවස්ථා ලැබිය යුතුය.



**වගන්තිය 14 -** නිදහසේ සිතීම හා ආගමක් ඇදහීම

දෙමව්පියන්ගේ මඟපෙන්වීම හා රටේ පවතින නීතියට අනුකූලව තමන්ට රිසිසේ සිතීමට හා කැමති ආගමක් ඇදහීමට ළමුන්ට අයිතියක් ඇත.

**වගන්තිය 15 -** ඇසුරු කිරීමේ නිදහස

අනෙක් ළමුන් හමුවී යාළු මිත්‍රකම් ඇති කර ගැනීමට ළමයාට අයිතියක් ඇත. අනුන්ගේ අයිතීන්ට බාධා නොවන අයුරින් සමිති සමාගම් පිහිටුවා ගැනීමට ද ඔවුනට අයිතියක් ඇත.

**වගන්තිය 16 -** පෞද්ගලිකත්වය රැකගැනීම

සෑම ළමයෙකුට ම පෞද්ගලික ජීවිතයකට අයිතියක් ඇත. තම පෞද්ගලිකත්වය, පවුල, නිවස හා ලිපි ගණුදෙනු සම්බන්ධව අන් අයගේ මැදිහත්වීමෙන් තොරව කටයුතු කිරීමට ඔවුන්ට අයිතියක් ඇත.

**වගන්තිය 17 -** නිසි තොරතුරු ලබා ගැනීම

දේශීය හා විදේශීය තොරතුරු මූලාශ්‍රයන්ගෙන් තොරතුරු ලබා ගැනීමට ළමයින්ට අයිතියක් ඇත. මෙහි දී ඔවුන්ගේ සුභ සිද්ධියට හේතු වන හා ඔවුන්ගේ සංස්කෘතික අගයන්ට හානි නොවන තොරතුරු ළමයින් වෙත ලබා දීමට වග බලා ගත යුතුය.

**වගන්තිය 18 -** දෙමව්පියන්ගේ වගකීම

මව්පියන් දෙදෙනාම ළමයාගේ වැඩීම හා වර්ධනය පිළිබඳ සමසේ වගකීම දැරිය යුතුය. ඔවුන් සැමවිට ළමයාගේ යහපත උදෙසා ක්‍රියා කළ යුතු අතර, මේ සඳහා රජය ඔවුන්ට සහය විය යුතුය.

**වගන්තිය 19 -** අපයෝජනයෙන් හා නොසලකා හැරීමෙන් ආරක්ෂා වීම

අපයෝජනයෙන් හා නොසලකා හැරීමෙන් ආරක්ෂාවීමට ළමයින්ට අයිතියක් ඇත. දෙමව්පියන්ට හා රැකබලා ගන්නන්ට ළමයින්ට හිංසා කිරීමට කිසිම අයිතියක් නැත. අපයෝජනයට ලක්වීමෙන් ළමයින් ආරක්ෂා කර ගැනීමටත්, එසේ අපයෝජනයට ලක් වූ දරුවන් පුනරුත්ථාපනය කිරීමත් රජයේ වගකීමයි.

**වගන්තිය 20 -** පවුලක් නොමැති දරුවන්ට රැකවරණය

ළමයාට දෙමව්පියන් නොමැති නම් හෝ තම පවුල සමඟ ජීවත් වීමට නොහැකි නම් ඔහුට / ඇයට විශේෂ ආරක්ෂාව හිමි විය යුතුය. මෙවන් අවස්ථාවලදී ළමයාට වෙනත් පවුලක් සොයා දීම

හෝ ළමයාගේ සංස්කෘතික පසුබිමට සුදුසු ආයතනයක් ලබා දීම රජයේ වගකීමයි.

**වගන්තිය 21 -** දරුකමට හදා ගැනීම
ළමයෙකු දරුකමට හදා ගන්නේ නම් එය නීත්‍යානුකූලව හා ළමයාගේ උපරිම යහපතට හේතු වන ලෙස සිදු කළ යුතුය.

**වගන්තිය 22 -** සරණාගත ළමයි
ආරක්ෂාව පතා ළමයෙකුට තම නිවස හෝ රට අතහැර යාමට සිදු වේ නම්, එවන් සරණාගත ළමයින්ට විශේෂ ආරක්ෂාව ලැබීමට අයිතියක් ඇත.

**වගන්තිය 23 -** ආබාධ සහිත ළමයි
ළමයා මානසික වශයෙන් හෝ කායික වශයෙන් ආබාධිතව සිටිය ද අනෙක් ළමයින් මෙන් හැදෙන්ට හා වැඩෙන්නට ද, විශේෂ රැකවරණයක් හා අධ්‍යාපනයක් ලබා ගැනීමට ද හැකිතාක් දුරට ස්වාධීන වීමට මෙන් ම, ක්‍රියාශීලී, පූර්ණ ජීවිතයක් ගත කිරීමට ද ළමයාට අයිතියක් ඇත.

**වගන්තිය 24 -** සෞඛ්‍ය හා සෞඛ්‍ය සේවා
මනා සෞඛ්‍යයකින් යුක්තවීමට ළමයාට අයිතියක් ඇත. සෞඛ්‍ය සේවාවන් ලැබීමටත් විශේෂයෙන් ළදරු මරණ, රෝග, පෝෂණ ඌණතා ආදිය අඩු කිරීම / වැළැක්වීම හා සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ දැනුවත්වීමේ අවස්ථා ලැබීමටත් ළමුන්ට අයිතියක් ඇත.

**වගන්තිය 25 -** ආයතනගත කර ඇති ළමුන් පිළිබඳ අධීක්ෂණය
ළමයාගේ රැකවරණය, ආරක්ෂාව හා ප්‍රතිකාර සඳහා ඔහු/ඇය රජයේ මැදිහත්වීමෙන් යම් ස්ථානයක රඳවා තිබේ නම්, අදාළ ස්ථානය පිළිබඳව හා ළමයා පිළිබඳව නිරන්තර අධීක්ෂණය කළ යුතුය.

**වගන්තිය 26 -** සමාජ ආරක්ෂාව
තම රටේ පවතින සමාජ ආරක්ෂණ වැඩසටහන් වලින් ප්‍රයෝජන ලැබීමට ළමයාට අයිතියක් ඇත.

**වගන්තිය 27 -** ජීවන තත්ත්වය
මනා ජීවන තත්ත්වයකට හිමිකම්කීමට අයිතියක් සෑම ළමයෙකුටම ඇත. එනම්, ළමයාගේ මූලික අවශ්‍යතා ඉටු කිරීමට දෙමාපියන් හෝ රජය කළ යුතුය

**වගන්තිය 28 -** අධ්‍යාපනය
අධ්‍යාපනය ලැබීමට සියලු ළමයින්ට අයිතියක් ඇත. අඩුම තරමේ මූලික අධ්‍යාපනය අනිවාර්ය කිරීමටත්, එය නොමිලේ ලබා දීමට කටයුතු කිරීමත් රජයේ වගකීමයි.

**වගන්තිය 29 -** අධ්‍යාපනයේ අරමුණු
අධ්‍යාපනයේ පරමාර්ථය වනුයේ ළමයාගේ පෞරුෂත්වය , දැනුම , කුසලතා මෙන්ම මානසික හා ශාරීරික හැකියාවන් පරිපූර්ණ ලෙස වර්ධනය කිරීමයි. වගකීමෙන් හා සාමකාමීව නිදහස් සමාජයක ජීවත්වීමට ද අනිත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් වටහා ගෙන පරිසරයට ගරු කරමින් ජීවත් වීමට ද අධ්‍යාපනය තුළින් ළමයින් සූදානම් කළ යුතුය.

**වගන්තිය 30 -** සුළු ජන කොටස්වලට අයත් ළමයින්
සුළු ජන කණ්ඩායමකට අයත් ළමයින්ට තම සංස්කෘතිය භුක්තිවිඳීමටත්, තම ආගම ඇදහීමටත්, තම භාෂාව භාවිත කිරීමටත් අයිතියක් ඇත.

**වගන්තිය 31 -** ක්‍රීඩා, විනෝදාත්මක හා සංස්කෘතික කටයුතු
ක්‍රීඩා කිරීමට, විනෝදයෙන් සිටීමට මෙන් ම සංස්කෘතික හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් හි යෙදීමට ද ළමුන්ට අයිතියක් ඇත.

**වගන්තිය 32 -** ළමා ශ්‍රමය
තම අධ්‍යාපනයට, සෞඛ්‍යයට හෝ වර්ධනයට හානියක් වන රැකියාවලින් හෝ තත්ත්වයන්ගෙන් ආරක්ෂා වීමට ළමයින්ට අයිතියක් ඇත. රැකියාවක නිරත වීමට අදාළ අවම වයස් මට්ටම රජය විසින් තීරණය කළ යුතුය. එමෙන්ම ළමයින් සඳහා යහපත් සේවා පරිසරයක් ද ඇති කළ යුතුය.

**වගන්තිය 33 -** මත්ද්‍රව්‍ය උවදුර
මත්ද්‍රව්‍ය භාවිතයෙන් , මත්ද්‍රව්‍ය නිෂ්පාදනයෙන් හා බෙදා හැරීමෙන් වැළකීමට ළමයින්ට අයිතියක් ඇත.

**වගන්තිය 34 -** ලිංගික අපයෝජනය
ලිංගික අපයෝජනයෙන් හා ලිංගික අතවර වලින් ආරක්ෂා වීමටත් , ව්‍යාපාරික වශයෙන් කෙරෙන ලිංගික කටයුතු වලින් හා අසභ්‍ය ප්‍රකාශන වැනි දේවල් වලින් ආරක්ෂා වීමටත් ළමයින්ට අයිතියක් ඇත.

**වගන්තිය 35 -** විකිණීම හා පැහැරගෙන යාම
ළමයින් පැහැරගෙන යාම හා විකිණීම වැළැක්වීමට ගත හැකි සියලුම පියවර රජය විසින් ගත යුතුය.

**වගන්තිය 36 -** වෙනත් ආකාරයේ අපයෝජන
32 සිට 35 දක්වා ඇති වගන්ති වල සඳහන්ව නැති වෙනත් සියලුම ආකාරයේ අපයෝජන වලින් ළමයින් ආරක්ෂා කර ගැනීම රජය සතු වගකීමයි.

**වගන්තිය 37 -** වධ හිංසා කිරීම සහ නිදහස අහිමි කිරීම
ළමයින්ට වධ හිංසා කිරීම , දරුණු ලෙස සැලකීම හෝ දඬුවම් කිරීම, ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම කිරීම හෝ මරණීය දණ්ඩනයට ලක් කිරීම, නීත්‍යානුකූල නොවන ලෙස අත්අඩංගුවට ගැනීම හෝ ඔවුන්ගෙන් උදුරා ගැනීම නොකළ යුතුය. නීත්‍යානුකූල ලෙස නිදහස සීමා කළ ළමයෙකුට වුව ද නිසි ලෙස සැලකීම් ලැබීමට අයිතියක් ඇත. රඳවා තබා ගන්නා ස්ථානවලදී වැඩිහිටි රැඳවියන්ගෙන් වෙන්ව සිටීමට ද තම පවුල සමග සම්බන්ධතා පවත්වාගෙන යාමට ද නීතිමය හෝ වෙනත් ආධාර ලැබීමට ද අයිතියක් ඇත.

**වගන්තිය 38 -** සන්නද්ධ අරගල
යුධමය වාතාවරණයක දී ආරක්ෂාව ලැබීමට ළමයින්ට අයිතියක් ඇත. අවුරුදු 18ට අඩු කිසිම ළමයෙකු යුද්ධයට සම්බන්ධ කර ගැනීම හෝ ආරක්ෂක හමුදාවන්ට බඳවා ගැනීම නොකළ යුතුය. යුද්ධයෙන් පීඩාවට ලක්වූ ළමයින්ට අවශ්‍යය රැකවරණය රජය විසින් ලබා දිය යුතුය.

**වගන්තිය 39** - පුනරුත්ථාපන රැකවරණය
යුද්ධයෙන් පීඩාවට පත්වූ ළමයින් , වධහිංසාවලට ලක්වූ ළමයින් මෙන් ම , නොසැලකිල්ලට , අපයෝජනයට හෝ අතවරයට ලක් වූ ළමයින්ට නිසි ප්‍රතිකාර ලබාදීමත්, ඒ තුළින් ඔවුන්ට සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට හැකියාව ලබාදීමටත් රජය විසින් කළ යුතුය.

**වගන්තිය 40 -** ළමයා සහ නීතිය
ළමයෙකු අපරාධයක් කිරීම පිළිබඳ චෝදනා ලැබ සිටී නම් නීතිමය හා වෙනත් ආධාර ලැබීමට ඔහුට හෝ ඇයට අයිතියක් ඇත. ළමයින් ආයතනගත කිරීමටත් , නඩු විභාගවලට ළමුන් ඉදිරිපත් කිරීමත් හැකි සෑම විටම අවම කළ යුතුය.

**වගන්තිය 41 -** පවත්නා ඉහළ නීති තත්ත්වයන් රැක ගැනීම
රටේ පවතින නීති , මෙම ප්‍රඥප්තියේ සඳහන් ඒවාට වඩා ඉහළ මට්ටමක පවතී නම්, එවන් අවස්ථාවලදී එම ඉහළ මට්ටමේ නීති ළමුන් සඳහා අදාළ විය යුතුය.

**වගන්තිය 42 - 54**
මෙම ප්‍රඥප්තියේ වගන්ති 54 කි. 42 සිට 45 වැනි වගන්තිය දක්වා විස්තර කර ඇත්තේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානයට වාර්ථා කිරීම පිළිබඳ රාජ්‍යයන් සතු වගකීම පිළිබඳවයි. 46 සිට 54 දක්වා වගන්ති මඟින් ප්‍රඥප්තියට ඇතුළත් වීම සඳහා රාජ්‍යයන් එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය මඟින් විශ්ව ව්‍යාප්ත මට්ටමින් සෑම ළමයෙකුම භුක්තිවිඳිය යුතු අයිතිවාසිකම් දක්වා ඇති අතර, එම අයිතිවාසිකම් තහවුරු කිරීම වැඩිහිටියන්ගේ මෙන්ම රාජ්‍යයන්ගේ වගකීම බව ද අවධාරණය කරයි. කෙසේ වෙතත් ළමයාට මෙම පුළුල් අයිතිවාසිකම් හිමිවන්නා සේම, එය අයිතිවාසිකම් භුක්තිවිඳීමේ දී ළමයා සතු වගකීම් පිළිබඳව ද ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය මඟින් දක්වා ඇත.

**මෙම සම්මුතිය ලංකා රජය විසින් ද අත්සන් කර වර්ෂ 1991 දී ස්ථිරකර පිළිගෙන ඇත.**

**ළමා අයිතිවාසිකම් හා බැඳුණු ළමා වගකීම් පිළිබඳ උදාහරණ කිහිපයක් පහතින් දක්වා ඇත.**

ස්ත්‍රී පුරුෂ භාවය , ජනවාර්ගික පසුබිම , සමාජ තත්ත්වය, භාෂාව, වයස, ජාතිකත්වය හෝ ආගම ආදිය නොසලකා හරිමින් කිසිදු වෙනස් කොට සැලකීමකින් තොරව සෑම ළමයෙකුටම ඉහත සඳහන් අයිතිවාසිකම් හිමිවන්නා සේම, ඒ අයුරින්ම අන්‍යයන්ට කාරුණික ලෙස සැලකීම ද ළමයාගේ වගකීමකි.

හිංසනයෙන්, කෲරත්වයෙන්, සූරාකෑමෙන් හෝ නොසලකා හැරීමෙන් ආරක්ෂාවීමේ අයිතිය ළමයාට පවතින්නා සේම, අන්‍යයන්ට හිංසා පීඩා නොකිරීමේ වගකීම ද ළමයාට පවතී.

පිරිසිදු පරිසරයක ජීවත්වීමේ අයිතිය ළමයාට පවතින්නා සේම තමා ජීවත්වන පරිසරය ආරක්ෂා කිරීමේ වගකීම ද ළමයාට පවතී.

**උපුටා ගැනීම - ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ "ළමා අයිතිවාසිකම් සහ වගකීම්" නැමති අත් පත්‍රිකාවෙනි.**

දින දෙකක පුහුණු වැඩසටහනෙහි දෙවන දිනයේ නෛතික රාමුව සැසියෙහි
කණ්ඩායම් ක්‍රියාකාරකම සඳහා අදාළවන තීරුමය වගන්තීන්

## 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන පනත)

286 (අ) - ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය
පළකිරීම් ප්‍රදර්ශනය ආදිය පිළිබඳ වරද

308 (අ) - ළමුන් කෲරත්වයට භාජනය කිරීම
(ළමයෙකුට එරෙහිව මානසික අපයෝජනය සිදු කිරීම ද ඇතුළත්ව)

360 (ආ) - ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම

288 (අ) - ළමුන් ලිංගික කටයුතු සඳහා කුලියට ගැනීම/සේවයේ යෙදවීම

365 (ආ) - බරපතල ලිංගික අපයෝජනය පිළිබඳ වරද

## 1998 අංක 29 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන පනත)

286 (අ) - ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය පළකිරීම ප්‍රදර්ශනය ආදිය
පිළිබඳ වරද

365 (ආ) - බරපතල ලිංගික අපයෝජනය පිළිබඳ වරද

286 (අ) - ළමයෙකුගේ අසභ්‍ය හෝ අශ්ලීල ඡායාරූපයක් හෝ චිත්‍රපටයක්
නිෂ්පාදනය කිරීමේ වරද

360 (ඉ) - ළමුන්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම සඳහා
ළමයෙකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීම

## 1999 අංක 32 දරන සාක්ෂි ආඥා පනත

163 (සංශෝධිත) වගන්තිය- ළමයෙකු සමඟ පවත්වන සම්මුඛ සාකච්ඡාවක වීඩියෝගත වාර්තාවක් සාක්ෂි වශයෙන් දිය හැකිය

## 1927 අංක 4 දරන අසභ්‍ය ප්‍රකාශන ආඥා පනත (1983 අංක 22 / 2005 අංක 12 සංශෝධිත පනත්)

2 වගන්තිය-
අසභ්‍ය රචනා, රූප, ඡායාරූප, වීඩියෝ, චිත්‍රපට විකිණීම, බෙදා හැරීම, ප්‍රසිද්ධ කිරීම, සෑදීම, නිෂ්පාදනය, ළඟ තබා ගැනීම, ආනයනය, ලැබීමට සැලැස්වීම, අපනයනය, ආශ්‍රිත ව්‍යාපාරයක් සිදුකරගෙන යාම, ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා ප්‍රදර්ශනය කිරීම හා ප්‍රචාරණය වරදකි.

## 2006 අංක 16 දරන දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනත

286 (ආ) - ළමයෙකු ලිංගික අපයෝජනය කිරීම වැළැක්වීම පරිගණක මගින් සේවා සපයන තැනැත්තෙකුගේ කාර්යය වේ

286 (ඇ) - ළමා අපයෝජනය සඳහා පරිශ්‍රයක් භාවිතා කරන බවට දැනුම් දීමට ඇති කාර්යයභාරය

## 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත

7 වගන්තිය - නීත්‍යානුකූල නොවන ආකාරයෙන් ලබාගත් දත්ත ආදිය සමඟ කටයුතු කිරීම වරදක් බව

8 වගන්තිය - නීති විරෝධී ලෙස දත්ත අත්කර ගැනීම වරදක් බව

පරිසරය සහ සැමතැන වෙසෙන ළමුන් සුරැකීමේ සංවිධානය

Protecting Environment and Children Everywhere (PEaCE)

අංක 39/4, ජයසිංහ පාර, කිරුළපන, කොළඹ 06
No 39/4, Jayasinghe Road, Kirulapona, Colombo 06

| | |
|---|---|
| දුරකථනය/Telphone | 011 2819 397 |
| ජංගම /Mobile | 071 2733 037 |
| ෆැක්ස්/Fax | 011 2768 862 |
| විද්‍යුත් තැපෑල/E - mail | info@ecpatsrilanka.org |
| වෙබ්අඩවිය/Website | www.ecpatsrilanka.org |
| මුහුණු පොත/Facebook | ECPAT Sri Lanka - PEaCE |
| ට්විටර්/Twitter | ECPAT Sri Lanka |


PEaCE

Funded by UK Government

ecpat SRI LANKA

9 789558 309254